ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1447— 2006 මැයි 26 වැනි සිකුරාදා — 2006.05.26

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

තනතුරු – ඇබෑර්තු

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
පොත් බැඳුම්කරු තනතුරුවලට බඳවා ගැනීම

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ පොත් බැඳුම්කරු තනතුරුවලට බඳවා ගැනීම සඳහා මෙයින් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් කොළඹ දී මෙම සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

03. *සේවා කොන්දේසි* :

(i) මෙම තනතුර ස්ථිරය. දායක විශ්‍රාම වැටුප් අරමුදල යටතේ දායක විශ්‍රාම වැටුපකට හිමිකම් ඇත.

(ii) 2003.01.01 දිනට පෙර විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දැරූ අයෙකු මෙම තනතුරට බඳවා ගනු ලැබුවහොත් එවැනි අයෙකුට තවදුරටත් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුපක් සඳහා හිමිකම් ඇති අතර, වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

(iii) ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 10 සිට 12 දක්වා වගන්ති ද, අදාල වේ.

(iv) රාජ්‍ය සේවයට ඇතුළුවන නවක නිලධාරීන් අවුරුදු තුනක (03) පරිවාස කාලයකට යටත් වන්නේ ය.

(v) තනතුරකට පත්වී වසර 3ක් ගතවීමට පෙර, කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුතුය. වයස පදනම් කරගෙන කාර්යක්ෂමතා කඩඉමෙන් නිදහස් කරනු නොලැබේ.

04. *වැටුප් බණ්ඩිය හා පරිමාණය.*– TB-2-1 රු. 1,01,880 – 14 x 1,320 - 6 x 1,560 – රු. 1,29,720 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 9/2004.

05. *වයස් සීමාව.*– වයස අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතු ය. රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන්ට උපරිම වයස් සීමාව බල නොපායි.

06. *අධ්‍යාපන සුදුසුකම්* :

(i) බාහිර අයදුම්කරුවන් සඳහා,

(i) (අ) දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය/ඇංක ගණිතය/වාණිජ ඇංක ගණිතය ඇතුළුව විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් සමත්වීම. (එකවර විෂයයන් 05ක් වත් සමත් විය යුතුය.) ; හෝ

(ආ) දෙවතාවකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය ඇතුළුව විෂයයන් හයකින් ජාතික පොදු අධ්‍යයන සහතික පත්‍ර විභාගයෙන් සමත්වීම. (එකවර විෂයන් 05ක් වත් සමත් විය යුතුය.) සමග පොත් බැඳීම පිළිබඳ වසර 03ක පළපුරුද්ද ; හෝ

(ii) 8 ශ්‍රේණිය (9 වසර) සමත්වීම සමග පොත් බැඳීම පිළිබඳ වසර 06 (හයක) පළපුරුද්ද.

(ii) අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා :

(අ) රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ වර්ෂ 08ක හෝ එයට වැඩි කාලයක ස්ථිර සහ සතුටුදායක සේවා කාලයක් ඇති, කාර්යාල සේවක සේවයේ I හා Iඒ පන්තිවල සේවකයින් හෝ II පන්තියේ වසර 06ක සේවා කාලයක් සහිත සේවකයින් විය යුතුය.

(i) පුරප්පාඩු සංඛ්‍යාව සඳහා මෙම සුදුසුකම් ඇති සේවකයන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති අවස්ථාවලදී රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ වසර 08ක හෝ ඊට වැඩි සේවා කාලයක් සහිත ඉන් කා. සේ. සේ. II වන පන්තියේ වසර 03ක සේවා කාලයක් ද සම්පූර්ණ කර ඇති සේවකයන් සලකා බලනු ලැබේ.

(ii) සතුටුදායක සේවා කාලයක් යන්නෙන් අදහස් කරනු ලබන්නේ පූර්වාසන්න පස් අවුරුදු සේවා කාලය තුළදී සියලුම වැටුප් වර්ධක උපයාගෙන ඇති අවවාද කිරීමකට වැඩි දඬුවමක් නො ලැබූ සේවා කාලයකි.

07. *බඳවා ගැනීමේ ක්‍රමය.*– පුරප්පාඩු සංඛ්‍යාවෙන් 75%ක් බාහිර අයදුම්කරුවන්ගෙන් ද 25%ක් අභ්‍යන්තර අයදුම්කරුවන්ගෙන් ද බඳවාගනු ලැබේ.

(i) බාහිර අයදුම්කරුවන් :

(අ) රජයේ ගැසට් පත්‍රයේ හෝ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීමක් මගින් අයදුම්පත් කැඳවා සුදුසුකම් සහිත අයදුම්කරුවන් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් තීරණය කරනු ලබන පරිදි ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ විසින් පවත්වනු ලබන ප්‍රායෝගික පරීක්ෂණයකින් හා රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් වැඩිම ලකුණු ලබාගත් අය සුදුස්සන් හැටියට තෝරාගනු ලැබේ.

(ආ) ප්‍රායෝගික පරීක්ෂණය හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ විෂය නිර්දේශය හා ලකුණු පරිපාටිය ඇමුණුම 02 ලෙස දක්වා ඇත.

(ii) අභ්‍යන්තර අයදුම්කරුවන් :

(අ) සුදුසුකම් සහිත අයදුම්කරුවන්ගෙන්, රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් තීරණය කරනු ලබන පරිදි ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ විසින් පවත්වනු ලබන ප්‍රායෝගික පරීක්ෂණයකින් හා රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් වැඩිම ලකුණු ලබාගත් අය සුදුස්සන් හැටියට තෝරාගනු ලැබේ.

(ආ) ප්‍රායෝගික පරීක්ෂණය හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ විෂය නිර්දේශය හා ලකුණු පරිපාටිය ඇමුණුම 03 ලෙස දක්වා ඇත.

08. මෙම නිවේදනයේ පහත දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2006.06.26 දින හෝ එදිනට පෙර, රෙජිස්ට්‍රාර් ජනරාල්, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව, අංක 280, කෙළිත් වීදිය, කොළඹ 11 යන ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

09. ඉල්ලුම්පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරේ "රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ පොත් බැඳුම්කරු තනතුරට බඳවා ගැනීම" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය. ඉල්ලුම් පත්‍රය සෑම ආකාරයෙන්ම සම්පූර්ණ විය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන අතර ඉල්ලුම්පත්‍රය හෝ ඒ හා සම්බන්ධ ලිපි හෝ නැපෑලේදී නැති වූ බවට කරන පැමිණිලි සලකා බලනු නොලැබේ.

10. රජයේ සේවයේ/පළාත් පාලන සේවයේ නියුක්ත අයදුම්කරුවන් ස්වකීය ඉල්ලුම් පත්‍රය, තම දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු ය.

11. තමා දැනුවත්ව ඉදිරිපත් කරන ලද යම්කිසි තොරතුරක් අසත්‍ය බව පෙනී ගියහොත් හෝ අයදුම්කරු නිහාමතාම යම්කිසි වැදගත් කරුණක් යටපත් කර ඇති බව පෙනී ගියහොත් හෝ එසේ නැතහොත් නුසුදුසු බව සේවය කරන කාලය තුළ කවර අවස්ථාවකදී හෝ ඔප්පු වුවහොත් ඔහු සේවයෙන් පහ කිරීමට සමත් වනු ඇත.

එල්. කේ. රත්නසිරි,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2006 මැයි මස 08 වැනි දින,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 280, කෙළිත් වීදිය,
කොළඹ 11.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
පොත් බැඳුම්කරු තනතුර සඳහා අයදුම්පත්‍රය

01. (i) මුල්කුරු සමහ නම :————.
(ii) මුල්කුරු වලින් හැඳින්වෙන නම් :————.

02. (i) පෞද්ගලික ලිපිනය :————.
(ii) කාර්යාලීය ලිපිනය :————.

03. ජාතික හැඳුනුම්පත් අංකය :————.

04. උපන් දිනය :
වර්ෂය :————, මාසය :————, දිනය :————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් අමුණන්න.)

05. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස :
අවුරුදු :————, මාස :————, දින :————.

06. ස්ත්‍රී/පුරුෂ භාවය :————.

07. විවාහක/අවිවාහක භාවය :————.

08. අධ්‍යාපන සුදුසුකම් (අධ්‍යාපන සහතිකවල පිටපත් අමුණන්න.) :————.
(i) පොත් බැඳීම පිළිබඳ පළපුරුද්ද (සහතිකවල පිටපත් අමුණන්න.) :—.

09. ඔබ උසාවියක් ඉදිරියේ කිසියම් චෝදනාවකට වරදකරු වී ඇද්ද ? :——.
ඔව්/නැත (පිළිතුර ඔව් නම් විස්තර සපයන්න.)

10. *අයදුම්කරුගේ සහතිකය* :

(i) මෙම අයදුම්පතේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව අවංකවම ප්‍රකාශ කරමි.

(ii) මා විසින් කරනු ලැබ ඇති මෙම ප්‍රකාශය අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට පෙර නුසුදුස්සකු වන බව හා පත්වීම් ලැබීමෙන් පසු එසේ ඔප්පු වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට යටත්වන බව මම දැන සිටිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

11. *දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය (රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන්ට පමණයි.)* :

මෙම ඉල්ලුම්කරු වන ..... මහතා මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ සේවය කරයි. ඔහු ස්ථිර විශ්‍රාම වැටුප් සහිත/තාවකාලික තනතුරක් දරයි. පසුගිය වසර ..... ක කාලය තුළ වෛතනාධික සියල්ල උපයාගෙන ඇත. ඔහුගේ වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායකය. ඔහු මොනයම් හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) යටත්කොට නොමැති බව ද, ඔහු මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් දැනට දරන තනතුරින් නිදහස් කරන/නොකරන බවද මින් සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.
නම :————.
පදවි නාමය :————.
දෙපාර්තමේන්තුව/ආයතනය :————.

05–336

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
විවාහ, උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු
අනුරාධපුරය දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාස තුළ ස්ථිර පදිංචියක් ඇත්තාවූ හා සෑහෙන දේපලක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතුයි.

03. මෙම තනතුරු සඳහා ස්ත්‍රී/ පුරුෂ දෙපක්ෂයට ඉල්ලුම් කළ හැකිය

04. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 21 ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 60 ට වැඩි නොවිය යුතුයි.

05. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතුයි.

06. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරී කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

07. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

08. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2006 ජූලි මස 03 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මඟින් යැවිය යුතුය.

එල්. කේ. රත්නසිරි,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2006 මැයි මස 04 වැනි දින,
කොළඹ 11, කෙළිත් වීදිය, අංක 280,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ

වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැලසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක්ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2006 ජූනි මස 02 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2006 මැයි මස 19 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

2006 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ලක්ෂ්මන් ගුණවර්ධන
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

රජයේ මුද්‍රණාලයාධිපති විසින් ප්‍රකාශ කරන ලදී.

උපලේඛනය

දිස්ත්‍රික්කය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා නතනුර	ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය
අනුරාධපුරය	නැගෙනහිර නුවරගම් පළාත	අනුරාධපුර නව නගරය කොට්ඨාශයේ අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය	දිස්ත්‍රික් ලේකම් අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල් අනුරාධපුරය

05-364

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

විවාහ, උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු

ගාල්ල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාස තුළ ස්ථිර පදිංචියක් ඇත්තාවූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතුයි.

03. මෙම තනතුරු සඳහා ස්ත්‍රී/ පුරුෂ දෙපක්ෂයට ඉල්ලුම් කළ හැකිය

04. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 21 ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 60 ට වැඩි නොවිය යුතුයි.

05. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතුයි.

06. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරී කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

07. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

08. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2006 ජූනි මස 26 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මඟින් යැවිය යුතුය.

එල්. කේ. රත්නසිරි,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2006 මැයි මස 03 වැනි දින,
කොළඹ 11, කෙළිත් වීදිය, අංක 280,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

උපලේඛනය

දිස්ත්‍රික්කය	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා නතනුර	ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය
ගාල්ල	බද්දේගම	ගාල්ල දිස්ත්‍රික්කයේ තෙලිකඩ කොට්ඨාශයේ උප්පැන්න මරණ සහ ගහබඩ පත්තුව කොට්ඨාශයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය	දිස්ත්‍රික් ලේකම්, අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, ගාල්ල.
ගාල්ල	කරන්දෙනිය	ගාල්ල දිස්ත්‍රික්කයේ කරන්දෙනිය බටහිර උප්පැන්න මරණ සහ වැල්ලබඩ පත්තුව විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය	එම
ගාල්ල	බලපිටිය	ගාල්ල දිස්ත්‍රික්කයේ බටහිර වලල්ලාවිට කෝරළයේ කොට්ඨාශයේ (හැගල්ල ප්‍රදේශයේ) අතිරේක විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය	එම
ගාල්ල	බෙන්තොට	ගාල්ල දිස්ත්‍රික්කයේ බෙන්තර වලල්ලාවිට කෝරළයේ කොට්ඨාශයේ අතිරේක විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය	එම

05-363

විභාග, විභාග ප්‍රතිඵල ආදිය

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලවලට ඇතුළත්වීම සඳහා පැවැත්වෙන තරග විභාගය

2007/2009 කෘෂිකර්මය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (ප්‍රවේශ විභාගය)

2007/2009 දෑවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව සඳහා ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලවලට සිසුන් ඇතුළත් කරගැනීමේ තරග විභාගයක් විභාග දෙපාර්තමේන්තුව මගින් සිංහල හා දෙමළ මාධ්‍යවලින් 2006 සැප්තැම්බර් මස පහත සඳහන් මධ්‍යස්ථානවලදී පවත්වනු ලැබේ.

මධ්‍යස්ථාන අංකය	මධ්‍යස්ථානය	මධ්‍යස්ථාන අංකය	මධ්‍යස්ථානය
(1)	අනුරාධපුරය	(7)	මහනුවර
(2)	බදුල්ල	(8)	කුරුණෑගල
(3)	මඩකලපුව	(9)	මාතර
(4)	කොළඹ	(10)	ත්‍රිකුණාමලය
(5)	ගාල්ල	(11)	වවුනියාව
(6)	යාපනය	(12)	රත්නපුරය
		(13)	හම්බන්තොට

කිසියම් මධ්‍යස්ථානයක් සඳහා අවශ්‍ය තරම් විභාග අපේක්ෂකයන් අයදුම්කොට නොමැති විට ඔවුන්ගේ දෙවෙනි කැමැත්ත අනුව හෝ අයදුම් කොට ඇති මධ්‍යස්ථානයට සමීප වෙනත් මධ්‍යස්ථානයක් හෝ ඔවුන්ට නියම කෙරෙනු ඇත.

02. *දෑවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවට තෝරා ගැනීම :*

2.1 කෘෂිකර්මය පිළිබඳ මෙම පාඨමාලාව ගැහැණු පිරිමි දෙපක්ෂයටම විවෘතය. මෙම විභාගයෙන් හා සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් ලැබූ අය කුසලතාවය හා දිස්ත්‍රික් පදනම මත කුණ්ඩසාලේ, පැල්වෙහෙර, අඳුණකොළපැලැස්ස සහ වවුනියාව යන කෘෂිකර්ම විද්‍යාල හතරට තෝරා ගනු ලැබේ. තවද අනුරාධපුර හා කරපිංචි කෘෂිකර්ම විද්‍යාලවල කෘෂිකර්ම ඩිප්ලෝමා පාඨමාලාව ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ.

2.2 ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලවල පවත්වනු ලබන කෘෂිකර්ම ඩිප්ලෝමා පාඨමාලාව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචි කර ඇත. මෙම පුහුණුව හුදෙක් වෘත්තීයමය වන අතර, එය පිළියෙල කරනු ලැබ ඇත්තේ පුහුණුවෙන් පසු ස්වයං රැකියාවල යෙදීමට හෝ සුදුසු රැකියාවක් ලබා ගැනීමට හෝ බලාපොරොත්තු වන කාන්තාවන්ට හා පුරුෂයන්ට ය. පාඨමාලාව හදාරන කාලය තුළදී නේවාසික පහසුකම් සපයනු ලැබේ. ශිෂ්‍යයින්ට මෙම කාලය තුළදී වෙනත් කිසිදු ආයතනයක පූර්ණ කාලීන හෝ අර්ධ කාලීන පුහුණු පාඨමාලාවක් හැදෑරීමට හෝ රැකියාවක් ලබා ගැනීමට හෝ අවසර දෙනු නොලැබේ. කිසියම් ශිෂ්‍යයෙක්/ශිෂ්‍යාවක් කිසියම් අවස්ථාවක එවැනි පාඨමාලාවක් හදාරන බව හෝ වෙනත් කිසියම් ආයතනයක රැකියාවක නියුක්ත බව හෝ ඔප්පු වුවහොත් ඔහු/ඇය කෘෂිකර්ම විද්‍යාලයෙන් නෙරපනු ලැබේ.

2.3 සෙනසුරාදා සහ ඉරිදා දිනවල ද සමහර විට පන්ති පවත්වන බැවින් නේවාසිකාගාරවලින් බැහැරව යා හැක්කේ මසකට එක් සති අන්තයකදී පමණය. මඩ කුඹුරුවල, ගොඩ ගොවිකැන්වල ප්‍රායෝගිකව යෙදීමට මනාපයක් තිබිය යුතුය. මෙම පුහුණුවෙන් පසු රැකියා අවස්ථාවන් වැඩි වශයෙන් බලාපොරොත්තු විය හැක්කේ වියලි කලාපයේ ගම්බද පළාත්වල බැවින් එම ප්‍රදේශවල සේවය කිරීමට අයදුම්කරුවන්ට කැමැත්තක් තිබිය යුතුය.

03. *ඇතුළත්වීම සඳහා තිබිය යුතු සුදුසුකම් :*

3.1 (අ) සිංහල/දෙමළ භාෂාව, ගණිතය සහ විද්‍යාව යන විෂයයන් තුනට අනිවාර්යයෙන් සම්මාන සාමාර්ථ ද, සමාජ අධ්‍යයනය හෝ කෘෂිකර්මය යන විෂයයන් දෙකෙන් එකකටවත් සම්මාන සාමාර්ථය ඇතිව (මේ අනුව සම්පූර්ණයෙන් සම්මාන හතරක් (04) තිබිය යුතුය.) දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 06 ක් අ. පො. ස. (සා. පෙ.) සමත්වීම. මෙයින් අනිවාර්ය කර ඇති විෂයන්ට සම්මාන 03ක් සහිතව අවම වශයෙන් විෂයයන් 05 ක් එකවර, සමත්වී තිබීම ;

සහ

(ආ) අ. පො. ස. (උසස් පෙළ) විභාගයේ දී ජීව විද්‍යා අංශයේ විෂය ධාරාව හදාරා උද්භිද විද්‍යාව, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, සත්ත්ව විද්‍යාව, කෘෂිකර්මය, ජීව විද්‍යාව යන විෂයයන් හයෙන් එකක් සමත් වී තිබීම. (උසස් පෙළ සඳහා ගණිතය විෂය ධාරාව හැදෑරූ සිසුන් රසායන විද්‍යාව හෝ භෞතික විද්‍යාව සමත් වී සිටීම මෙම පාඨමාලාවට සුදුසුකම් ලැබුවා සේ නොසැලකේ.) ;

(ඇ) ඉංග්‍රීසි මාධ්‍යයෙන් පාඨමාලාව හදාරන්නේ නම් අ.පො.ස. (සා. පෙ.) ඉංග්‍රීසි භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් තිබිය යුතුය.

3.2 2006.07.07 දිනට අපේක්ෂකයාගේ වයස අවුරුදු 17 ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 25 ට වැඩි නොවිය යුතුය.

3.3 3.1 හා 3.2 හි සඳහන් ඇතුළත්වීම සඳහා තිබිය යුතු සුදුසුකම් ප්‍රවේශමෙන් කියවා බැලීමට අයදුම්කරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් සපුරා නොමැති හා/හෝ නියමිත වයස් සීමාවෙන් බැහැර වන අයදුම්කරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත.

3.4 ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් අයදුම්පත් එවීම කළ නොහැක. දැනට රජයේ දෙපාර්තමේන්තුවක හෝ ආයතනයක, දෑවුරුදු කෘෂිකර්ම පාඨමාලාවන් හදාරන සිසුන් මෙම පාඨමාලාව හැදෑරීමට අයදුම් කිරීමට සුදුසුකම් නොලබයි.

3.5. කෘෂිකර්ම විද්‍යාලයේ උගන්වන මාධ්‍ය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි බැවින් එම භාෂාවන් අතුරින් එක් භාෂාවකින් එම පාඨමාලාව හදාරා පාඨමාලාවේ විභාගයන්ට පෙනී සිටීමට අපේක්ෂකයාට හැකිවිය යුතුය. තෝරාගත් මාධ්‍යයෙන් දිගටම අධ්‍යයන කටයුතු කළ යුතුය. පාඨමාලාව අතර මඟදී ඉගෙනුම ලබන මාධ්‍යය වෙනස් කළ නොහැක.

3.6 ඉංග්‍රීසි මාධ්‍යයෙන් උගන්වනු ලබන්නේ කුණ්ඩසාලේ කෘෂිකර්ම විද්‍යාලයේ පමණි. ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගෙන ගැනීමට බලාපොරොත්තු වන අයදුම්කරුවන්ට තරග විභාගය සඳහා තමන් කැමති මාධ්‍යයකින් පෙනී සිටිය හැක. එහෙත් ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීමට බලාපොරොත්තු වන අයදුම්කරුවන් I වන හා II ප්‍රශ්න පත්‍රවලට අමතරව III වන ප්‍රශ්න පත්‍රයට ද පෙනී සිටිය යුතු ය. ඉංග්‍රීසි මාධ්‍යය සඳහා බඳවා ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව 30 කි. පාඨමාලාව සඳහා තෝරාගනු ලබන සෑම ශිෂ්‍යයෙක්ම ආරම්භයේ දී තමන් විසින් තෝරා ගන්නා ලද මාධ්‍යයෙන් අධ්‍යාපන කටයුතු හා විභාග කටයුතු කළ යුතු අතර පසු අවස්ථාවක දී ඉගෙන ගන්නා මාධ්‍ය වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

04. *අයදුම්පත් :*

4.1 මෙම දැන්වීම අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය ප්‍රකාර අයදුම්කරුවන්ගේ අත් අකුරුවලින් හෝ යතුරු ලියනය කර 8" × 12" ප්‍රමාණයේ (A 4 ප්‍රමාණයේ) කඩදාසියක දෙපැත්තේ තම අයදුම්පත සකස් කළ යුතුය. එහි අංක 01 සිට අංක 11 දක්වා මුල් පිටුවේ අඩංගු කළ යුතුවේ. අසම්පූර්ණව පුරවා ඇති හා ආදර්ශ ආකෘතිය අනුව සකස් නොකළ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත.

4.2 විභාග ගාස්තුව ලෙස විභාග කොමසාරිස් ජනරාල්ගේ 4000-20-03-20-13 ආදායම් ශීර්ෂයට බැරවන සේ දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබා ගත් රුපියල් 250 ක් වටිනා මුදල් කුවිතාන්සියක් ලබාගෙන නොගැලවෙනසේ අයදුම්පතේ අදාළ ස්ථානයට ඇලවිය යුතුය. කුවිකාන්සියේ ඡායා පිටපතක් තමා වෙත තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. කිසිදු හේතුවක් නිසා හෝ විභාග ගාස්තු ආපසු ගෙවනු නොලැබේ. මෙම විභාගයට ගෙවන ලද ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කළ නොහැක. විභාග ගාස්තුවල කුවිතාන්සිය අයදුම්පත් සමග ඉදිරිපත් නොකරන අයදුම්කරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත.

4.3 සියළුම අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් පමණක් 2006 ජූලි මස 07 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ, අධ්‍යක්ෂ, ව්‍යාප්ති හා පුහුණු අංශය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය යන ලිපිනයට එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.තැපෑලේදී ප්‍රමාද වන හෝ නැතිවන අයදුම්පත් ගැන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වගකීම් දරනු නොලැබේ.

4.4 අයදුම්පත් බහා එවන කවරයේ ඉහළ වම් කෙළවර 2007/2009 "කෘෂිකර්ම විද්‍යාලවලට ඇතුළත්වීම" යන්න හා පළමුවන හා දෙවන තේරීම් වශයෙන් තෝරා ඇති හා විභාග මධ්‍යස්ථානවල නම් පැහැදිලිව සඳහන් කරන්න.

05. *තෝරා ගැනීමේ පිළිවෙල :*

5.1 ලිඛිත විභාගයේ කුසලතා ලකුණුවල එකතුව මත සහ දිස්ත්‍රික් පදනම මත තේරීම් කරනු ලැබේ. සාමාන්‍ය පෙළ විභාගයට පළමු වරට පෙනී සිටි දිස්ත්‍රික්කය අයදුම්පතේ සඳහන් කිරීමේ දී එම දිස්ත්‍රික්කයට අදාළ අංකය සොයා ගැනීම සඳහා මෙම *ගැසට් නිවේදනයේ* අවසානයට පළකර ඇති ඇමුණුම් අංක 01 උපයෝගී කර ගන්න. අවසාන වශයෙන් පාඨමාලාවට සිසුන් තෝරා ගැනීමට එක් එක් දිස්ත්‍රික්කයෙන් දිස්ත්‍රික් මට්ටමින් වැඩිම ලකුණු ලබාගත් සිසුන් සීමිත ගණනකට සහතිකපත් පරීක්ෂා කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ඇත. දිස්ත්‍රික් පදනම සඳහා සලකා බැලීමේ දී අයදුම්කරු අයත් දිස්ත්‍රික්කය ලෙස සලකනු ලබන්නේ, අයදුම්කරු අ. පො. ස. (සා.පෙළ) විභාගයට පළමු වරට පෙනී සිටි පාසැල අයත් දිස්ත්‍රික්කයයි.

5.2 ලිඛිත විභාගය සඳහා වූ විෂයයන්, හා කාල සටහන පහත සඳහන් වේ :

විෂයයන්	*කාලය*	*කාල සටහන*
(i) *ප්‍රශ්න පත්‍රය* කෘෂිකර්මය (ලකුණු 100 යි) (අ. පො. ස. (සා. පෙළ) කෘෂිකර්ම විෂය නිර්දේශය අනුව සකස් කළ බහුවරණ හා කෙටි ප්‍රශ්න අඩංගු වේ)	පැය 1 යි	පෙ. ව. 9.30 - පෙ. ව. 10.30
(ii) *ප්‍රශ්න පත්‍රය* බුද්ධි පරීක්ෂණය (ලකුණු 100 යි)	පැය 1 යි	පෙ. ව. 11.00 - මධ්‍යාහ්න 12.00
(iii) *ප්‍රශ්න පත්‍රය* ඉංග්‍රීසි භාෂාව (ලකුණු 100 යි) අ.පො.ස. (සා.පෙළ) ඉංග්‍රීසි විෂය නිර්දේශය අනුව සකස් කෙරේ. ඉංග්‍රීසි භාෂාවෙන් කරුණු අවබෝධ කර ගැනීම, ඉංග්‍රීසියෙන් අදහස් සංනිවේදනය කිරීමේ හැකියාවන් හා සරල ව්‍යාකරණ හැකියාවන් පරීක්ෂා කෙරේ	පැය 1 යි	ප. ව. 13.30 - ප. ව. 14.30

5.3 ප්‍රශ්න පත්‍ර I හා ප්‍රශ්න පත්‍ර II සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට අවම වශයෙන් ලකුණු 40 ක් වත් ලබාගත යුතු වේ. යම් මාධ්‍යයක් සඳහා මෙම අවම ලකුණු ලබාගත් විභාග අපේක්ෂකයින් නොසිටින විටකදී පමණක් එම මාධ්‍යයෙන් කෘෂිකර්ම විද්‍යාලවලට අවශ්‍ය අයදුම්කරුවන් ප්‍රමාණය තෝරා ගැනීම සඳහා අවශ්‍ය වුවහොත් මෙම අවම සීමාවන් වෙනස් කිරීමට ඉඩ ඇත. එම ප්‍රශ්න පත්‍ර දෙකේ ලකුණුවල එකතුව අනුව වැඩිම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයන් දිස්ත්‍රික් පදනම මත තෝරාගෙන මණ්ඩලයක් මගින් සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලැබේ. තෝරා ගැනීම අනිවාර්යයෙන්ම ලබාගත් වැඩිම ලකුණු මට්ටම අනුව හා අනුමත කර ඇති ක්‍රමයක් අනුව දිස්ත්‍රික්ක පදනම මත, සිදු කෙරේ. අදාළ වර්ෂයේ දී එක් එක් කෘෂිකර්ම විද්‍යාලයට ඇතුළත් කර ගනු ලබන පිරිමි හෝ ගැහැණු සිසුන් සංඛ්‍යාව එම විද්‍යාලවල පිරිමි හෝ ගැහැණු නේවාසිකාගාරවල ඇති ඉඩකඩ අනුව හා එම විද්‍යාලවල ඇති පුහුණු පහසුකම් අනුව තීරණය කරනු ඇත. කිසියම් දිස්ත්‍රික්කයක අවශ්‍ය ශිෂ්‍ය සංඛ්‍යාව නොමැති විටක විද්‍යාලවලට උපරිම සිසුන් ප්‍රමාණයක් ඇතුළත් කිරීම සඳහා අනෙකුත් දිස්ත්‍රික්කවලින් අවශ්‍ය සිසුන් සංඛ්‍යාවක් තෝරා ගනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී අපේක්ෂකයන් විසින් තම සහතිකපත්‍රවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය. සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු දෙනු නොලැබේ. කෘෂිකර්ම විද්‍යාලවලට තෝරා ගනු ලබන සංඛ්‍යාවට වඩා වැඩි සිසුන් ප්‍රමාණයක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

5.4 සිංහල හෝ දෙමළ මාධ්‍යයෙන් පාඨමාලාව හැදෑරීමට බලාපොරොත්තු වන අයදුම්කරුවන් අනිවාර්යයෙන් තමන් පාඨමාලාව හැදෑරීමට තෝරාගත් භාෂා මාධ්‍යයෙන්ම තරග විභාගයේ දී පළමු හා දෙවන ප්‍රශ්න පත්‍රයට පෙනී සිටිය යුතුය. ඉංග්‍රීසි මාධ්‍යයෙන් පාඨමාලාව හැදෑරීමට අයදුම්කරන අයදුම්කරුවන් පමණක් තම මනාපය අනුව සිංහලෙන් හෝ දෙමළෙන් පළමුවන හා දෙවන ප්‍රශ්නපත්‍ර වලට පෙනී සිටිය හැක. ඉංග්‍රීසි මාධ්‍යයෙන් පාඨමාලාව

හැදෑරීමට බලාපොරොත්තු වන සිසුන් පමණක් ඒ සඳහා සුදුසුකම් ලැබීමට ඉංග්‍රීසි භාෂා ප්‍රශ්න පත්‍රයට පෙනී සිට, අවම වශයෙන් 50% ක් ලකුණු ලබාගත යුතු වේ. ඉංග්‍රීසි විෂය සමත් අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොසිටින අවස්ථාවලදී පමණක් මෙම අවම සීමාවන් වෙනස් කිරීමට ඉඩ ඇත. ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා කුසලතාවය මත හා අනුමත කර ඇති ක්‍රමයක් අනුව දිස්ත්‍රික් පදනම මත තේරීම සිදු කරනු ලැබේ. එහිදී ඉංග්‍රීසි භාෂා ප්‍රශ්න පත්‍රයට, පළමුවන හා දෙවන ප්‍රශ්න පත්‍රවලට අවම සුදුසුකම් ලබා ඇති අපේක්ෂකයින් අතරින් පළමු වන ප්‍රශ්න පත්‍රය හා දෙවන ප්‍රශ්න පත්‍රයේ ලකුණුවල එකතුව අනුව වැඩිම ලකුණු ලබාගෙන ඇති අපේක්ෂකයින් පමණක් කුසලතා මත තෝරාගනු ලැබේ.

5.5 3.1 සහ 3.2 ඡේදයන්හි සඳහන් සුදුසුකම් ඇති සියලුම අයදුම්කරුවන්ට විභාග දෙපාර්තමේන්තුව විසින් ප්‍රවේශපත්‍ර එවනු ලැබේ. විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් විසින් තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය විභාග මධ්‍යස්ථානයේ අදාළ භාර නිලධාරී වෙත ඉදිරිපත් කළ යුතුය. විභාගය පැවැත්වීමට නියමිත දිනට සති දෙකකට පෙර විභාග දෙපාර්තමේන්තුව මගින් ජාතික පුවත්පත්වල පළකරනු ලබන පුවත්පත් දැන්වීමක් මගින් විභාගය පවත්වන දිනය ප්‍රසිද්ධ කරනු ලැබේ. ඒවන විට ප්‍රවේශපත්‍රය ලැබී නොමැති යම් අයදුම්කරුවෙකු වේ නම් එම පුවත්පත් දැන්වීමේ සඳහන් ආකාරයට විභාග දෙපාර්තමේන්තුව අමතා තම ප්‍රවේශ පත්‍රය ලබාගැනීමට කටයුතු කිරීම සුදුසු වේ.

5.6 විභාගය පැවැත්වෙන අවස්ථාවේ දී අයදුම්කරුවන් විසින් තම අනන්‍යතාව විභාග ශාලාධිපති වෙත ඔප්පු කර සිටිය යුතුයි. මේ සඳහා පහත දැක්වෙන ලියකියවිලි වලින් එකක් පිළිගත හැක :

(අ) පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම් පත,

(ආ) විභාග දිනයට අවුරුදු තුනකට වැඩි නොවන කාලයක් ඇතුළත නිකුත් කරන ලද වලංගු විදේශ ගමන් බල පත්‍රයක්,

5.7 විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන ප්‍රසිද්ධ ලිඛිත විභාගවලට බලපාන නීති හා කොන්දේසිවලට අයදුම්කරුවන් අවනත විය යුතුය. විභාග දෙපාර්තමේන්තුව මගින් සිසුන් ලබාගත් ලකුණු ඔවුන්ගේ ලිපිනයන්ට දන්වා එවනු ඇත. දිස්ත්‍රික් මට්ටමින් වැඩිම ලකුණු ලබාගත් සිසුන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ඇත. මෙම ලිඛිත විභාගයට පෙනී සිටීමට ඉඩදීම හෝ සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටීමට ඉඩදීම අපේක්ෂකයාගේ සුදුසුකම් පිළිගත් බවක් නොහැගේ. විභාගයට පෙර හෝ එය පවත්වන අතර හෝ ඉන් පසුව හෝ යන කවර අවස්ථාවකදී වුවත් මෙම ව්‍යවස්ථාවන් අනුව නුසුදුසු යයි තීරණය වන අයදුම්කරුවකුගේ විභාගපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

5.8 ලිඛිත විභාගයට හෝ සම්මුඛ පරීක්ෂණයට හෝ ඒ දෙකටම හෝ පෙනී සිටීම වෙනුවෙන් රජය විසින් අපේක්ෂයින්ට කිසිදු දීමනාවක් ගෙවනු නොලැබේ.

06. *"කුසුමා ලක්ෂ්මී කරුණාතිලක" සිහිවටන ශිෂ්‍යත්වය :*
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන ලිඛිත තරග විභාගයේදී I හා II ප්‍රශ්න පත්‍ර දෙකේ එකතුව අනුව වැඩිම ලකුණු ලබා ගත් අයදුම්කාරියට ඉහත ශිෂ්‍යත්වයේ කොන්දේසිවලට යටත්ව වර්ෂ දෙකක් සඳහා මෙම ශිෂ්‍යත්වය ප්‍රදානය කරනු ලැබේ. ශිෂ්‍යත්වලාභියාට කුණ්ඩසාලේ කෘෂිකර්ම විද්‍යාලයේ ඉගෙනුම ලැබීමට අවස්ථාව දෙනු ලැබේ. මෙම ශිෂ්‍යත්වයේ වාර්ෂික වටිනාකම රු. 10,000 වේ.

ආචාර්ය සී. කුඩාගමගේ,
කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.

ඇමුණුම් අංක 01
දිස්ත්‍රික්කවල නම් හා ඒවාට අයත් අංක
(5 . 1 ඡේදයට අදාළ වේ)

දිස්ත්‍රික් අංක	*දිස්ත්‍රික්කය*
01	අනුරාධපුරය
02	බදුල්ල
03	මඩකලපුව
04	කොළඹ
05	ගාල්ල
06	යාපනය
07	මහනුවර
08	කුරුණෑගල
09	මාතර
10	ත්‍රිකුණාමලය
11	වව්නියාව
12	රත්නපුරය
13	හම්බන්තොට
14	ගම්පහ
15	කළුතර
16	මාතලේ
17	නුවරඑළිය
18	මන්නාරම
19	මුලතිව්
20	අම්පාර
21	පුත්තලම
22	පොළොන්නරුව
23	මොණරාගල
24	කෑගල්ල
25	කිලිනොච්චිය

ආදර්ශ ඉල්ලුම් පත්‍රය
ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලවලට ඇතුළත් කර ගැනීම සඳහා ඉල්ලුම් පත්‍රය - 2007/2009
(බැලුම් තීරුව සඳහා අහලක් ඉඩ හැරිය යුතුයි. එහි කිසිවක් නොලිය යුතුයි)

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි)

1. විභාගයට පෙනී සිටින මධ්‍යස්ථානය 1. වන තේරීම ..... 2. වන තේරීම	එහි අංකය	2. විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය (අදාළ අංකය කොටුව තුළ ලියන්න) සිංහල මාධ්‍ය - 2 දෙමළ මාධ්‍ය - 3	භාෂා මාධ්‍යයට අදාළ අංකය .....

(*ගැසට් පත්‍රයේ* මුල් ඡේදයට අනුව)

3. පාඨමාලාව හැදෑරීමට කැමති මාධ්‍ය සිංහල මාධ්‍ය - 2 දෙමළ මාධ්‍ය - 3 ඉංග්‍රීසි මාධ්‍ය - 4	කැමති මාධ්‍යයට අදාළ අංකය	4. ස්ත්‍රී/පුරුෂ භාවය පුරුෂ - 0 ස්ත්‍රී - 1	5.	සාමාන්‍ය පෙළ විභාගයට ප්‍රථම වරට පෙනී සිටි පාසල පිහිටි දිස්ත්‍රික්කය	දිස්ත්‍රික් අංකය .....

(අදාළ අක්ෂරය කොටුව තුළ ලියන්න) (අදාළ අංකය කොටුව තුළ ලියන්න) (5.1 ඡේදයට අනුව)

6.*(අ)* (i) මුලකුරු සමග නම :————,
(පැහැදිලි අකුරින්) :
(ii) මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරුවලින්) :————.
උදා . SILVA, A.C.

(ආ) (i) මුලකුරු වලින් හැඳින්වෙන නම් :————.
(ii) මුලකුරුවලින් හැඳින්වෙන නම (ඉංග්‍රීසි කැපිටල් අකුරු වලින්) :————.

7. (i) සම්පූර්ණ ලිපිනය :————.
(ii) විභාග ප්‍රවේශ පත්‍ර එවිය යුතු සම්පූර්ණ ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරුවලින්)
(iii) සම්බන්ධ කරගත හැකි දුරකථන අංකය (ඇතොත්) :————.

8. දිස්ත්‍රික්කය :
(අ) දැනට පදිංචි දිස්ත්‍රික්කය :————.
(ආ) අ. පො. ස. (සා. පෙළ) විභාගයට පෙනී සිටි පාසල හා ලිපිනය :————.
(ඇ) පළමු වරට අ. පො. ස. (සා. පෙළ) විභාගයට පෙනී සිටි පාසල අයත් දිස්ත්‍රික්කය :————.

9. *(අ)* පදිංචි මැතිවරණ කොට්ඨාසය (සිංහලෙන්) :————.
(ආ) මැතිවරණ කොට්ඨාසය (ඉංග්‍රීසියෙන්) :————.

10. උපන් දිනය : අවුරුද්ද: [ ][ ][ ][ ] මාසය : [ ][ ] දිනය : [ ][ ]

11. 2006.07.07 දිනට වයස : අවුරුදු : [ ][ ] මාස : [ ][ ] දින : [ ][ ]

12. *(අ)* නිවේදනයේ 3.1 ඡේදය අනුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් සමත් විෂයයන් හය හෝ ඊට වැඩි ගණන :

විභාග අංකය	*වර්ෂය සහ මාසය*	*සමත් විෂයයන්*	*විෂය අංකය*	*සමත් ශ්‍රේණිය*
		සිංහල		
		ගණිතය		
		විද්‍යාව		
		කෘෂිකර්මය		
		සමාජ අධ්‍යයනය		

(ආ) ගැසට් නිවේදනයේ 3.1 ඡේදය අනුව සම්මාන ශ්‍රේණියේ සාමාර්ථයන් ලබාගැනීම අනිවාර්ය කර ඇති විෂයයන් හතර පිළිබඳ විස්තර:

විභාග අංකය	*වර්ෂය සහ මාසය*	*සමත් විෂයයන්*	*විෂය අංකය*	*සමත් ශ්‍රේණිය*
1.		1. සිංහල		
2.		2. ගණිතය		
3.		3. විද්‍යාව		
4.		4. කෘෂිකර්මය		
5.		5. සමාජ අධ්‍යයනය		

(ඇ) අ.පො.ස. (උ.පෙළ) විභාගය ජීව විද්‍යා විෂය ධාරාවන් හදාරා ඇත්ද ? ඔව්/නැත (අදාල නොවන වචනය කපා හරින්න.)

(ඇ) අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් සමත් විෂයයන්

විභාග අංකය	*වර්ෂය සහ මාසය*	*සමත් විෂයයන්*	*විෂය අංකය*	*සමත් ශ්‍රේණිය*
		1. ජීව විද්‍යාව		
		2. කෘෂි කර්මය		
		3. භෞතික විද්‍යාව		
		4. රසායනික විද්‍යාව		
		5. සත්ත්ව විද්‍යාව		
		6. උද්භිද විද්‍යාව		

(ඉ) ඉහත සඳහන් සුදුසුකම් සනාථ කිරීම සඳහා අධ්‍යාපන සහතිකවල ඡායා පිටපත් ඉල්ලුම්පත්‍රයට අමුණා එවන්න.
(මුල් පිටපත් එවිය යුතු නොවේ.)
සහතික වල ඡායා පිටපත් අමුණා තිබේද? :————.

13. (i) දෙමව්පිය හෝ භාරකරුගේ නම සහ ලිපිනය :————.
(ii) දෙමව්පිය හෝ භාරකරුගේ නම සහ ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරුවලින්)

14. මුදල් ගෙවූ කුවිතාන්සි පිළිබඳ විස්තර :
14.1 මුදල් කුවිතාන්සි අංකය හා දිනය :————.
14.2 මුදල් කුවිතාන්සිය ලබා ගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :————.

මුදල් ගෙවූ කුවිතාන්සියේ උඩ කොටසේ තීරුවක පමණක් මැලියම් ගා මෙහි අලවන්න. කුවිතාන්සියක ඡායා පිටපතක් අනිවාර්යයෙන්ම ඔබ ළඟ තබාගන්න.

අයදුම්කරුගේ ප්‍රකාශය :

මා විසින් මෙම අයදුම් පතෙහි සඳහන් කර ඇති විස්තර සත්‍ය බවත්, නිවැරදි බවටත් මෙයින් සහතික කරමි. අ.පො.ස (සා.පෙළ) සමත් බවත් සිංහල, විද්‍යාව, ගණිතය යන විෂයන්ට සම්මාන සාමාර්ථයන් ඇති බවත් සමාජ අධ්‍යයනය හෝ කෘෂිකර්මය යන විෂයයන් දෙකකින් එකකට සම්මාන සාමාර්ථයක් ඇති බවත් හා උසස් පෙළ ජීව විද්‍යා විෂය ධාරාවන් හදාරා ගැසට් නිවේදනයේ නම් කර ඇති විෂයන් එකක් හෝ ඊට වැඩි ගණනක් සමත් වී ඇති බවට සහතික වෙමි. මෙහි සඳහන් කරුණු අසත්‍ය බව හෝ වැරදි බව හෝ හෙලි වුවහොත්, මා තරහ විභාගයට පෙනී සිටීමට හා කෘෂිකර්ම විද්‍යාලයට තෝරා ගැනීමට නුසුදුස්සෙකු වන බව මම දනිමි. මෙම විභාගය සඳහා වූ සියලුම නීතිරීති පිළිපැදීමට මම එකඟ වෙමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

අත්සන සහතික කිරීම

දෙපාර්තමේන්තුවක හෝ පාසැලක ප්‍රධානියෙක්, සාමදාන විනිශ්චයකාරවරයෙක්, නීතිඥයෙක් හෝ රුපියල් 1,42,500 ක් හෝ ඊට වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර නිලධාරියෙකු විසින් මෙම අයදුම් පත්‍රය සහතික කළ යුතුයි.

ඉහතින් අත්සන් කර ඇති .....මයා./මිය./මෙනෙවිය මා හොඳින් දන්නා හඳුනන බවත්, ඔහු/ඇය මා ඉදිරිපිට දී අත්සන් යෙදූ බවත් මෙයින් සහතික කරමි.

————,
අත්සන සහතික කරන අයගේ

අත්සන හා නිල මුද්‍රාව.
දිනය :————,
නම :————,
නිල නාමය :————,
ලිපිනය :————.
05-360

අධ්‍යාපන අමාත්‍යාංශය

ගුරු අධ්‍යාපනය පිළිබඳ පූර්ව සේවා වෘත්තීය පාඨමාලාවක් හැදෑරීම සඳහා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට ඇතුළත් කරගැනීම - 2007

1.0 ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයක ගුරු අධ්‍යාපනය පිළිබඳ තුන් අවුරුදු පූර්ව සේවා වෘත්තීය පාඨමාලාවක් හැදෑරීමට අවශ්‍ය ශාස්ත්‍රීය සුදුසුකම් හා යෝග්‍යතාවය ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

2.0 යෝග්‍යතාව :

සෑම අයදුම්කරුවකුම, –

2.1 ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුයි ;

2.2 විශිෂ්ඨ චරිතයකින් ද, මනා ශාරීරික හා මානසික සෞඛ්‍යයෙන් ද යුක්ත විය යුතුය;

2.3 වයස :

2.3.1 2007.01.01 දිනට වයස අවුරුදු 25 ට නොවැඩි විය යුතුයි.

2.3.2 බුද්ධ ධර්මය පාඨමාලාවට ඉල්ලුම් කරන බෞද්ධ භික්ෂූන් වහන්සේලා 2007.01.01 දිනට වයස අවුරුදු 27 ට නොවැඩි විය යුතුය;

2.3.3 කතෝලික/ක්‍රිස්තියානි ධර්මය පාඨමාලාවට අයදුම්කරන පූජකවරුන් සඳහා 2007.01.01 දිනට වයස අවුරුදු තිහට (30) නොවැඩි විය යුතුයි ;

2.4 අවිවාහක විය යුතුයි.

3.0 ***මූලික අධ්‍යාපන සුදුසුකම්*** :

3.1 2005 වර්ෂයේ පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී විෂයය තුනකින් (ශ්‍රීපාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය සඳහා විෂයය දෙකකින්) එකවර සමත්වීම.

(තාක්ෂණ අධ්‍යයන පාඨමාලාවේ ඉල්ලුම්කරුවන් 4.14 ඡේදයේ සැලකිය යුතුයි යන වගන්තිය ද කතෝලික/ක්‍රිස්තියානි ධර්මය පාඨමාලාවේ පූජකවරුන් 4.10 ඡේදයේ සැලකිය යුතුයි යන වගන්තිය ද කියවන්න)

3.2 අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී/මූලික පිරිවෙන් අවසාන විභාගයේ දී ගණිතය සිංහල/දෙමළ භාෂාව ඇතුළු විෂයයන් 6 කින් දෙවරකට නොවැඩි වාර ගණනක දී (පළමු අවස්ථාවේ දී විෂයය 5 කින්) සම්මාන තුනක් සහිතව සමත්වීම.

3.3 ඒ ඒ පාඨමාලාවට අදාළ අ. පො. ස. (සා. පෙළ) විභාගයේ විශේෂ සුදුසුකම් ඉහත 3.2 පරිදි දෙවරක දී සම්පූර්ණ නොවේ නම් තුන්වැනි වාරයේ දී සම්පූර්ණ කර තිබිය යුතුය. සියලුම සුදුසුකම් ඉල්ලුම් පත්‍රය භාර ගන්නා අවසාන දින හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබිය යුතුය.

3.4 ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වෙන පාඨමාලාවලට ඉල්ලුම්කරන්නේ නම් අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාවට අධි සම්මාන/ඉංග්‍රීසි සාහිත්‍ය විෂයයට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම.

4.0 *අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් විශේෂ අවශ්‍යතා.–* ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල පැවැත්වෙන එක් එක් පාඨමාලාවට අදාළ අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් විශේෂ අවශ්‍යතා පහත දැක්වේ.

4.1 පාඨමාලා අංකය 01- ප්‍රාථමික අධ්‍යාපනය :

4.1.1 2005 වර්ෂයේ පවත්වන ලද අ. පෙ.ස. (උ. පෙළ) විභාගයේ දී සිංහල/දෙමළ භාෂාව ඇතුළුව විෂයය තුනකින් (ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය සඳහා විෂයය දෙකකින්) එකවර සමත්වීම; හා

4.1.2 සිංහල/දෙමළ භාෂාවට හා තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව ගණිතය ඇතුළු විෂයයන් 6න් අ.පො.ස. (සා.පෙ.) විභාගය සමත්වීම.

4.2 පාඨමාලා අංකය – 02 - i විද්‍යාව (සිංහල)
02 ii විද්‍යාව (දෙමළ)
02 - iii විද්‍යාව (ඉංග්‍රීසි)

4.2.1 2005 වර්ෂයේ පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, සහ ජීව විද්‍යාව යන විෂයයන්ගේ (ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය සඳහා ඉහත විෂයයන් අතුරින් විෂයය දෙකකින්) එකවර සමත්වීම; හා

4.2.2 සිංහල/දෙමළ භාෂාවට සාමාර්ථය හා 32 ගණිතය හෝ 42 ගණිතය විෂයයට සම්මාන සාමාර්ථයක් ඇතුළුව විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් සමත්වීම.

4.3 පාඨමාලා අංකය – 03 - i ගණිතය (සිංහල)
03 - ii ගණිතය (දෙමළ)
03 - iii ගණිතය(ඉංග්‍රීසි)

4.3.1 2005 වර්ෂයේ පවත්වන ලද අ. පො. ස (උ. පෙළ) විභාගයේ දී ගණිතය, සංයුක්ත ගණිතය, උසස් ගණිතය, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, යන විෂයයන්ගෙන් විෂයයන් තුනකින් (ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය සඳහා ගණිතය, සංයුක්ත ගණිතය, උසස් ගණිතය, යන විෂයයන්ගෙන් එකක්ද ඇතුළුව විෂයය දෙකකින්) එකවර සමත්වීම; හා

4.3.2 සිංහල/දෙමළ භාෂාවට සාමාර්ථය හා 34 විද්‍යාව විෂයයට සම්මාන සාමාර්ථයක් ඇතුළුව විෂයය හයකින් අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් සමත්වීම.

4.4 පාඨමාලා අංකය 04 - i ශාරීරික අධ්‍යාපනය (සිංහල)
04 - ii ශාරීරික අධ්‍යාපනය(දෙමළ)
04 - iii ශාරීරික අධ්‍යාපනය (ඉංග්‍රීසි)

4.4.1 2005 වර්ෂයේ පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී ඕනෑම විෂයය තුනකින් එකවර සමත්වීම; හා

4.4.2 සිංහල/දෙමළ භාෂාව හා ගණිතය ඇතුළුව විෂයය හයකින් අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් සමත්වීම; හා

4.4.3 පිළිගත්, ජවන හා පිටිය මලල ක්‍රීඩා හා සංවිධානාත්මක ක්‍රීඩා පිළිබඳ නිපුනත්වයක් ලබා තිබීම.
විවිධ ක්‍රීඩා/ඉසව් තුනකට උපරිම වශයෙන් ලකුණු 75 ක් ප්‍රදානය කිරීම පහත දැක්වෙන අනුපිළිවෙලට සිදු කරනු ලැබේ :-

ක්‍රීඩා/ඉසව් ප්‍රමුඛතා අනුපිළිවෙල

අනු අංකය	*මට්ටම/විෂයය*	*කේවල*	*සමූහ*	*ස්ථානය/ශ්‍රේණිය*	*ලකුණු*
1	අන්තර් ජාතික මට්ටම	කේවල	-	1	25
2	අන්තර් ජාතික මට්ටම	කේවල	-	2	24
3	අන්තර් ජාතික මට්ටම	කේවල	-	3	23
4	අන්තර් ජාතික මට්ටම	-	සමූහ	1	22
5	අන්තර් ජාතික මට්ටම	-	සමූහ	2	21
6	අන්තර් ජාතික මට්ටම	-	සමූහ	3	20
7	අන්තර් ජාතික නියෝජනය	කේවල	සමූහ		19
8	ජාතික මට්ටම	කේවල	-	1	18
9	ජාතික මට්ටම	කේවල	-	2	17
10	ජාතික මට්ටම	කේවල	-	3	16
11	ජාතික මට්ටම	-	සමූහ	1	15
12	ජාතික මට්ටම	-	සමූහ	2	14
13	ජාතික මට්ටම	-	සමූහ	3	13
14	පළාත් මට්ටම	කේවල	-	1	12
15	පළාත් මට්ටම	කේවල	-	2	11
16	පළාත් මට්ටම	කේවල	-	3	10
17	පළාත් මට්ටම	-	සමූහ	1	09
18	පළාත් මට්ටම	-	සමූහ	2	08
19	පළාත් මට්ටම	-	සමූහ	3	07
20	රෙජිමේන්තු සැරයන් මේජර්/බළලත් නිලධාරී 1	-	-	-	06
21	ජනාධිපති බාලදක්ෂ/බාලදක්ෂිකා	-	-	-	06
22	සාජන්ට් මේජර්/බළලත් නිලධාරී 2	-	-	-	05
23	දිස්ත්‍රික් මට්ටම/කලාප/ප්‍රා. ලේ. කාර්යාල	කේවල	-	1	06
24	දිස්ත්‍රික් මට්ටම/කලාප/ප්‍රා. ලේ. කාර්යාල	කේවල	-	2	05
25	දිස්ත්‍රික් මට්ටම/කලාප/ප්‍රා. ලේ. කාර්යාල	කේවල	-	3	04
26	දිස්ත්‍රික් මට්ටම/කලාප/ප්‍රා. ලේ. කාර්යාල	-	සමූහ	1	03
27	දිස්ත්‍රික් මට්ටම/කලාප/ප්‍රා. ලේ. කාර්යාල .	-	සමූහ	2	02
28	දිස්ත්‍රික් මට්ටම/කලාප/ප්‍රා. ලේ. කාර්යාල	-	සමූහ	3	01

4.4.4 අ.පො.ස. (සා.පෙ.) විභාගයේදී සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය විෂයයට පෙනී සිට සාමාර්ථයන් ලැබී ඇත්නම් පහත සඳහන් පරිදි අතිරේක ලකුණු හිමි වේ.
-
A සාමාර්ථය - 4
B සාමාර්ථය - 3
C සාමාර්ථය - 2
S සාමාර්ථය - 1

සැලකිය යුතුයි :

(i) *පිළිගත් ක්‍රීඩා තරහ (අන්තර් ජාතික).* – අධ්‍යාපන අමාත්‍යාංශ/ක්‍රීඩා අමාත්‍යාංශය, සහ ඒවායේ ලියාපදිංචි ජාතික ක්‍රීඩා සංගම් මගින් (චෙස්, කැරම්, දාම් හැර) ශ්‍රී ලංකාවේ ජාතික කණ්ඩායම් හෝ පාසල් ජාතික ක්‍රීඩා කණ්ඩායම් නියෝජනය කරමින් සහභාගිවන අන්තර් ජාතික තරහ (පාසැල් ක්‍රීඩා කණ්ඩායම් පෞද්ගලිකව සහභාගිවන අන්තර් ජාතික තරහ සලකා නොබැලේ.)

(ii) *පිළිගත් ක්‍රීඩා තරහ.* – අධ්‍යාපන අමාත්‍යාංශය/ ක්‍රීඩා අමාත්‍යාංශය / ජාතික තරුණ සේවා සභාව මගින් සංවිධානය කරනු ලබන ජාතික මට්ටමේ ක්‍රීඩා තරහ.
පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය/ පළාත් ක්‍රීඩා අමාත්‍යාංශය/ජාතික තරුණ සේවා සභාව මගින් සංවිධානය කරනු ලබන පළාත් මට්ටමේ ක්‍රීඩා තරහ.
පළාත් ක්‍රීඩා අමාත්‍යාංශය / ජාතික තරුණ සේවා සභාව මගින් සංවිධානය කරනු ලබන දිස්ත්‍රික් මට්ටමේ ක්‍රීඩා තරහ.
පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් සංවිධානය කරනු ලබන අධ්‍යාපන කලාප මට්ටමේ ක්‍රීඩා තරහ.

(iii) ක්‍රීඩා අමාත්‍යාංශය සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලියාපදිංචි හා පිළිගත් ක්‍රීඩා සංගම් මගින් සංවිධානය කරන ලද ඒ ශ්‍රේණියේ තරහවල 1, 2 හා 3 වන ස්ථානවලට පමණක් අනුපිළිවෙලින් ප්‍රමුඛතාව දෙනු ලැබේ.

(iv) ඉල්ලුම්පත්‍ර කැඳවීමේ අවසාන දිනයට පූර්වයෙන් වූ වර්ෂ 5 තුළ ලබාගත් ක්‍රීඩා නිපුණතා මේ සඳහා වලංගු වේ.

(v) ක්‍රීඩා සහතික තුනකට ලකුණු දීමේ දී ලකුණු හිමිවන්නේ එකම ඉසව්වකට" එකම වසරකදී ලබාගත් සහතිකවලින් එක් ඉහළම සහතිකයකට පමණි.

(vi) ක්‍රීඩා සහතික තුනකට ලකුණු ලබාදීමට අමතරව 4.4.4 යටතේ සුදුසුකම් ලබා තිබේනම් ඒ අනුව නියමිත ලකුණක් ද හිමි වේ.

4.5 *පාඨමාලා අංක 05* – i ගෘහ ආර්ථික විද්‍යාව හා ආහාර තාක්ෂණය (සිංහල)
ii ගෘහ ආර්ථික විද්‍යාව හා ආහාර තාක්ෂණය (දෙමළ)

4.5.1 2005 වර්ෂයේ පැවැත් වූ අ.පො. ස (උ.පෙළ) විභාගයේ දී, ගෘහ ආර්ථික විද්‍යාව ඇතුළුව විෂයයන් තුනකින් එකවර සමත්වීම; හා

4.5.2 විද්‍යාව විෂයට සම්මාන සාමාර්ථයක් සහිතව සිංහල/දෙමළ භාෂාව, ගණිතය ද ඇතුළුව විෂයයන් 06කින් අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් සමත්වීම.

4.6 පාඨමාලා අංක 06 – ඉංග්‍රීසි :

4.6.1 2005 වර්ෂයේදී පවත්වන ලද අ.පො. ස. (උ.පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි (සාමාන්‍ය ඉංග්‍රීසි නොවේ) ඇතුලුව විෂයය තුනකින් එකවර සමත්වීම, හා ඉංග්‍රීසි භාෂාවට අධි සම්මාන /ඉංග්‍රීසි සාහිත්‍යයට සම්මාන සාමාර්ථයක් ද, සිංහල /දෙමළ භාෂාවට හා ගණිතය ද ඇතුලුව විෂයය හයකින් අ.පො.ස. (සා. පෙ.) විභාගයෙන්/ලන්ඩන් අ.පො.ස. (සා. පෙ.) විභාගයෙන් සමත්වීම; හෝ

4.6.2 2005 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ.පෙළ) විභාගයේ දී ඕනෑම විෂයයන් තුනකින් එකවර සමත්වීම හා 2005 වර්ෂයේ දී පවත්වන ලද ලන්ඩන් අ.පො. ස (උ.පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි ඇතුලුව විෂයයන් තුනකින් සමත්වීම සහ අ.පො. ස. (සා. පෙළ) විභාගයෙන් /ලන්ඩන් අ.පො. ස. (සා.පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාවට අධි සම්මාන /ඉංග්‍රීසි සාහිත්‍යයට සම්මාන සාමාර්ථයක් හා සිංහල /දෙමළ භාෂාව හා ගණිතය ද ඇතුලුව විෂයයන් හයකින් සමත්වීම ; හෝ

4.6.3 2005 වර්ෂයේ දී පවත්වන ලද අ.පො. ස. (උ.පෙළ) විභාගයේ දී ඕනෑම විෂයයන් තුනකින් එකවර සමත්වීම හා අ.පො. ස. (සා.පෙළ) විභාගයෙන් /ලන්ඩන් අ.පො. ස. (සා.පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාවට අධි සම්මාන/ඉංග්‍රීසි සාහිත්‍යයට සම්මාන සාමාර්ථයක් හා සිංහල / දෙමළ භාෂාව හා ගණිතය ද ඇතුලුව විෂයයන් හයකින් අ.පො. ස. (සා. පෙළ) විභාගයෙන් සමත්වීම.

සැලකිය යුතුයි. :

(i) තෝරා ගැනීමේ දී ඉංග්‍රීසි පාඨමාලාවේ 4.6.1 හා 4.6.2 යටතේ සුදුසුකම් සපුරන අයදුම්කරුවන්ට ප්‍රමුඛතාව හිමි වේ. ඔවුන් ප්‍රවීණතා පරීක්ෂණයට පෙනී සිටිය යුතු නැත. සම්මුඛ පරීක්ෂණයේ දී සුදුසුකම් තහවුරු කළ යුතුය.

(ii) 4.6.3 යටතේ සුදුසුකම් සපුරන අයදුම්කරුවන් ප්‍රවීණතා පරීක්ෂණයට පෙනී සිටිය යුතු ය.

4.7 පාඨමාලා අංකය 07 – බුද්ධ ධර්මය :

බුද්ධ ධර්ම පාඨමාලාවට බෞද්ධ භික්ෂූන් වහන්සේලාට ද ගිහි අයදුම්කරුවන්ට ද, ඉල්ලුම් කළ හැකි ය. සියලුම අවශ්‍යතා 2004 වසරේ හෝ ඊට පෙර සම්පූර්ණකර තිබිය යුතුය. (ගිහි අයදුම්කරුවන්ගේ සියලුම අධ්‍යාපන සුදුසුකම් 2005 හෝ ඊට පෙර ගිහි නමින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.)

4.7.1 2005 වර්ෂයේ දී පවත්වන ලද අ.පො. ස (උ.පෙළ) විභාගයේ දී බුද්ධ ධර්මය, බෞද්ධ ශීෂ්ඨාචාරය, හා පාළි, යන විෂයයන්ගෙන් එකක් ඇතුලුව විෂයයන් තුනකින් එකවර සමත්වීම, (2008 වර්ෂයේදී ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල බුද්ධ ධර්මය පාඨමාලාවට සිසුන් ඇතුලත් කරගැනීමේදී අ.පො.ස. (උසස් පෙළ) සිංහල භාෂාව සමත්වීම සුදුසුකමක් ලෙස සැලකේ).

4.7.2 ප්‍රාචීන, ප්‍රාරම්භ විභාගයෙන් සමත්වීම (බෞද්ධ භික්ෂූන් වහන්සේලාට පමණි)

4.7.3 බෞද්ධ ධර්මාචාර්ය විභාගයෙන් සමත්වීම,

4.7.4 දහම් පාසල් අවසාන විභාගය සමත්වීම,

4.7.5 සිංහල භාෂාව, බුද්ධ ධර්මය හා ගණිතය, ඇතුලු විෂයයන් හයකින් අ.පො. ස. (සා.පෙළ) /සිංහල භාෂාව ගණිතය, ත්‍රිපිටක ධර්මය ඇතුලු විෂයයන් හයකින් මූලික පිරිවෙන් අවසාන විභාගයෙන් සමත්වීම.

සැලකිය යුතුයි :

(i) තෝරාගැනීමේ ප්‍රමුඛතා අනුපිළිවෙල –
(අ) 4.7.1., 4.7.2, 4.7.3, 4.7.4, 4.7.5 යන සියලුම සහතික ඇති අයදුම්කරුවන්,
(ආ) 4.7.1 4.7.2, සහ 4.7.5 සහතික ඇති අයදුම්කරුවන්,
(ඉ) 4.7.1, 4.7.3 සහ 4.7.5 සහතික ඇති අයදුම්කරුවන්,
(ඊ) 4.7.1, 4.7.4, 4.7.5 සහතික ඇති අයදුම්කරුවන්,
(උ) 4.7.1 සහ 4.7.5 සහතික ඇති අයදුම්කරුවන්)

4.8 *පාඨමාලා අංකය 08 – හින්දූ ධර්මය:*

4.8.1 2005 වර්ෂයේ දී පවත්වන ලද අ.පො. ස. (උ.පෙළ) විභාගයේ දී එකවර හින්දූ ධර්මය, හින්දූ ශීෂ්ඨාචාරය හා සංස්කෘත යන විෂයයන්ගෙන් විෂයය එකක් ඇතුලුව විෂයයන් තුනකින් සමත්වීම,

4.8.2 ශෛව සිද්ධාන්ත පණ්ඩිතර් සහතිකය ලබා තිබීම,

4.8.3 ශෛව පුලවර් සහතිකය ලබා තිබීම,

4.8.4 ඉලං ශෛව පුලවර් සහතිකය ලබා තිබීම,

4.8.5 දෙමළ භාෂාව, ගණිතය සහ හින්දූ ධර්මය ඇතුලු විෂයයන් 6කින් අ.පො. ස. (සා. පෙළ) විභාගයෙන් සමත්වීම.

(සැලකිය යුතුයි :
තෝරාගැනීමේ අනුපිළිවෙල :–
අ. 4.8.1, 4.8.5 සහ අනිකුත් සියළුම සහතික හිමි අයදුම්කරුවන්
ආ. 4.8.1, 4.8.5, 4.8.4 සහ අනිකුත් සහතික දෙකෙන් එකක් ලැබූ අයදුම්කරුවන්
ඉ. 4.8.1, 4.8.5 සහ අනිකුත් සහතික තුනෙන් එකක් ලැබූ අයදුම්කරුවන්
ඊ. 4.8.1, 4.8.5 සහතික ලැබූ අයදුම්කරුවන්
ඉහත සඳහන් සියළුම අවශ්‍යතා 2005 වර්ෂයේ දී හෝ ඊට පෙර ලබා තිබිය යුතුයි.)

4.9 පාඨමාලා අංකය 09 – ඉස්ලාම් ධර්මය :

4.9.1 2005 වර්ෂයේ දී පවත්වන ලද අ.පො. ස. (උ.පෙළ) විභාගයේ දී ඉස්ලාම් ධර්මය, ඉස්ලාම් ශිෂ්ඨාචාරය සහ අරාබි යන විෂයයන්ගෙන් එකක් ඇතුලුව විෂයයන් තුනකින් එකවර සමත්වීම,

4.9.2 අල්- ආලිම් විභාගය (1 වන කොටස හා 2 වැනි කොටස යන දෙකින්ම) සමත්වීම,

4.9.3 මෞලවි සහතිකය ලබා තිබීම හා අල් ආලිම් විභාගය 1 වන කොටස සමත්වීම.

4.9.4 මෞලවි සහතිකය ලබා තිබීම.

4.9.5 දෙමළ භාෂාව, ගණිතය සහ ඉස්ලාම් ධර්මය ඇතුලු විෂයයන් 6කින් අ.පො. ස. (සා. පෙළ) විභාගයෙන් සමත්වීම.

(සැලකිය යුතුයි:
තෝරාගැනීමේ ප්‍රමුඛතා අනුපිළිවෙල:
අ. 4.9.1, 4.9.5 සහ ඉහත සියලුම සහතික හිමි අයදුම්කරුවන්
ආ. 4.9.1, 4.9.5, 4.9.3 සහ 4.9.4 සහතික හිමි අයදුම්කරුවන්
ඉ. 4.9.1, 4.9.5 සහ 4.9.4 සහතික හිමි අයදුම්කරුවන්
ඊ. 4.9.1 සහ 4.9.5 සහතික හිමි අයදුම්කරුවන්
ඉහත සඳහන් සියලුම අවශ්‍යතා 2005 වර්ෂයේදී හෝ ඊට පෙර ලබා තිබිය යුතුයි.)

4.10 පාඨමාලා අංක 10 – කතෝලික ධර්මය / ක්‍රිස්තියානි ධර්මය :

4.10.1 2005 වර්ෂයේ දී පවත්වන ලද අ.පො. ස. (උ.පෙළ) විභාගයේ දී විෂයයන් තුනකින් එකවර සමත්වීම හා දේව ධර්මය පිළිබඳ පාඨමාලාව (බී. ටී. එව්.) හදාරා තිබීම; හෝ

4.10.2 2005 වර්ෂයේ දී පවත්වන ලද අ.පො. ස. (උ.පෙළ) විභාගයේදී ක්‍රිස්තු ධර්මය ඇතුලු එකවර විෂයයන් තුනකින් සමත්වීම හා ජාතික ධර්මෝපදේශ මධ්‍යස්ථානය මගින් පවත්වනු ලබන කතෝලික දහම්ගුරු සහතිකය සඳහා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථය ලබා තිබීම; හෝ

4.10.3 2005 වර්ෂයේ දී පවත්වන ලද අ.පො. ස. (උ.පෙළ) විභාගයේ දී එකවර විෂයයන් තුනකින් සමත්වීම හා දේව ධර්ම නිකේතනය මගින් පවත්වනු ලබන කතෝලික ධර්මය පිළිබඳ ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම; හෝ

4.10.4. 2005 වර්ෂයේ දී පවත්වන ලද අ.පො. ස. (උ.පෙළ) විභාගයේ දී එකවර විෂයයන් තුනකින් සමත්වීම හා කතෝලික රදගුරු පදවි මට්ටමෙන් පවත්වනු ලබන කතෝලික දහම් ගුරු සහතිකය ලබා තිබීම; හෝ

4.10.5 2005 වර්ෂයේ දී පවත්වන ලද අ.පො. ස. (උ.පෙළ) විභාගයේ දී එකවර විෂයයන් තුනකින් සමත්වීම හා පිළිමතලාව ලංකා දේවධර්ම ශාස්ත්‍රාලය මගින් පවත්වනු ලබන ධර්මවේදී ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම; හෝ

4.10.6 2005 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස.(උ.පෙළ) විභාගයේ දී එකවර විෂයයන් තුනකින් සමත්වීම හා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය මගින් පවත්වනු ලබන ආගමික දැනුම පිළිබඳ ජාතික සහතිකය (ධර්මාචාර්ය) ලබා තිබීම; හා

4.10.7 සිංහල/දෙමළ භාෂාව, ගණිතය සාමාර්ථය ද සහ ක්‍රිස්තු ධර්මය හෝ ක්‍රිස්තු ධර්මය (රෝමානු කතෝලික) විෂයයන්ට සම්මාන සාමාර්ථයන් ඇතිව විෂයයන් 6කින් අ.පො. ස. (සා.පෙ.) විභාගයෙන් සමත්වීම.

(සැලකිය යුතුයි .–

(i) බඳවා ගන්නා මුළු සංඛ්‍යාවෙන් 85% ක් තෝරාගැනීම සඳහා 4.10.1, 4.10.2, 4.10.3, 4.10.4 යන සහතිකවලට අනුපිළිවෙලින් ප්‍රමුඛත්වය දී කතෝලික ධර්මය අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

(ii) බඳවා ගන්නා මුළු සංඛ්‍යාවෙන් 15% ක් තෝරාගැනීම සඳහා 4.10.5, 4.10.6 සහතිකවලට අනුපිළිවෙලින් ප්‍රමුඛත්වය දී ක්‍රිස්තියානි ධර්මය අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කඳවනු ලැබේ.

(iii) බඳවා ගන්නා මුළු අයදුම්කරුවන් සංඛ්‍යාවෙන් 40% කතෝලික හා ක්‍රිස්තියානි පූජක පක්ෂයෙන් තෝරා ගනු ලැබේ. පූජක පක්ෂයේ අයදුම්කරුවන් අතර 2005 වර්ෂයේ අ .පො. ස. (උසස් පෙළ) සමත්වූ අයදුම්කරුවන් අවශ්‍ය සංඛ්‍යාව නොමැති නම් 2004, 2003, 2002 වර්ෂවල අ.පො.ස (උසස් පෙළ) සමත්වූ පූජක පක්ෂයේ අයදුම්කරුවන්ගෙන් තෝරා ගනු ලැබේ. 40% ක පූජක පක්ෂයේ අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉදිරිපත් වී නොමැති නම් එම පුරප්පාඩු සඳහා ගිහි අයදුම්කරුවන් තෝරා ගනු ලැබේ.

(iv) ඉල්ලුම්පත්‍රයේ පාඨමාලාවේ නම ලියන ස්ථානයේ කතෝලික ද, ක්‍රිස්තියානි ද යන්න සඳහන් කළ යුතුය.)

4.11 පාඨමාලා අංක 11 – පුස්තකාල විද්‍යාව හා තොරතුරු අධ්‍යයනය :

4.11.1. 2005 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ.පෙ) විභාගයේ දී විෂයයන් තුනකින් එකවර සමත්වීම; හා

4.11.2 ඉංග්‍රීසි භාෂාවට අධි සම්මාන / ඉංග්‍රීසි සාහිත්‍ය විෂයයට සම්මාන සාමාර්ථයක් සහිතව සිංහල/ දෙමළ භාෂාව හා ගණිතය ඇතුලුව විෂයයන් 06කින් අ.පො. ස. (සා. පෙ.) විභාගයෙන් සමත්වීම.

4.12 පාඨමාලා අංකය 12 – විශේෂ අධ්‍යාපනය :

4.12.1 2005 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී ඕනෑම විෂයයන් තුනකින් එකවර සමත්වීම; හා

4.12.2 සිංහල/දෙමළ භාෂාව, ගණිතය, ඇතුලුව විෂයයන් 06කින් අ.පො. ස. (සා.පෙළ) සමත්වීම.

4.13 පාඨමාලා අංකය 13 – කෘෂිකර්මය :

4.13.1 2005 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ.පෙ) විභාගයේ දී කෘෂි විද්‍යාව ඇතුලුව විෂයයන් තුනකින් එකවර සමත්වීම ; හා

4.13.2 ගණිතය සහ විද්‍යාව යන විෂයයන්ට සම්මාන සාමාර්ථයන් සහිතව සිංහල/දෙමළ භාෂාව ඇතුලු විෂයය 6 කින් අ.පෙ. ස. (සා. පෙ.) විභාගයෙන් සමත්වීම.

4.14 පාඨමාලා අංකය 14 – තාක්ෂණ අධ්‍යයනය :

4.14.1 2005 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී විෂයයන් තුනකින් එකවර සමත්වීම; හා

4.14.2 අ.පො. ස. (සා.පෙ.) සාමාර්ථය.

4.14.2.1 ඉදිකිරීම් තාක්ෂණය-
ගණිතය සහ සිංහල/දෙමළ භාෂාව ද, ලී වැඩ/මේසන් වැඩ/ඉදිකිරීම් තාක්ෂණය යන විෂයයන්ගෙන් එකක් ද ඇතුලුව විෂයයන් 6 කින් අ.පො. ස. (සා.පෙළ) විභාගයෙන් සමත්වීම; හෝ

4.14.2.2 යාන්ත්‍රික තාක්ෂණය :
ගණිතය සහ සිංහල/ දෙමළ භාෂාව ද, ලෝහ වැඩ,/මෝටර් කාර්මික ශිල්පය/යාන්ත්‍රික තාක්ෂණය යන විෂයයන්ගෙන් එකක් ද ඇතුලුව විෂයයන් 6 කින් අ.පො. ස. (සා. පෙ.) විභාගයෙන් සමත්වීම; හෝ

4.14.2.3 විදුලිය හා ඉලෙක්ට්‍රොනික් තාක්ෂණය :
ගණිතය සහ සිංහල/ දෙමළ භාෂාව ද, ගුවන් විදුලි කාර්මික ශිල්පය / විදුලි හා ඉලොක්ට්‍රොනික තාක්ෂණය යන විෂයයන්ගෙන් එකක් ද ඇතුලුව විෂයයන් 6 කින් අ. පො. ස (සා. පෙළ) විභාගයෙන් සමත්වීම; හෝ

4.14.2.4 කලාශිල්ප තාක්ෂණය :
ගණිතය සහ සිංහල/දෙමළ භාෂාව ද, විවිම/ මැටි ශිල්පය /කලා ශිල්ප යන විෂයයන්ගෙන් එකක් ද ඇතුලුව විෂයයන් 6 කින් අ.පො. ස. (සා. පෙ.) විභාගයෙන් සමත්වීම; හා

4.14.3 රජයේ පිළිගත් කාර්මික විද්‍යාලයක / ජාතික ආධුනිකත්ව මණ්ඩලය/ වෘත්තීය පුහුණු අධිකාරිය/ පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව /කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව යන ආයතන මගින් පවත්නා විෂය සාධන මට්ටම දැක්වෙන විධිමත් සහතික නිකුත් කරනු ලබන මාස 10ට නොඅඩු විෂය ක්ෂේත්‍රයට අදාළ ශිල්පීය පාඨමාලාවක් හදාරා සාර්ථකව නිමකර තිබීම.

4.14.4 නොවිටිමත් අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානයක ඉහත පාඨමාලාවලට සම්බන්ධ පාඨමාලාවක් හදාරා සාර්ථකව නිමකර තිබීම.

(සැලකිය යුතුයි. :

(i) තෝරාගැනීමේ ප්‍රමුඛතා අනුපිළිවෙල :

(අ) 4.14.1 – 4.14.2 – 4.14.3 සහතික ඇති අයදුම්කරුවන්,

(ආ) 4.14.1 හා 4.14.3 සහතික ඇති අයදුම්කරුවන්,

(ඉ) 4.14.1 හා 4.14.2 හා 4.14.4 සහතික ඇති අයදුම්කරුවන්.

(ඊ) 4.14.1 හා 4.14.2 සහතික ඇති අයදුම්කරුවන්

(ii) ඉල්ලුම් පත්‍රයේ ඉදිකිරීම් තාක්ෂණය / යාන්ත්‍රික තාක්ෂණය/ විදුලි ඉලෙක්ට්‍රොනික තාක්ෂණය /කලා ශිල්ප යන්න පැහැදිලිව සටහන් කළ යුතුය.

(iii) ඉල්ලුම්පත්‍ර කැඳවීමේ අවසාන දිනට හෝ ඊට පෙර ඉහත දැක්වෙන සියලු අවශ්‍යතා සම්පූර්ණකර තිබිය යුතුය.

(iv) අයදුම්පත්‍රය ඉදිරිපත් කර ඇත්තේ ඉහත (1) හි සඳහන් (අ), (ආ) හා (ඉ) ප්‍රමුඛතා අනුපිළිවෙලින් කුමක් යටතේ ද යන්න ඉල්ලුම් පත්‍රයෙහි අංක 17.0 යටතේ ඇති "ශිල්පීය පාඨමාලාවේ නම" සඳහන් කොටුවේ ලියන්න.

(v) 2005 වර්ෂයේ අ.පො.ස උසස් පෙළ සමත් සහ 4.14.3 සුදුසුකම් සපුරා ලූ අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් ඉදිරිපත් වී නොමැති නම් 2004 සහ 2003 වර්ෂවල දී අ.පො. ස. (උ.පෙ.) සමත්ව 4.14.3 සුදුසුකම් සම්පූර්ණ කළ අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත්‍ර සලකා බලනු ලැබේ.)

4.15 පාඨමාලා අංක 15 – චිත්‍ර කලාව

4.15.1 2005 වර්ෂයේ දී පවත්වන ලද අ .පො. ස. (උ.පෙ.) විභාගයේ දී චිත්‍රකලා විෂයය ඇතුලු විෂයයන් තුනකින් එකවර සමත්වීම හා
චිත්‍ර, ගණිතය , සිංහල / දෙමළ භාෂාව ඇතුලුව විෂයයන් 6කින් අ.පො. ස. (සා. පෙ.) විභාගය සමත්වීම.

4.15.2 2005 වසරේ අ.පො. ස. (උ.පෙ) විභාගයේ දී චිත්‍ර/චිත්‍ර හා මූර්ති විෂය සඳහා ලබා ඇති ශ්‍රේණිය මත අතිරේක ලකුණක් ප්‍රදානය කරනු ලැබේ.

සැලකිය යුතුයි.

(i) 4.15.1 යටතේ සුදුසුකම් සම්පූර්ණ කළ අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් ඉදිරිපත්වී නොමැති නම් 2005 වර්ෂයේ දී පවත්වන ලද අ.පො. ස. (උ.පෙ) විභාගයේ දී විෂයයන් තුනකින් එකවර සමත්වීම ;හා සිංහල/දෙමළ භාෂාව ගණිතයට සාමාර්ථය ද, චිත්‍ර කර්මය සම්මාන සාමාර්ථ්‍යයක් ද ඇතුලු විෂයය හයකින් අ.පො.ස. (සා. පෙ.) විභාගයෙන් සමත් වූ ඉල්ලුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

4.16 පාඨමාලා අංක 16 –නැටුම් (පෙරදිග)/ නැටුම් (භරත)

4.16.1 2005 වර්ෂයේ දී පවත්වන ලද අ.පො. ස. (උ.පෙළ) විභාගයේ දී පෙරදිග නැටුම්/භරත නැටුම් ඇතුළු විෂය තුනකින් (ශ්‍රීපාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට විෂය දෙකකින්) එකවර සමත්වීම.

4.16.2 2005 වසරේ අ.පො. ස. (උ.පෙළ) විභාගයේ දී නැටුම් (පෙරදිග)/නැටුම් (භරත) විෂය සඳහා ලබා ඇති ශ්‍රේණිය මත අතිරේක ලකුණක් ප්‍රදානය කරනු ලැබේ.

4.16.3 සිංහල/ දෙමළ භාෂාව ගණිතය හා පෙරදිග නැටුම්/ භරත නැටුම් ඇතුළු විෂයයන් 06කින් අ.පො. ස. (සා. පෙළ) විභාගය සමත්වීම.

සැලකිය යුතුයි

(i) ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය සඳහා අදාළ සුදුසුකම් සම්පූර්ණ කළ අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති නම් 2005 වර්ෂයේ දී පවත්වන ලද අ.පො. ස. (උ. පෙ.) විභාගයේ දී එකවර විෂයයන් දෙකකින් සමත්ව අ.පො. ස. (සා.පෙ.) විභාගයේ දී භරත නැටුම් විෂයයට සම්මාන සාමාර්ථ්‍යයක් ලබා ඇති ඉල්ලුම් පත්‍ර සලකා බලනු ලැබේ.

4.17 පාඨමාලා අංකය 17 – සංගීතය (පෙරදිග) / සංගීතය (කර්ණාට)

4.17.1. 2005 වර්ෂයේ දී පවත්වන ලද අ.පො. ස. (උ.පෙ.) විභාගයේ දී පෙරදිග සංගීතය/ කර්ණාට සංගීතය ඇතුළු විෂයයන් තුනකින් (ශ්‍රීපාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට විෂය දෙකකින්) එකවර සමත්වීම; හා

4.17.2 2005 වසරේ අ.පො. ස. (උ.පෙ.) විභාගයේ දී සංගීතය(පෙරදිග) සංගීතය (කර්ණාට) විෂයය සඳහා ලබා ඇති ශ්‍රේණිය මත අතිරේක ලකුණක් ප්‍රදානය කරනු ලැබේ.

4.17.3 සිංහල / දෙමළ භාෂාව, ගණිතය හා පෙරදිග සංගීතය / කර්ණාට සංගීතය ඇතුළු විෂයයන් 06කින් අ.පො. ස. (සා. පෙළ) විභාගය සමත්වීම.

(සැලකිය යුතුයි) (i) ශ්‍රීපාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය සඳහා අදාළ සුදුසුකම් සම්පූර්ණ කළ අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති නම් 2005 වර්ෂයේ දී පවත්වන ලද අ.පො. ස. (උ.පෙ.) විභාගයේ දී එකවර විෂයයන් දෙකකින් සමත්ව අ.පො.ස. (සා.පෙ.) විභාගයේ දී කර්ණාට සංගීතය විෂයට සම්මාන සාමාර්ථයක් ලබා ඇති ඉල්ලුම් පත්‍ර සලකා බලනු ලැබේ.)

4.18. පාඨමාලා අංකය 18 - බටහිර සංගීතය

4.18.1 2005 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙ.) විභාගයේ දී බටහිර සංගීතය ඇතුළු විෂයයන් තුනකින් එකවර සමත්වීම හා
ඉංග්‍රීසි භාෂාව අධි සම්මාන /ඉංග්‍රීසි සාහිත්‍යයට සම්මාන සාමාර්ථයක් ද සහිතව සිංහල/දෙමළ භාෂාව, ගණිතය හා බටහිර සංගීතය ඇතුළු විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙ.) විභාගයෙන් සමත්වීම ; හා

4.18.2 2005 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී ඕනෑම විෂයයන් තුනකින් එකවර සමත්වීම හා
ඉංග්‍රීසි භාෂාව අධි සම්මාන /ඉංග්‍රීසි සාහිත්‍යයට සම්මාන සාමාර්ථයක් ද සහිතව සිංහල/දෙමළ භාෂාව, ගණිතය හා බටහිර සංගීතය ඇතුළු විෂයයන් 6කින් අ.පො.ස. (සා.පෙ.) විභාගයෙන් සමත්වීම ; හා
අධ්‍යාපනික විද්‍යායතන මණ්ඩලය විසින් අනුමත කරන ලද ආයතනයක බටහිර සංගීතය පිළිබඳව පස්වැනි පන්තිය සමත්වීම (නාහයික හා ප්‍රායෝගික).

සැලකිය යුතුයි(i) . බටහිර සංගීත පාඨමාලාව සඳහා පවත්වන ප්‍රායෝගික පරීක්ෂණයේ දී සතුටුදායක කුසලතා මට්ටමකට ලභා වීම

(ii) මෙම පාඨමාලාවට තෝරාගැනීමේ දී ඉහත 4.18.1 යටතේ සුදුසුකම් සපුරාලූ අයදුම්කරුවන්ට ප්‍රමුඛත්‍වය දෙනු ලැබේ.

4.19 පාඨමාලා අංකය 19 - නාට්‍ය හා රංග කලාව

4.19.1 2005 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී නාට්‍ය හා රංග කලාව ඇතුළුව විෂයයන් 03 කින් සමත්වීම; හා

4.19.2 සංගීතය හෝ නැටුම් හෝ චිත්‍ර, ද ගණිතය සහ සිංහල/දෙමළ භාෂාව ද ඇතුළු විෂයයන් 6 කින් අ. පො. ස. (සා. පෙ.) විභාගයෙන් සමත්වීම.

4.19.3 2005 වසරේ අ. පො. ස. (උ. පෙ.) විභාගයේ දී නාට්‍ය හා රංග කලාව විෂයය සඳහා ලබා ඇති ශ්‍රේණිය මත අතිරේක ලකුණක් ප්‍රදානය කරනු ලැබේ.

4.20 පාඨමාලා අංකය 20 - තොරතුරු සන්නිවේදන තාක්ෂණය

4.20.1 2005 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙ.) විභාගයේ දී ඕනෑම විෂයයන් තුනකින් (ශ්‍රී පාද අධ්‍යාපන විද්‍යාපීඨයට විෂයයන් දෙකකින්) එකවර සමත්වීම; හා

4.20.2 අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාවට අධි සම්මාන/ඉංග්‍රීසි සාහිත්‍ය විෂයයට සහ ගණිතයට සම්මාන සාමාර්ථයන් ද සහිතව සිංහල/දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් 06 කින් අ. පො. ස. (සා. පෙ.) විභාගයෙන් සමත්වීම.

4.21 පාඨමාලා අංකය 21-i. සාමාජීය විද්‍යාව (සිංහල)
21-ii. සාමාජීය විද්‍යාව (දෙමළ)
21-iii. සාමාජීය විද්‍යාව (ඉංග්‍රීසි)

4.21.1 2005 වර්ෂයේදී පවත්වන ලද අ. පො. ස. (උ. පෙ.) විභාගයේ දී ඉතිහාසය, දේශපාලන විද්‍යාව, ආර්ථික විද්‍යාව, හා භූගෝල විද්‍යාව යන විෂයයන්ගෙන් එකක් ඇතුළුව එකවර විෂයයන් තුනකින් (ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට ඉහත විෂයයන් දෙකකින්) එකවර සාමාර්ථ්‍යය ; හා

4.21.2 සමාජ අධ්‍යයනය හා ඉතිහාසය විෂයයට සම්මාන සාමාර්ථයක් සහිතව සිංහල/දෙමළ භාෂාව හා ගණිතය ඇතුළුව විෂයයන් 06 කින් අ. පො. ස. (සා. පෙ.) විභාගය සමත්වීම.

4.22 පාඨමාලා අංකය 22 - පළමුබස (දෙමළ)

4.22.1 2005 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී දෙමළ විෂයයට සම්මාන සාමාර්ථයක් ඇතුළුව විෂයයන් තුනකින් (ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට විෂයයන් දෙකකින්) එකවර සමත්වීම; හා

4.22.2 දෙමළ භාෂාවට සම්මාන සාමාර්ථය සහ ගණිතය ඇතුළු විෂයයන් 06 කින් අ. පො. ස. (සා. පෙ.) විභාගය සමත්වීම.

4.23 පාඨමාලා අංකය 23 - i.. දෙවන බස (සිංහල)
ii. දෙවන බස (දෙමළ)

4.23.1 (i) දෙවන බස (සිංහල) පාඨමාලාව අයදුම්කරුවන් 2005 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙ.) විභාගයේ දී දෙමළ භාෂාවට සම්මාන සාමාර්ථයක් ඇතුළුව විෂයයන් 3 කින් සමත්වීම; හා

4.23.2 අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී වෛකල්පිත දෙවන බස 64 සිංහල විෂය සමත්වීම; හා

4.23.3 දෙමළ භාෂාව, ගණිතය ඇතුළු විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්වීම.

4.23.1 (ii) දෙවන බස (දෙමළ) පාඨමාලාව අයදුම්කරුවන් 2005 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙ.) විභාගයේ දී සිංහල භාෂාවට සම්මාන සාමාර්ථ්‍යයක් ඇතුළුව විෂයන් 3 කින් සමත්වීම; හා

4.23.2 අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී වෛකල්පිත දෙවන බස 65 දෙමළ විෂය සමත්වීම; හා

4.23.3 සිංහල භාෂාව, ගණිතය ඇතුළු විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙ.) විභාගය සමත්වීම.

4.24. පාඨමාලා අංකය 24 - ප්‍රංශ භාෂාව

4.24.1 2005 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී ප්‍රංශ භාෂාව, ඇතුළු විෂයයන් තුනකින් එකවර සමත්වීම හා,
අ. පො. ස. (සා. පෙ.) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව අධි සම්මාන /ඉංග්‍රීසි සාහිත්‍යයට සම්මාන සාමාර්ථයක් හා සිංහල/දෙමළ භාෂාව හා ගණිතය ඇතුළු විෂයයන් 06 කින් අ. පො. ස. (සා. පෙ.) විභාගය සමත්වීම.

5.0 *පාඨමාලා අංකය, පාඨමාලාවේ නම, මාධ්‍ය අනුව එක් එක් පාඨමාලාව පැවැත්වෙන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය එහි අංකය සහිතව පහතින් දැක්වේ.*

(කරුණාකර මේ වගුව හොඳින් පරීක්ෂා කරන්න. සම්මුඛ පරීක්ෂණ සඳහා එක් එක් පාඨමාලාවට අදාළ පරිගණක ලේඛන සකස් කිරීමේ දී ඔබේ ඉල්ලුම් පත්‍රය පරිගණක ගත කරන්නේ පාඨමාලා අංක අනුවය. නිවැරදි තොරතුරු සටහන් නොකළ ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.) ඉල්ලුම් පත්‍රය විභාග දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ පසු කිසිදු සංශෝධනයක් කිරීමට ඉඩ දෙනු නොලැබේ.)

i. තීරුව - පාඨමාලා අංකය
ii. තීරුව - පාඨමාලාවේ නම
iii. තීරුව - සිංහල මාධ්‍යයෙන් පාඨමාලා පැවැත්වෙන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ
iv. තීරුව - දෙමළ මාධ්‍යයෙන් පාඨමාලා පැවැත්වෙන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ
v. තීරුව - ඉංග්‍රීසි මාධ්‍යයෙන් පාඨමාලා පැවැත්වෙන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ (ඒ ඒ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ අංකය පීඨයේ නම ඉදිරියෙන් වරහන් තුළ දැක්වේ.)

පාඨමාලා අංකය	*පාඨමාලාවේ නම*	*මාධ්‍ය අනුව පාඨමාලා පැවැත්වෙන විද්‍යාපීඨ සහ ඒවායේ අංක*		
		සිංහල මාධ්‍යය	*දෙමළ මාධ්‍යය*	*ඉංග්‍රීසි මාධ්‍යය*
i	ii	iii	iv	v
01	ප්‍රාථමික	(1) ඌව	(6) වවුනියා	
		(6) වවුනියා	(7) ශ්‍රීපාද	
		(7) ශ්‍රී පාද	(8) අඩ්ඩාලච්චේන	
		(11) පුලතිසිපුර	(9) මඩකලපුව	
		(13) රුවන්පුර	(14) රුහුණ	
		(14) රුහුණ	(15) යාපනය	
		(17) හාපිටිගම	(16) දර්ගා නගර	
02	විද්‍යාව i. ii. iii	(2) නිල්වලා	(6) වවුනියා	(2) නිල්වලා
		(5) සියනෑ	(7) ශ්‍රීපාද	(5) සියනෑ
		(7) ශ්‍රීපාද	(9) මඩකලපුව	(15) යාපනය
			(8) අඩ්ඩාලච්චේන	
03	ගණිතය i, ii, iii	(2) නිල්වලා	(7) ශ්‍රීපාද	(2) නිල්වලා
		(5) සියනෑ	(8) අඩ්ඩාලච්චේන	(5) සියනෑ
		(7) ශ්‍රීපාද	(9) මඩකලපුව	(15) යාපනය
04	ශාරීරික අධ්‍යාපනය	(1) ඌව	(6) වවුනියා	(1) ඌව
	i, ii, iii	(2) නිල්වලා	(8) අඩ්ඩාලච්චේන	(2) නිල්වලා
		(14) රුහුණ		
05	ආහාර තාක්ෂණය හා	(14) රුහුණ	(6) වවුනියා	
	ගෘහ ආර්ථික විද්‍යාව			
			(16) දර්ගා නගර	

පාඨමාලා අංකය	පාඨමාලාවේ නම	මාධ්‍ය අනුව පාඨමාලා පැවැත්වෙන විද්‍යාපීඨ සහ ඒවායේ අංක		
		සිංහල මාධ්‍යය	දෙමළ මාධ්‍යය	ඉංග්‍රීසි මාධ්‍යය
i	ii	iii	iv	v
06	ඉංග්‍රීසි			(3) මහවැලි
				(10) පස්දුන්රට
				(15) යාපනය
07	බුද්ධ ධර්මය	(4) සාරිපුත්ත		
08	හින්දු ධර්මය		(6) වවුනියා	
09	ඉස්ලාම් ධර්මය		(8) අඩ්ඩාලච්චේන	
10	කතෝලික ධර්මය/			
	ක්‍රිස්තියානි ධර්මය	(12) වයඹ	(6) වවුනියා	
11	පුස්තකාල විද්‍යාව සහ			
	තොරතුරු අධ්‍යයනය			(3) මහවැලි
				(10) පස්දුන්රට
				(15) යාපනය
12	විශේෂ අධ්‍යාපනය	(17) හාපිටිගම	(15) යාපනය	
			(16) දර්ගා නගර	
13.	කෘෂිකර්මය	(11) පුලතිසිපුර	(6) වවුනියා	
14.	තාක්ෂණ අධ්‍යයනය	(5) සියනෑ	(9) මඩකලපුව	
15.	චිත්‍ර	(12) වයඹ	(8) අඩ්ඩාලච්චේන	
			(15) යාපනය	
16.	නැටුම් (පෙරදිග)	(12) වයඹ		
	නැටුම් (භරත)		(7) ශ්‍රීපාද	
			(15) යාපනය	
17.	සංගීතය (පෙරදිග)	(12) වයඹ		
	සංගීතය (කර්ණාට)		(7) ශ්‍රීපාද	
			(15) යාපනය	
18.	බටහිර සංගීතය			(3) මහවැලි
19.	නාට්‍ය හා රංගකලාව	(12) වයඹ	(15) යාපනය	
20.	තොරතුරු සංනිවේදන			(2) නිල්වලා
	තාක්ෂණය			(5) සියනෑ
				(6) වවුනියා
				(7) ශ්‍රීපාද
				(8) අඩ්ඩාලච්චේන
				(9) මඩකලපුව
				(11) පුලතිසිපුර
				(12) වයඹ
				(13) රුවන්පුර
				(14) රුහුණ
				(16) දර්ගා නගර
21	සමාජීය විද්‍යාව	(13) රුවන්පුර	(7) ශ්‍රීපාද	(1) ඌව
			(9) මඩකලපුව	(13) රුවන්පුර
22	පළමු බස (දෙමළ)		(7) ශ්‍රීපාද	
			(9) මඩකලපුව	
			(16) දර්ගා නගර්	
23	දෙවන බස i,. ii,	(14) රුහුණ	(6) වවුනියා	
24	ප්‍රංශ භාෂාව			(10) පස්දුන්රට

සැලකිය යුතුයි

(i) අඩ්ඩාලච්චේන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට අයදුම්කළ යුත්තේ මුස්ලිම් අයදුම්කරුවන් පමණි.

(ii) දෙමළ මාධ්‍යයෙන් පාඨමාලා පැවැත්වෙන දර්ගානගරය ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයට අයදුම් කළ යුත්තේ කාන්තාවන් පමණි.

(iii). හරත නැටුම්, කර්ණාට සංගීතය පළමු බස දෙමළ මාධ්‍යයෙන් පමණක් ද, පෙරදිග නැටුම් සහ පෙරදිග සංගීතය සිංහල මාධ්‍යයෙන් පමණක් ද, බටහිර සංගීතය පුස්තකාල විද්‍යාව හා තොරතුරු අධ්‍යයනය හා තොරතුරු සංනිවේදන තාක්ෂණය ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් ද, පැවැත්වේ.

6.0 2007 වර්ෂය සඳහා ශික්ෂණ ලාභීන් තෝරා ගැනීමේ පටිපාටිය

6.1 තෝරාගැනීමේ පදනම :

6.1.1 2010 වසරේ පාසල් පද්ධතියේ ගුරු අවශ්‍යතාව පදනම් කරගෙන බඳවා ගන්නා ශික්ෂණ ලාභීන් සංඛ්‍යාව තීරණය කර ඇත.

6.1.2 බඳවා ගැනීමේ මූලික පදනම "Z" ලකුණු කුසලතාව වේ. ශ්‍රී පාද විද්‍යා පීඨය හාර අනෙකුත් සියලුම විද්‍යාපීඨවල පවත්වන පාඨමාලා සඳහා ජාතික මට්ටමෙන් **50%** ක් ද, දුෂ්කර මට්ටමෙන් **50%** ද තෝරාගනු ලැබේ.

6.1.3 ඉංග්‍රීසි, පුස්තකාල විද්‍යාව සහ තොරතුරු අධ්‍යයනය, විද්‍යාව, ගණිතය, බටහිර සංගීතය, ශාරීරික අධ්‍යාපනය, තොරතුරු සංනිවේදන තාක්ෂණය සහ සාමාජීය විද්‍යාව යන පාඨමාලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් හැදෑරීමට ඉල්ලුම් අයදුම්කරුවන් අ. පො. ස. (සා. පෙළ.) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාවට අධි සම්මාන/ඉංග්‍රීසි සාහිත්‍යය විෂයයට සම්මාන සාමාර්ථයක් සහිතව සිංහල/දෙමළ භාෂාව හා ගණිතය ඇතුළුව විෂයය 06 කින් අ. පො. ස. (සා. පෙළ.) විභාගයෙන් සමත්වීම අවශ්‍ය වේ.)

6.1.4 ශාරීරික අධ්‍යාපනය නැටුම් (පෙරදිග)/,නැටුම් (භරත), සංගීතය (පෙරදිග)/, සංගීතය(කර්ණාට), සහ බටහිර සංගීතය පාඨමාලා සඳහා පවත්වන ප්‍රායෝගික පරීක්ෂණයේ දී ශාරීරික යෝග්‍යතාව පිළිබඳව සතුටුදායක කුසලතා මට්ටමකට ළඟා විය යුතුය.

6.2 දුෂ්කර දිස්ත්‍රික්ක පදනම:

6.2.1 දුෂ්කර දිස්ත්‍රික්ක සඳහා බඳවාගනු ලබන්නේ අධ්‍යාපන සුදුසුකම් බෙදීයාම අනුව දුෂ්කර යයි සලකනු ලබන දිස්ත්‍රික්ක 17 ට අයත් අයදුම්කරුවන්ගෙනි. එක් එක් දිස්ත්‍රික්කයෙන් ඒ ඒ මාධ්‍යයෙන් අ. පො. ස. (උ. පෙළ.) විභාගයට පෙනී සිටි ශිෂ්‍යගහණයේ සමානුපාතයට සෑම පාඨමාලාවකටම ඒ ඒ දිස්ත්‍රික්කයන්ගෙන් බඳවා ගන්නා සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

6.2.2 එක් එක් දුෂ්කර දිස්ත්‍රික්කය සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොසිටි අවස්ථාවක දී වෙනත් දුෂ්කර දිස්ත්‍රික්ක වලින් පුරප්පාඩු පුරවනු ලැබේ.

6.2.3 **දුෂ්කර දිස්ත්‍රික්ක සහ අංක**

මාතලේ	04	මන්නාරම	12	පුත්තලම	18
නුවරඑළිය	06	මුලතිව්	13	අනුරාධපුරය	20
හම්බන්තොට	09	වවුනියාව	14	පොළොන්නරුව	21
යාපනය	10	ත්‍රිකුණාමලය	15	බදුල්ල	22
කිලිනොච්චිය	11	මඩකලපුව	16	මොණරාගල	23
		අම්පාර	17	රත්නපුර	25

6.2.4දිස්ත්‍රික්ක නිර්ණය කිරීම

6.2.4.1 යම් පාසල් අපේක්ෂකයකුගේ දිස්ත්‍රික්කය වන්නේ පළමුවරට අ. පො. ස. (උ. පෙළ.) විභාගයට පෙනී සිටි මාසයට පෙරාතුව වූ මාසය දක්වා වූ වසර 5 තුළ සම්පූර්ණ කාලය හෝ වැඩිම කාලයක් (අවුරුදු 2 1/2 කට වැඩි) ඔහු/ඇය ඉගෙනීම කළ පාසල/පාසල් පිහිටා ඇති දිස්ත්‍රික්කයයි.

6.2.4.2 යම් පෞද්ගලික අපේක්ෂකයෙකු ඊට ප්‍රථමයෙන් පාසල් අපේක්ෂකයකු වශයෙන් පළමුවරට අ. පො. ස. (උ. පෙළ.) විභාගයට පෙනී සිට පාසල හැර ගොස් ඇති අවස්ථාවක එකී අපේක්ෂකයාගේ දිස්ත්‍රික්කය වන්නේ ප්‍රථමයෙන් එකී විභාගයට පෙනී සිටි පාසල පිහිටි දිස්ත්‍රික්කයයි.

6.2.4.3 යම් පෞද්ගලික අපේක්ෂකයෙකු යම් හෙයකින් පාසල් අපේක්ෂකයෙකු වශයෙන් අ. පො. ස. (උ. පෙළ.) විභාගයට කලින් පෙනී නොසිට පාසල් හැරගොස් ඇති අවස්ථාවක එකී අපේක්ෂකයාගේ දිස්ත්‍රික්කය වනුයේ අ. පො. ස. (උ. පෙළ.) විභාගයට පළමුවරට පෙනීසිටි මාසයට පෙරාතුවම වූ මාසයේ අවසාන දිනය දක්වා ඇති වර්ෂ පහ තුළ වැඩිම කාලයක් (අවුරුදු 2 1/2 කට වැඩි) අධ්‍යාපනය ලැබූ පාසල හෝ පාසල් පිහිටා ඇති දිස්ත්‍රික්කයයි.

6.2.4.4 පාසලක අධ්‍යාපනය නොලැබූ පෞද්ගලික අපේක්ෂකයෙකු නම් ග්‍රාම සේවා නිලධාරි හා ප්‍රාදේශීය ලේකම් ගේ දිවුරුම් ප්‍රකාශයක් හෝ මැතිවරණ දෙපාර්තමේන්තුවේ ඡන්ද නිම් නාම ලේඛනය මගින් පමණක් ඉහත දිස්ත්‍රික්කයක පදිංචිය තහවුරු කළ යුතුය.

6.3 **ශ්‍රීපාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට තෝරා ගැනීම**

6.3.1 පුරප්පාඩු සංඛ්‍යාවෙන් **75%** ක් ඉන්දියානු ද්‍රවිඩ සම්භවය ඇති අයදුම්කරුවන්ගෙන් ද, **25%** ක් සිංහල අයදුම්කරුවන්ගෙන් ද පුරවනු ලැබේ.

6.3.2 දෙමළ මාධ්‍යය පාඨමාලා සඳහා **75%** ක් ද, සිංහල මාධ්‍යය පාඨමාලා සඳහා **25%** ක් ද තෝරාගනු ලැබේ.

6.3.3 ප්‍රාථමික, ගණිතය, විද්‍යාව, යන පාඨමාලා සිංහල මාධ්‍යයෙන් ද ප්‍රාථමික, ගණිතය, විද්‍යාව, කර්ණාට සංගීතය, භරත නැටුම්, හා පළමු බස (දෙමළ) සාමාජීය විද්‍යාව යන පාඨමාලා දෙමළ මාධ්‍යයෙන් ද, තොරතුරු සංනිවේදන තාක්ෂණය ඉංග්‍රීසි මාධ්‍යයෙන් ද පැවැත්වේ.

6.3.4 ශ්‍රීපාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට ඉල්ලුම් කළ යුත්තේ නුවරඑළිය, මහනුවර, මාතලේ, බදුල්ල, රත්නපුරය, කෑගල්ල, කළුතර, මාතර ගාල්ල සහ කුරුණෑගල යන වැවිලි දිස්ත්‍රික්කවල පදිංචිය අය ගේ දරුවන් පමණි.

6.3.5 තෝරාගැනීමේ දී ඉහත සඳහන් වැවිලි දිස්ත්‍රික්ක දහයෙහි වතු අංශයෙහි පදිංචි වතු සේවකයන්ගේ දරුවන්ට ප්‍රමුඛතාව හිමිවේ. රාජ්‍ය හා ලියාපදිංචි පෞද්ගලික වතු සමාගම්වල සේවකයන්ගේ දරුවන් ඒ බව තහවුරු කිරීම සඳහා වතු අධිකාරීගේ ලිපිය (සේවකයා සේවය කළ දින වකවානු සහිතව) හා සේවක අර්ථසාධක අරමුදලට අයකිරීම් කරන බව ලියාපදිංචි අංක සහිතව ඔප්පු කරන ලිපි සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය. ඉල්ලුම්කරුගේ දිස්ත්‍රික්කය නිර්ණය කිරීමේ පදනම දැක්වෙන 6.2.2 ඡේදය ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට ඉල්ලුම්කරුවන් තෝරාගැනීමේදී ද අදාළ කරගනු ලැබේ.

6.3.6 අදාළ සෑම දිස්ත්‍රික්කයකින්ම අවම වශයෙන් එක් අයදුම්කරුවෙකුවත් තෝරාගැනීම සඳහා සලකා බලනු ලැබේ.

සැලකිය යුතුයි. සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ ඉන්දියානු සම්භවය ඇති අයදුම්කරුවකු නම් ඉන්දියානු සම්භවයට හිමි ප්‍රතිශතය සඳහා සලකා බලනු ලැබේ. එමෙන් ම දෙමළ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ සිංහල අයදුම්කරුවකු නම් සිංහල මාධ්‍ය ප්‍රතිශතය සඳහා සලකා බලනු ලැබේ.

7.0 තෝරාගැනීමට අදාළ වෙනත් කරුණු

7.1 තෝරාගනු ලබන අයදුම්කරුවන් අදාළ පාඨමාලාව සඳහා යෝග්‍යතාව සනාථ කිරීමට පිළිගත හැකි ලිඛිත සාක්ෂි සහ සහතිකවල මූලික පිටපත් සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනට ඉදිරිපත් කිරීමට සූදානම්ව සිටිය යුතුය. පුරප්පාඩු සංඛ්‍යාවට වඩා වැඩි සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

7.2 සියලුම සහතිකවල මූල් පිටපත් සම්මුඛ පරීක්ෂණ දිනට ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන් තෝරාගනු නොලැබේ.

7.3 පාඨමාලාවේ අපේක්ෂිත මට්ටමට ළඟා වීමට අයදුම්කරුවන් වෙත තිබිය යුතු කායික මානසික යෝග්‍යතාව පිළිබඳ ගැටළු තත්ත්වයන් නිරීක්ෂණය වූ අවස්ථාවක එකී තත්ත්වයන් පිළිබඳ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සැහීමකට පත් නොවේ නම් විශේෂ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක පරීක්ෂණයකට භාජනය කොට එහි වාර්තාව අධ්‍යාපනික විද්‍යායතන මණ්ඩලයට ඉදිරිපත් කර ලබාගන්නා තීරණය ක්‍රියාත්මක කරනු ඇත.

7.4 තෝරාගනු ලබන අයදුම්කරුවන් අදාළ ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයේ ලියාපදිංචි වීමට නියමිත දිනයේ සිට දින 03 ක් ඇතුළත ලියාපදිංචි නොවූවහොත් ඇතුළත්වීමේ අවස්ථාව ඔහුට/ඇයට අහිමි වනු ඇත. මේ අනුව ඇති වන පුරප්පාඩු කුසලතා අනුපිළිවෙලට පුරවනු ලැබේ.ඉල්ලුම් කරනු ලබන විද්‍යා පීඨයේ පුරප්පාඩු නොමැති විටක අදාළ පාඨමාලාව පැවැත්වෙන පුරප්පාඩු ඇති වෙනත් විද්‍යාපීඨයකට ඇතුලත් කිරීමට කටයුතු කරනු ලැබේ.

7.5 තෝරා ගනු ලබන අයදුම්කරුවන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සුදුසු මානසික හා කායික සෞඛ්‍යයෙන් යුක්ත දැයි පරීක්ෂාකර බැලීම සඳහා විද්‍යාපීඨවලට ඇතුළත්වීමට පෙර වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු වේ.

7.6 යම් පාඨමාලාවකට/ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයකට තෝරාගත් පසු ඒ පාඨමාලාව/ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ. කිසියම් පාඨමාලාවකට ප්‍රමාණවත් ශිෂ්‍ය සංඛ්‍යාවක් නොපැමිණි අවස්ථාවක ළඟම ඇති විද්‍යා පීඨයකට අදාළ පාඨමාලාව හැදෑරීමට මාරු කරනු ලැබේ.

7.7 යම්කිසි පාඨමාලාවක් සඳහා තෝරාගැනීමේ දී අ. පො. ස. (උ. පෙළ.) විභාගයේ දී යම්කිසි එකම ලකුණක් ලබාගෙන ඇති අයදුම්කරුවන්ගේ සංඛ්‍යාව තවදුරටත් තෝරා ගත යුතු පුරප්පාඩු සංඛ්‍යාවට වඩා වැඩි නම්, අදාළ අයදුම්කරුවන්ගේ පළමු වරට අ. පො. ස. (සා. පෙළ.) විභාගයට ඉදිරිපත් වූ ප්‍රතිඵල සැළකිල්ලට භාජනය කෙරේ. විශිෂ්ඨ සාමාර්ථයකට ලකුණු 03 ක් ද, සම්මාන සාමාර්ථයකට ලකුණු 2 ක් ද, සාමාන්‍ය සාමාර්ථයකට ලකුණු 01 ක් ද, බැගින් ලකුණු ප්‍රදානය කොට සමස්ත ලකුණු සංඛ්‍යාව පදනම් කර ගනිමින් නියමිත පුරප්පාඩු සංඛ්‍යාව පුරවනු ලැබේ. මෙම ලකුණු දීම ප්‍රධාන විෂයයන් අටකට පමණක් සීමා කෙරේ.

8.0 *පාඨමාලා සඳහා අයදුම් කිරීමට හෝ ඇතුළත් වීමට නුසුදුස්සන්* :

8.1 දැනටමත් රජයේ හෝ පෞද්ගලික හෝ පාසැල්වල ගුරු පත්වීම් ලබා ඇති අය,

8.2 රජයේ පාසලක පත්වීමක් සඳහා තෝරා ගනු ලැබ සිටින අය,

8.3 ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයක පාඨමාලාවක් හදාරන හෝ හැදෑරූ අය,

8.4 ශ්‍රී ලංකා විද්‍යාලයක/විශ්ව විද්‍යාල විද්‍යායතනයක/වෙනත් උසස් අධ්‍යාපන ආයතනයක/අ. පො. ස. (උ. පෙළ) සුදුසුකම් වලින් බඳවා ගන්නා පාඨමාලාවක ලියාපදිංචි/හදාරමින් සිටින හෝ උපාධි පාඨමාලාවක් හදාරා අවසන් කළ අය, (අයදුම්පත් කැඳවීමේ අවසාන දිනයට පසුව විශ්ව විද්‍යාලවල ලියාපදිංචිය අවලංගු කරගෙන සම්මුඛ පරීක්ෂණ සඳහා පැමිණෙන අය තෝරාගැනීම සඳහා සුදුසුකම් නොලබන බව අවධාරණය කෙරේ.)

8.5 විනයානුකූල හේතූන් මත ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයකින් ඉවත් කරනු ලැබූ අය.

9.0 *පුහුණුව හා අදාළ කොන්දේසි* :

9.1 පුහුණු පාඨමාලාවක කාල සීමාව අවුරුදු තුනකි. එය ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ අවුරුදු දෙකක නේවාසික ආයතනික පුහුණුවකින් ද, පාසලකට අනුයුක්තව සිදු කෙරෙන වසරක සීමාවාසී පුහුණුවකින් ද සමන්විත වේ. දෙවන වසර අවසානයේ දී විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන බාහිර අවසාන පරීක්ෂණයට පෙනී සිටීම සඳහා ශික්ෂණලාභියාගේ පැමිණීම 90**%** කට නොඅඩු විය යුතුය.

9.2 සෑම ශික්ෂණලාභියකු ම පළමු වසර අවසානයේ සහ දෙවන වසර අවසානයේ පවත්වනු ලබන අභ්‍යන්තර පරීක්ෂණයෙන් ද ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වන අවසාන බාහිර විභාගයෙන් ද සමත් විය යුතුයි. එමෙන් ම ඉංග්‍රීසි මාධ්‍ය පාඨමාලාව හදාරන අය හැර අනෙක් සියලුම පාඨමාලා හදාරන අය ඉහත විභාගවලදී ඉංග්‍රීසි විෂයයෙන් සමත් විය යුතුය. ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ එම කොන්දේසි වලට එකඟ වන අය පමණි.

9.3 ශික්ෂණලාභියෙකුට නේවාසික පුහුණුව ලබන වර්ෂ දෙක තුළ දී වර්ෂයකට මාස 10 ක් සඳහා මාසයකට රු. 1,500 ක වටිනාකමින් යුත් ආහාරපාන හා නේවාසික පහසුකම් සපයනු ලැබේ. සීමාවාසී වර්ෂය තුළ දී මාස 10 ක් සඳහා මාසයකට රු. 2,000 බැගින් යුත් දීමනාවක් ගෙවනු ලැබේ. පෞද්ගලික අවශ්‍යතාවලට අදාළ සෙසු විධිවිධාන ශික්ෂණලාභියා විසින් දැරිය යුතුය.

9.4 පුහුණු වන කාල සීමාව තුළ ශික්ෂණලාභියා විශ්ව විද්‍යාලයක, විශ්ව විද්‍යාල විද්‍යායතනයක, වෙනත් ආයතනයක, උසස් පෙළ සුදුසුකම් වලින් බඳවා ගන්නා පාඨමාලාවක, අභ්‍යන්තර ශිෂ්‍යයෙකු වශයෙන් අධ්‍යයන පාඨමාලාවක් හැදෑරීමට කිසිසේත් අවසර දෙනු නොලැබේ. එසේ පාඨමාලාවක නිරතවන බව සනාථ වුවහොත් ශික්ෂණලාභියා වෙනුවෙන් දරන ලද වියදම ආපසු අයකරගෙන පාඨමාලාවෙන් ඉවත් කරනු ලැබේ.

9.5 පුහුණුවන කාල සීමාව තුළ දී අභ්‍යාසලාභියකු විවාහවුවහොත් ශිෂ්‍ය භාවය අවලංගු කරනු ලැබේ. භික්ෂූන් වහන්සේලා ලියාපදිංචි වීමෙන් පසු උපැවිදි වුවහොත් පාඨමාලාවෙන් ඉවත්කරනු ලැබේ. පුහුණුව අවසන් කළ පසු සෑම ආගමිකටම අයත් පූජ්‍ය පක්ෂය උපැවිදි නොවී අවම වශයෙන් අවුරුදු පහක් අධ්‍යාපන අමාත්‍යාංශයට සේවය කරන බවට අමාත්‍යාංශය සමඟ ගිවිසුමකට එළඹිය යුතුයි.

9.6 පුහුණුවන කාලසීමාව තුළ අපේක්ෂිත හැසිරීම, උදෙන්ගය හා අධ්‍යයන කටයුතුවල ප්‍රගතිය නොපෙන්වන ශික්ෂණලාභියෙකු පුහුණුවෙන් ඉවත් කරනු ලැබේ. එසේම ශාස්ත්‍රීය පුහුණුවේ ප්‍රථම වර්ෂය තුළ දී කරනු ලබන ඇගැයීමේදී සතුටුදායක මට්ටමකට එළැඹීමට අසමත් හෝ 9.4 ඡේදයේ දැක්වෙන පාඨමාලාවක් හදාරන බව සනාථ වුවහොත්, පාඨමාලාවෙන් ඉවත් කරනු ලැබේ. මේ පිළිබඳව අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යාපනික විද්‍යායතන මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වනු ඇත.

9.7 පුහුණුවන කාල සීමාව තුළ දී ශික්ෂණලාභියා ගේ කායික හා මානසික යෝග්‍යතාව සම්බන්ධයෙන් පියාධිපතිගෙන් හෝ සීමාවාසී කාල සීමාව තුළ විදුහල්පතිගෙන් පැමිණිලි ලැබේ නම් නැවත විශේෂ සම්මුඛ පරීක්ෂණයකට ඉදිරිපත් කරනු ලැබේ. එහි වාර්තාව අධ්‍යාපනික විද්‍යායතන මණ්ඩලයට ඉදිරිපත්කර අවසාන තීරණය ගනු ලැබේ.

9.8 පුහුණුව සඳහා නියමිත අවුරුදු තුනේ කාල සීමාව සම්පූර්ණ කිරීමට පෙර පුහුණුව අත්හරින්නේ නම් පුහුණු කිරීම වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යාංශයට වැය වූ මුදල ආපසු අමාත්‍යාංශයට ගෙවන බවට ශික්ෂණලාභීන් විසින් අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ ගිවිසුමකට ඇතුළත් විය යුතු වේ.

9.9 පුහුණු පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කරන ශික්ෂණලාභීන්ට ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව ප්‍රදානය කරනු ලැබේ. පාඨමාලාශ්‍රිත වැඩ හා පෞරුෂ වර්ධනය (අනිවාර්යයෙන්ම සහභාගි විය යුතු

විෂයය සමගාමී කටයුතු ඇතුළු) පුහුණුවීම් කාලය තුළ දී අඛණ්ඩ ලෙස අගයනු ලබන අතර, මේ ඇගයීම් ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව ප්‍රදානය කිරීම සඳහා කරනු ලබන අවසාන ඇගයීමේ කොටසක් වනු ඇත.

9.10 රජයේ පාසල්වල ඇතිවන ඇබෑර්තු සංඛ්‍යාව පදනම් කරගෙන මෙම පාඨමාලාවන් සාර්ථක ලෙස සම්පූර්ණ කරන අයදුම්කරුවන්ට ගුරු පත්වීම් ලබාදීම සඳහා සළකා බලනු ලැබේ. අනාගතයේ දී රජයේ පාසල්වලට ගුරු පත්වීම් දීමේ දී මෙම පුහුණු පාඨමාලා සම්පූර්ණ කළ අයට ප්‍රමුඛත්වය ලැබෙනු ඇත. පුස්තකාල විද්‍යාව හා තොරතුරු අධ්‍යයන පාඨමාලාව සම්පූර්ණ කරන ශික්ෂණලාභීහු ගුරු පුස්තකාලයාධිපති තනතුරු සඳහා රජයේ පාසල්වල පත්වීම් ලැබීමට සුදුසුකම් ලබති. රජයේ පාසැල්වලට පත් කරනු ලබන අය, පත්වීම් දින සිට පස් අවුරුද්දක් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ සේවය කරන බවට අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ ගිවිසුමකට බැඳිය යුතුය.

9.11 පුහුණු පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කරන, එහෙත් රජයේ ගුරුවරුන් වශයෙන් රැකියාව භාර නොගන්නා අය පුහුණුවට වැය වූ මුදල අධ්‍යාපන අමාත්‍යාංශයට ආපසු ගෙවිය යුතුය. ඒ සම්බන්ධව ද ගිවිසුමකට බැඳිය යුතුය.

9.12 සියලුම අධ්‍යාපන හා සෙසු සුදුසුකම් අයදුම්පත් කැඳවන අවසාන දිනයට සම්පූර්ණ කොට තිබිය යුතුය.

10.0 ***අයදුම් කිරීම*** :

10.1 එක් අයදුම්කරුවකුට උපරිම වශයෙන් පාඨමාලා තුනකට අයදුම් කළ හැකිය. එකම පාඨමාලාවකට මාධ්‍ය දෙකකින් අයදුම් කළහොත් එය ද පාඨමාලා දෙකකට අයදුම් කළාසේ සැලකේ. එවැනි අයදුම්කරුවකුට තවත් එක් පාඨමාලාවකට පමණක් අයදුම් කළ හැකිය. උදා. විද්‍යාව පාඨමාලාව සිංහල මාධ්‍ය සහ විද්‍යාව පාඨමාලාව ඉංග්‍රීසි මාධ්‍ය යන දෙකටම අයදුම් කළ අයදුම්කරුවකුට අයදුම්කළ හැක්කේ තවත් එක් පාඨමාලාවකට පමණකි.

10.2 එක් අයදුම්කරුවෙකු විසින් එක් අයදුම්පත්‍රයක් පමණක් ඉදිරිපත් කළ යුතුය. එකකට වඩා ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කර ඇත්නම් සියලුම ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

10.3 අයදුම්පත්‍රය පහත දැක්වෙන උපදෙස් හා ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කළ යුතුය.

10.4 අයදුම්පත්‍ර 2006 ජූනි 26 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "විභාග කොමසාරිස් ජනරාල්, පාසල් විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව, තැ. පෙ. 1503 කොළඹ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

අයදුම් පත්‍රය බහා එවන කවරයේ වම්පස උඩ කෙළවරේ ;

2007 ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට ඇතුළත්වීම සඳහා අයදුම්පත්‍රය,
පළමු මනාපය ලෙස දක්වා ඇති පාඨමාලාව සහ අංකය .....

යන කරුණු පිළිබඳ තොරතුරු පැහැදිලි ලෙස ලිවිය යුතුය. (අධ්‍යාපන අමාත්‍යාංශයට හෝ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට හෝ අයදුම් පත්‍ර නොඑවිය යුතු බව අවධාරණය කරමි.)

10.5 විද්‍යාපීඨ බඳවා ගැනීම සම්බන්ධයෙන් වීමසීමක් හෝ අභියාචනයක් ඉදිරිපත් කරන සෑම අවස්ථාවක දී ම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කළ ලියාපදිංචි තැපැල් කුවිතාන්සිය සහ ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් ඉදිරිපත් කළ යුතුය. එමනිසා ඒවා අයදුම්කරු ලඟ තබා ගත යුතුය.

10.6 විභාග අංකය, වර්ෂය, පාඨමාලා අංකය සහ පාඨමාලාව නිවැරදිව ඇතුළත් නොකරන ලද හා අසම්පූර්ණ අවිධිමත් අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

10.7 අයදුම්පත්‍ර ලැබුණු බව දන්වා එවනු නොලැබේ.

10.8 අයදුම්පත්‍රයට වෙනත් කිසිදු ලියවිල්ලක් අමුණා නොඑවිය යුතුය.

10.9 අයදුම්කරු විසින් ඉදිරිපත් කරනු ලබන සහතිකයක් කුට හෝ වංචනික හෝ සහතිකයක් බවට පසුව හෙළි වුවහොත් අයදුම්කරු සේවයෙන් පහ කරනු ලබන අතර, රාජ්‍ය සේවයේ කිසිම පත්වීමක් සඳහා නුසුදුස්සෙකු වනු ඇත.

11.0 *ගැසට් නිවේදනයේ* ඉහත සඳහන් තොරතුරු මත මතුවන ගැටළු පිළිබඳව අධ්‍යාපනික විද්‍යායතන මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

12.0 මෙම *ගැසට් නිවේදනයෙහි* සිංහල හා දෙමළ හෝ ඉංග්‍රීසි භාෂා පාඨමාලා අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වේ.

ආරියරත්න හේවගේ,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2006 මැයි මස 05 වැනි දින,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,
බත්තරමුල්ල.

අයදුම්පත් පිළියෙල කිරීම සඳහා උපදෙස්

ගැසට් නිවේදනය කීපවරක් සැලකිල්ලෙන් කියවන්න. ඔබට සුදුසුකම් ඇති පාඨමාලා තුනකට එක් අයදුම් පත්‍රයක පමණක් අයදුම් කරන්න. මෙම අයදුම්පත්‍රය හා එහි සහතික කළ ඡායා පිටපත් දෙකක් පමණක් එකම කවරයක බහා ඉදිරිපත් කරන්න. පහත දැක්වෙන ආදර්ශය අනුව ඒ 4 ප්‍රමාණයේ (සෙන්ටි මීටර් 21 X සෙන්ටිමීටර් 29.7) සුදු කඩදාසියක අයදුම්පත පිළියෙල කරන්න. 1.0 - 10.2 දක්වා ඡේද පළමුවන පිටුවට ඇතුළත් වන සේ සකස් කරන්න. කොටුවක් තුළ තොරතුරු දැක්විය යුතු අවස්ථාවල දී අදාළ කොටුව තුළ "X" ලකුණ යොදන්න.

අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවීම සඳහා එක් එක් පාඨමාලාව වෙනුවෙන් විභාග දෙපාර්තමේන්තුව පිළියෙල කරන පරිගණක නාමාවලි සකස් කරන්නේ පළමු පිටුවේ දැක්වෙන 1.0 - 10.3 දක්වා තොරතුරු පදනම් කරගෙන බව කරුණාවෙන් සලකන්න. විශේෂයෙන්ම පාඨමාලාවේ අංකය පාඨමාලාව අ. පොෙ. ස. (උ. පෙළ.) විභාගයේ අංකය, Z අගය නිවැරදි බවට තහවුරු කරගන්න. අංක එක උඩ එක ලිවීමෙන් හෝ නොපැහැදිලිව ලිවීමෙන්, වැරදි ලෙස ලිවීමෙන් ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප කිරීමට සිදුවන බව කරුණාවෙන් සලකන්න.

ශාරීරික අධ්‍යාපන පාඨමාලාව සඳහා ඉල්ලුම් පත්‍රයේ 13.0 ඡේදය ද, බුද්ධ ධර්මය පාඨමාලාව සඳහා ඉල්ලුම් පත්‍රයේ 14.0 ඡේදය ද, කතෝලික/ක්‍රිස්තියානි ධර්මය සඳහා 15.0 ඡේදය ද, හින්දු ධර්මය/ඉස්ලාම් ධර්මය සඳහා 16.0 ඡේදයේ ද, තාක්ෂණ අධ්‍යයනය සඳහා 17.0 ඡේදය ද, බටහිර සංගීතය සඳහා 18.0 ඡේදය ද දක්වා ඇති තොරතුරු සැලකිල්ලට ගැනේ. ඒ නිසා ඒවා නිවැරදිව පිරවිය යුතුයි. ඒවා පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට නියමිත අංක හා පාඨමාලාවට නියමිත අංක මෙම *ගැසට් නිවේදනයේ* 5.0 ඡේදයේ දැක්වේ.

දිස්ත්‍රික්කවලට නියමිත අංක මෙසේ ය:

කොළඹ	01	හම්බන්තොට	09	අම්පාර	17
ගම්පහ	02	යාපනය	10	පුත්තලම	18
කළුතර	03	කිලිනොච්චිය	11	කුරුණෑගල	19
මාතලේ	04	මන්නාරම	12	අනුරාධපුරය	20
මහනුවර	05	මුලතිවු	13	පොළොන්නරුව	21
නුවරඑළිය	06	වවුනියාව	14	බදුල්ල	22
ගාල්ල	07	ත්‍රිකුණාමලය	15	මොණරාගල	23
මාතර	08	මඩකලපුව	16	කෑගල්ල	24
				රත්නපුර	25

මාධ්‍ය : සිංහල - S දෙමළ- T ඉංග්‍රීසි - E

ආදර්ශ අයදුම්පත්‍රය

ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට ඇතුළත් කර ගැනීම - 2007

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි.

(අයදුම්කරුවකු එක් අයදුම්පතක් පමණක් ඉදිරිපත් කළ යුතුය. ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන ලෙස සකස් කළ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම් පත්‍රයේ 10 වෙනි ඡේදය දක්වා තොරතුරු පළමු පිටුවට ඇතුළත් කරන්න. තෝරා ගැනීමේ සම්මුඛ පරීක්ෂණ සඳහා පරිගණක නාමාවලිය සකස් කරන්නේ 1.0 - 10.3 දක්වා තොරතුරු ඇසුරෙනි.)

1.0

මනාපය	*පාඨමාලාවේ අංකය*	*පාඨමාලාවේ නම*	*ජා. අ. වි. ජීයේ අංකය*	*ජා. අ. වි. ජීයේ නම*	*මාධ්‍යය*		
					S	*T*	*E*
1.							
2.							
3.							

2.0 2.1 මුල්කුරු සමඟ නම ඉංග්‍රීසියෙන් Rev./Mr./Miss.:_____,
නිදසුන (In Block Letters) Mr. Perera R. C.
2.2 සම්පූර්ණ නම : සිංහලෙන්/දෙමළෙන් :_____,

3.0 ස්ථිර පදිංචි ලිපිනය :
3.1 ඉංග්‍රීසියෙන් :_____,
3.2 සිංහලෙන්/දෙමළෙන් :_____,
3.3 තැපැල් කාර්යාලයේ සංකේත අංකය :_____,
4.0 ස්ථිර පදිංචි පරිපාලන දිස්ත්‍රික්කය හා අංකය :_____,
5.0 *ගැසට් නිවේදනයේ* 6.2 ඡේදයේ අදාල වේ නම් පමණක් 6.2.4 ඡේදය අනුව දිස්ත්‍රික්කය හා අංකය:_____,

6.0 6.1 උපන් දිනය : (ඉලක්කමෙන්) අවුරුද්ද: ☐☐☐☐ මාසය: ☐☐ දිනය: ☐☐

6.2 2006.01.01 දිනට වයස: අවුරුදු ☐☐ මාස ☐☐ දින ☐☐

6.3 ජාතික හැඳුනුම්පත් අංකය: ☐☐☐☐☐☐☐☐☐☐

7.0 ස්ත්‍රී/පුරුෂ භාවය: 0 පුරුෂ ☐ 1 ස්ත්‍රී ☐

8.0 ජන වර්ගය:

සිංහල	ශ්‍රී ලංකා දුවිඩ	ඉන්දියානු දුවිඩ	මුස්ලිම්	වෙනත්
☐	☐	☐	☐	☐
1	2	3	4	5

9.0 2005 වර්ෂයේ අ. පොෙ. ස. (උ. පෙළ.) විභාගයේ ප්‍රතිඵල:

9.1 වර්ෂය : ☐☐☐☐

9.2 විභාග අංකය: ☐☐☐☐☐☐☐

9.3 Z අගය : ☐ ☐☐☐☐

9.4 ප්‍රතිඵල විස්තර:

	විෂයය	*ලැබූ ශ්‍රේණිය*
1.	_____	_____
2.	_____	_____
3.	_____	_____
4.	_____	_____

10.0 10.1 ඉංග්‍රීසි සහ ඉංග්‍රීසි මාධ්‍ය පාඨමාලාවල අයදුම්කරුවන් අ. පොෙ. ස. (සා. පෙළ.) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාවට හෝ ඉංග්‍රීසි සාහිත්‍යයට ලැබූ ඉහළම ශ්‍රේණිය: ☐

වර්ෂය : ☐☐☐☐ විභාග අංකය: ☐☐☐☐☐☐☐

10.2 ශ්‍රීපාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට අයදුම් කරන අය තමන් වතු සේවක දරුවෙක්ද යන්න අදාල කොටුවේ "X" ලකුණින් දැක්විය යුතුයි. 1. ඔව් ☐ 2. නැත ☐

10.3 ශාරීරික අධ්‍යාපනය සිංහල/දෙමළ/ඉංග්‍රීසි මාධ්‍යය අයදුම්කරුවන් තම අයදුම්පතෙහි 13.0 වගන්තිය සඳහා ඇතුළත් කරනු ලබන ලකුණුවල එකතුව (4.4.3. හා 4.4.4ට අනුව)

11.0 2005 වර්ෂයට පෙර ඔබ අ. පොෙ. ස. (උ. පෙළ.) විභාගයට පෙනී සිට ඇත්නම් ඔබ පෙනී සිටියේ එක් විෂයයකට පමණක් වුව ද එක් එක් වාරයේ සම්පූර්ණ විස්තර සඳහන් කරන්න:

		1	2
11.1	විභාගයට පෙනී සිටි වාර:	_____	_____
11.2	වර්ෂය :	_____	_____
11.3	විභාග අංකය:	_____	_____
11.4	විභාග මධ්‍යස්ථානයේ අංකය:	_____	_____
11.5	ලැබූ ඒකාබද්ධ ලකුණු/ Z අගය:	_____	_____
11.6	සමත් වූ විෂයයන් හා ශ්‍රේණි :		

විෂය	*ශ්‍රේණිය*	*විෂය*	*ශ්‍රේණිය*
_____	_____	_____	_____
_____	_____	_____	_____
_____	_____	_____	_____
_____	_____	_____	_____

12.0 සමත් වූ අ. පොෙ. ස. (සා. පෙ.) විභාගය පිළිබඳ විස්තර:

		1	2	3
12.1	විභාගයට පෙනී සිටි වාර:			
12.2	වර්ෂය:	_____	_____	_____
12.3	විභාග අංකය	_____	_____	_____
12.4	විභාග මධ්‍යස්ථානයේ අංකය:	_____	_____	_____
12.5	සමත් වූ විෂයයන් හා ශ්‍රේණි:	_____	_____	_____

	විෂය	*ශ්‍රේණිය*	*විෂය*	*ශ්‍රේණිය*	*විෂය*	*ශ්‍රේණිය*
1.	_____	_____	_____	_____	_____	_____
2.	_____	_____	_____	_____	_____	_____
3.	_____	_____	_____	_____	_____	_____
4.	_____	_____	_____	_____	_____	_____
5.	_____	_____	_____	_____	_____	_____
6.	_____	_____	_____	_____	_____	_____
7.	_____	_____	_____	_____	_____	_____
8.	_____	_____	_____	_____	_____	_____

13.0 ගැසට් නිවේදනයේ 4.4 ඡේදයේ 4.4.3 හා 4.4.4 වගන්තියට අනුව ක්‍රීඩා ප්‍රවීණතාව පිළිබඳ විස්තර. (ශාරීරික අධ්‍යාපන පාඨමාලාවට අයදුම් කරන අය පමණක් පිරවිය යුතුය.) මෙම කොටස සම්පූර්ණ කිරීමේ දී 4.4.3 හි සියලු වගන්ති කෙරෙහි ඔබගේ අවධානය යොමු කළ යුතුය. ඔබ ලබා ඇති ඉහළම ක්‍රීඩා සහතික/නිපුණතා කුනක තොරතුරු පමණක් ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් වේ. ඔබ අ. පොෙ. ස (සා. පෙළ) විභාගයේ සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපන විෂයයට පෙනී සිට සාමාර්ථ ලබා ඇත්නම් 4.4.4 ට අනුව ශ්‍රේණියට හිමි ලකුණ ද පහත කොටසෙහි සඳහන් කළ යුතුය. මූලු ලකුණුවල එකතුව මුල් පිටුවේ 10.3 හි ද ඇතුළත් කළ යුතුය.

ක්‍රීඩා ප්‍රවීණතාව

අනු අංකය	*වර්ෂය*	*නිකුත් කළ අමාත්‍යාංශය/ ආයතනය/සංගමය*	*තරඟ නියෝජනය කළ මට්ටම අන්තර්ජාතික/ජාතික/ පළාත්/දිස්ත්‍රික්ක කළාප*	*ඉසව්ව/ක්‍රීඩාව*	*ලැබූ ස්ථානය*	*4.4.3 ට අදාල ලකුණු*
1.						
2.						
3.						

අ. පොෙ. ස. (සා. පෙළ) සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපන විෂයයට (පෙනී සිටියේ නම්) ලද ශ්‍රේණිය	ලකුණු	
	මුළු එකතුව	

14.0 *ගැසට් නිවේදනයේ* 4.7 වගන්තියේ (අ) අනුව ප්‍රාචීන ප්‍රාරම්භ, බෞද්ධ ධර්මාචාර්ය පිරිවෙන් අවසාන විභාග ප්‍රතිඵල පිළිබඳ විස්තර ඇත්නම් ඇතුළත් කරන්න.

විභාගය	ප්‍රාචීන ප්‍රාරම්භ	බෞද්ධ ධර්මාචාර්ය	පිරිවෙන් අවසාන	දහම් පාසල් අවසාන
	14.1 වර්ෂය			
	14.2 විභාග අංකය			
	14.3 මධ්‍යස්ථාන අංකය			
	14.4 විෂය හා ශ්‍රේණිය	1. 2. 3. 4.	1. 2. 3. 4. 5. 6.	1. 2 3. 4. 5. 6. 7. 8. 9. 10. 11.

15.0 ගැසට් නිවේදනයේ 4.10 ඡේදය අනුව කතෝලික/ක්‍රිස්තියානි ධර්මය, අයදුම්කරුවන් විසින් අදාළ කොටස පිරවිය යුතුය.

පාඨමාලාවේ නම/සහතිකය	භදාරන ලද කාලය		
	සිට	දක්වා	ලබා ඇති සාමාර්ථය
15.1 දේව ධර්මය පිළිබඳ පාඨමාලාව BTH			
15.2 ජාතික ධර්මෝපදේශ මධ්‍යස්ථානය මගින් පවත්වනු ලබන කතෝලික දහම් ගුරු සහතිකය			
15.3 දේව ධර්ම නිකේතනය මගින් පවත්වනු ලබන කතෝලික ධර්මය පිළිබඳ ඩිප්ලෝමා සහතිකය			
15.4 රදගුරු පදවි මට්ටමෙන් පවත්වනු ලබන කතෝලික දහම් සහතිකය			
15.5 පිළිමතලාව ලංකා දේව ධර්ම ශාස්ත්‍රාලය මගින් පවත්වනු ලබන දේව ධර්මවේදී ඩිප්ලෝමා සහතිකය			
15.6 ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය මගින් පිරිනමනු ලබන ආගමික දැනුම පිළිබඳ ජාතික ධර්මාචාර්ය සහතිකය			

16.0 ගැසට් නිවේදනයේ 4.8 සහ 4.9 සඳහා හින්දු ධර්මය/ඉස්ලාම් ධර්මය, අයදුම්කරුවන් විසින් අදාළ කොටස සම්පූර්ණ කළ යුතුයි.

පාඨමාලාවේ නම	කාලසීමාව	සහතිකය ලැබූ දිනය

17.0 ගැසට් නිවේදනයේ 4.14 ඡේදයේ තාක්ෂණ අධ්‍යයනය පාඨමාලාවට අනුව ඇතුළත් වීමට අපේක්ෂිත අයදුම්කරුවන් රජයේ පිළිගත් ආයතනයකින් ශිල්පීය පාඨමාලාවක් හදාරා නිමකොට තිබේ නම් පහත සඳහන් කොටස සම්පූර්ණ කළ යුතුයි.

ශිල්පීය පාඨමාලාවේ නම	රජයේ ලියාපදිංචි අංකය හා වලංගු දිනය	පවත්වන ලද ආයතනය	කාල සීමාව	පාඨමාලාව සාර්ථක ලෙස නිමකර තිබේ ද?

දිනය: _____,

දිනය: _____,
05-356

18.0 ගැසට් නිවේදනයේ 4.18.1, 4.18.2 ඡේද අනුව බටහිර සංගීතය පාඨමාලාව ඉල්ලුම්කරුවන් අදාළ තොරතුරු ඇතුළත් කළ යුතුය.

පාඨමාලාව .....
බටහිර සංගීතය පිළිබඳ නිපුණතාවය

අනු අංකය	වර්ෂය	සහතිකය නිකුත් කළ ආයතනය	ප්‍රවීණතාව/සමත් පංතිය

19.0 *අයදුම්කරුගේ ප්‍රකාශය .–*

(i) මා විසින් ඉදිරිපත් කර ඇත්තේ එක් අයදුම් පත්‍රයක් පමණි. එක් ඉල්ලුම් පත්‍රයකට වඩා ඉදිරිපත් කළ විට මාගේ සියලුම ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප වන බව මම දනිමි. ඉල්ලුම් කරනු ලබන විද්‍යා පීඨයේ පුරප්පාඩු නොමැති විටක අදාළ පාඨමාලාව පැවැත්වෙන පුරප්පාඩු ඇති වෙනත් විද්‍යාපීඨයකට ඇතුළත් වීමට කැමැත්ත ප්‍රකාශ කරමි.

(ii) මා විසින් අයදුම්පතේ සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. ම විසින් සපයා ඇති තොරතුරු අසත්‍ය හෝ වැරදි බව හෙළි වුවහොත් මා තෝරා ගැනීමට නුසුදුස්සෙකු වන බවත්, තෝරා ගැනීමෙන් පසුව අසත්‍ය හෝ වැරදි බව හෙලි වුවහොත් මාගේ තෝරා ගැනීම අවලංගු වන බවත් මම දනිමි.

(iii) මා විශ්වවිද්‍යාල ප්‍රවේශයට අයදුම්කර නොමැති බවත්, විශ්වවිද්‍යාල ප්‍රවේශය ලබාගෙන නොමැති බවත්, විශ්ව විද්‍යාලයක/විශ්වවිද්‍යාල විද්‍යායතනයක/වෙනත් උසස් අධ්‍යාපන ආයතනයක ලියාපදිංචි වී නොමැති බවත්/ පාඨමාලාවක් හදාරමින් නොසිටින බවත් මෙයින් සහතික කරමි.

_____,
අයදුම්කරුගේ අත්සන.

දිනය:_____,

20. **පාසල්/පිරිවෙන් අපේක්ෂකයන් සම්බන්ධයෙන් විදුහල්පතිගේ/පිරිවෙන් අධිපති හිමිගේ ප්‍රකාශය**

මෙම අයදුම්කරු මෙම පාසලේ/පිරිවෙනේ ශිෂ්‍යයෙකු වශයෙන් අ. පො. ස. (සා. පෙ.) විභාගයට/හා අ. පො. ස. (උ. පෙ) විභාගයට/ප්‍රාචීන ප්‍රාරම්භ විභාගයට පෙනී සිටි බවත්, අයදුම්කරු විසින් ඉහත දක්වා ඇති විස්තර මාගේ දැනුමේ හැටියට නිවැරදි බවත් විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කර ඇති නිල ප්‍රතිඵල සටහන අනුව ..... වර්ෂයේ අ. පො. ස. (උ. පෙ) විභාගයේදී අයදුම්කරු ලබාගෙන ඇති /Z අගය ..... (අකුරෙන්) ..... බවත් සහතික කරමි.

_____,
විදුහල්පති/පිරිවෙන් අධිපති හිමිගේ
අත්සන හා නිල මුද්‍රාව.

විදුහල්පති/පිරිවෙන් අධිපති හිමිගේ නම :_____,
පාසලේ/පිරිවෙනේ නම හා ලිපිනය :_____,
දිනය :_____,

21. **පෞද්ගලික අපේක්ෂකයන් සම්බන්ධයෙන් ප්‍රකාශය**

විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කර ඇති නිල ප්‍රතිඵල සටහන් අනුව ..... වර්ෂයේ අ. පො. ස. (උ. පෙ.) විභාගයේ දී මා ලැබූ ඒකාබද්ධ ලකුණු / Z ලකුණ ..... (අකුරෙන්) ..... බව සහතික කරමි.

_____,
අයදුම්කරුගේ අත්සන.

මා ඉදිරිපිට දී අත්සන් කරන ලදී.

_____,
සාමදාන විනිශ්චයකාර තැනගේ අත්සන.
නම :
නිල මුද්‍රාව :

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පලකිරීම්

ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

මහෙස්ත්‍රාත් අධිකරණය - කන්තලේ

රාජසන්තක කරන ලද වාහන විකිණීම සඳහා ටෙන්ඩර් කැඳවීම

මෙම අධිකරණයේ පහත විස්තර සඳහන් වාහන ටෙන්ඩරයේ විකිණීම සඳහා මිල ගණන් මෙයින් කැඳවනු ලැබේ.

අදාළ වාහන මිලදී ගැනීමට අපේක්ෂා කරන්නන් තම මිල ගණන් මෙම අධිකරණය මගින් නිකුත් කරනු ලබන ටෙන්ඩර් ආකෘති පත්‍රයක් මගින් පමණක් එක් එක් වාහනය සඳහා වෙන වෙනම ඉදිරිපත් කළ යුතුය. එකී ටෙන්ඩර් පත් හා ටෙන්ඩර් කොන්දේසි ඇතුළත් විස්තර පත්‍රිකාව එක් වාහනයක් සඳහා රු. 100 ක ආපසු නොගෙවන හා රු. 1,000 ක ආපසු ගෙවන මුදලක් අධිකරණයේ කැන්පත් කිරීමෙන් පසු 2006.06.12 සිට 20 දක්වා සතියේ වැඩ කරන දිනයන්හි පෙ. ව. 10.00 සිට ප. ව. 4.00 දක්වා කාලය තුළ මෙම අධිකරණ කාර්යාලයෙන් ලබාගත හැකි. එකී කාලය තුළ අදාළ වාහන පරීක්ෂා කර බැලිය හැකි බවද දන්වමි.

තවද නිසි ලෙස සම්පූර්ණ කරන ලද මිල ගණන් ඇතුළත් ටෙන්ඩර් පත් 2006.06.21 දින ප. ව. 2.00 දක්වා භාරගනු ලබන බවද මෙයින් වැඩිදුරටත් දන්වමි.

විකිණීමට නියමිත වාහන

නඩු අංකය	*වාහන අංකය*	*වාහන වර්ගය*	
3283/03	26 ශ්‍රී 6513	ඉසුසු 250 ලොරි	01
6170/04	21-2272	බජාජ් ත්‍රීරෝද රථ	01යි

ආර්. එස්. ඒ. දිසානායක,
අතිරේක දිසා විනිසුරු.

2006 මැයි මස 05 වැනි දින,
කන්තලේ මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය
05-358

අනුරාධපුර මහෙස්ත්‍රාත් අධිකරණය

මෝටර් වාහන විකිණීම - අදාළ විස්තර හා කොන්දේසි

අධිකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ 08/2003 ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මේ සමඟ විස්තර සඳහන් කොට ඇති මෝටර් වාහන ටෙන්ඩර් කැඳවා විකිණීම සඳහා කටයුතු කරනු ලැබේ.

කොන්දේසි :

01. මෝටර් වාහන මිලදී ගැනීම සඳහා ඉදිරිපත් කරනු ලබන මිල ගනන් අදාළ ආකෘතිපත්‍රයක් මගින්ම අයදුම් කළ යුතු අතර, එක් වාහනයක් සඳහා එක් අයදුම්පත්‍රය බැගින් ඉදිරිපත් කළ යුතුවේ. නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍රයේ මුල් පිටපත සහ එහි අනුපිටපත වෙන වෙනම කවරවල බහා එම කවර දෙකෙහි මුල් පිටපත සහ අනුපිටපත යනුවෙන් සඳහන්කර 9 x 4 ප්‍රමානයේ එක් කවරයක බහා මුද්‍රා තැබිය යුතු අතර, එම ලියුම් කවරයේ වම් කෙලවරේ උඩ ටෙන්ඩර් කැඳවීම සඳහා මිල ගණන් යනුවෙන් සඳහන් කළ යුතුය. (අදාළ අයදුම්පත්‍ර මෙම කාර්යාලයෙන් ලබාගත හැක.)

02. ටෙන්ඩර් අයදුම්පත් සඳහා ආපසු ගෙවනු නොලබන රු. 100 ක් වූ ටෙන්ඩර් ගාස්තුවක් හා ආපසු ගෙවනු ලබන ඇප තැන්පත් මුදල් වශයෙන් රු. 5000 ක් ගෙවිය යුතු අතර, ටෙන්ඩර් අයදුම්පත් සමඟ මුදල් ගෙවන ලද රිසිට් පතෙහි පිටපතක් ද අමුනා එවිය යුතුය.

03. නිසි ලෙස සම්පූර්ණ කරනු ලැබූ මිළ ගනන් අඩංගු අයදුම්පත්‍ර 2006.06.30 වැනි දින දහවල් 12.00ට පෙර ලැබෙනසේ, "රෙජිස්ට්‍රාර්, මහෙස්ත්‍රාත් අධිකරණය, අනුරාධපුර" යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් හෝ අදාළ ලිපිනයට අතින් හෝ ගෙනැවිත් භාර දිය යුතුය. නියමිත වේලාවට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. 2006.05.26 දින සිට 2006.06.28 දින දක්වා සඳුදා, බදාදා හෝ සිකුරාදා යන දින තුනෙන් එකකදී කාර්යාලීය වේලාව තුළ අධිකරණයේ රෙජිස්ට්‍රාර්ගේ අවසරය මත වාහන පරීක්ෂා කර බැලිය හැක.

05. අයදුම්පත්‍රයේ තොරතුරු පැහැදිලිව සටහන් කර තැබිය යුතුවේ. විශේෂයෙන් මිළගණන් දක්වන තීරයේ එම මිල ගණන් පැහැදිලිව සටහන් කර එවිය යුතු අතර, ඒවා කපා නැවත ඒ මත ලිවීම හෝ වෙනස් කිරීම් නොකල යුතු අතර, විකෘති වී ගිය මිළ ගණන් සහිත අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

06. ටෙන්ඩර් අයදුම්පත් ලබා ගැනීම සඳහා මුදල් ගෙවනු ලබන අය නමින් රිසිට්පත් නිකුත් කරනු ලබන අතර එම රිසිට්පත් නිකුත් කළ අයගේ නමින් පමණක් ටෙන්ඩර් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුවේ. එසේ නොවන ටෙන්ඩර් අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

07. 2006.06.30 දින ප.ව. 1.00ට ටෙන්ඩර් විවෘත කරනු ලබන අතර, ඒ සඳහා ඔබ හෝ ඔබ විසින් බලය පැවරූ නියෝජිතයකු අනිවාර්යයෙන් සහභාගි විය යුතුය.

08. එක් එක් වාහනය සඳහා ලැබී ඇති මිළ ගණන් ටෙන්ඩර් විවෘත කරනු ලබන අවස්ථාවේදීම ප්‍රකාශ කරනු ලැබේ. ලැබී ඇති මිළ ගණන් ටෙන්ඩර් මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු ලබන අතර, වැඩිම මිළ ගණන් ඉදිරිපත් කර ඇති (තක්සේරු මිළ හෝ ඊට වැඩියෙන්) ටෙන්ඩර්කරුට වාහනය අලෙවි කිරීමට කටයුතු කරනු ලැබේ. කිසියම් අන්දමකින් සමාන මිළ ගණන්, දෙදෙනකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් ඉදිරිපත් කර තිබුනහොත් කුසපත් ඇදීමෙන් හෝ වෙනත් ක්‍රමයකින් වාහනය මිළට ගැනීමට හිමිකම් ලබන ටෙන්ඩර්කරු තෝරනු ලැබේ. තක්සේරු මිලට අඩුවෙන් මිළ ගණන් ඉදිරිපත් කර ඇති අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

09. සාර්ථක ටෙන්ඩර්කරුට ලිඛිතව ඒ පිළිබඳව දක්වන අතර, ටෙන්ඩරය පිළිගත් බව දැනුම්දීමෙන් පසු එම ටෙන්ඩර්කරුවන් විසින් අදාළ වාහනයේ වටිනාකම මුදලින් ගෙවා එදිනම වාහනය අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතුය. ඉහත පරිදි ක්‍රියා නොකරන සහ වටිනාකම් ගෙවීම් ප්‍රතික්ෂේප කරන ටෙන්ඩර්කරුවන්ගේ තැන්පත් මුදල් ආපසු ගෙවනු නොලැබේ.

10. වාහන වල පූර්ණ අයිතිය මහෙස්ත්‍රාත් සතුවන හෙයින් මිලදී ගත් අයගේ නමින් අයිතිය පවරා දීමට අවශ්‍ය කටයුතු ඉටු කර දෙනු ලැබේ.

11. මෙම වාහන විකිණීම සම්බන්ධ පූර්ණ අයිතිය මහෙස්ත්‍රාත් සතුවන බව වැඩිදුරටත් දැනුම් දෙමි.

වසන්ත ජිනදාස,
මහෙස්ත්‍රාත් - අනුරාධපුර.

2006 අප්‍රේල් මස 24 වැනි දින,
අනුරාධපුර මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

ටෙන්ඩර් කැඳවා විකිණීමට නියමිත රථ වාහන

අනු අංකය	*නඩු අංකය*	*වාහන අංකය*	*විස්තරය*
(1)	-	47-2422	අබලන් ලොරි රථය
(2)	-	41 ශ්‍රී 1532	අබලන් ලොරි රථය

05-313

බඩු බාහිරාදිය විකිණීම්

මහේස්ත්‍රාත් අධිකරණ – යාපනය

අධිකරණය මගින් රාජ්‍ය සන්තක කරන ලද හා මෙතෙක් අයිතිවාසිකම් පවරනු නොලැබූ භාණ්ඩ විකිණීම

යාපනය මහේස්ත්‍රාත් අධිකරණයේ පහත සඳහන් නඩුවලට අදාළ රාජ්‍ය සන්තක කරන ලද හා මෙතෙක් අයිතිවාසිකම් පවරනු නොලැබූ පහත සඳහන් කර ඇති භාණ්ඩ මෙම අධිකරණ භූමිය තුළ තබා 2006.06.24 දින පෙරවරු 9.00 ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට ඇත.

02. මෙහි පහත සඳහන් කරනු ලැබූ කිසියම් භාණ්ඩයක් සඳහා කිසිවෙකු අයිතිය පවරනු ලබන්නේ නම් තම ඉල්ලීම වෙන්දේසිය පටන්ගැනීමට පැය භාගයකට පෙර ඉදිරිපත් කල යුතුය.

03. අධිකරණයේ රෙජිස්ට්‍රාර්ගේ අවසරය මත වෙන්දේසිය පටන්ගැනීමට පැය භාගයකට පෙර මහජනයාට මෙම භාණ්ඩ නැරඹිය හැක.

04. ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට තබා ඇති කිසියම් භාණ්ඩයක වටිනාකමට මිළ නොලැබෙනම් වෙන්දේසියේ දී එම භාණ්ඩ ආපසු ලබාගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතිනු ඇත.

05. විකුණනු ලැබූ භාණ්ඩවලට එවෙලෙහිම මුදල් ගෙවා භාණ්ඩ ඉවත් කල යුතුයි සෑම ගෙවීමක්ම මුදලින්ම ගෙවිය යුතු වන අතර චෙක්පත් හාර ගනු නොලැබේ.

ආර්. ටී. විග්නරාජා,
මහේස්ත්‍රාත් යාපනය.

2006 අප්‍රේල් මස 27 වැනි දින.

අනු අංකය	නඩු අංකය	භාණ්ඩ විස්තර	ගණන
01	ඒ/156/05	සුපර් කප් මෝටර් සයිකල්	01
02.	ඒ/311/03	මෝටර් සයිකල්	01
03.	ඒ/229/04	කුතුවිලකු (පහන)	02
04.	ඒ/217/05	අත් ඔරලෝසු	06
05	ඒ/420/05	කැමරා එම චාජර, රූපවාහිනී යන්ත්‍ර	01
	ඒ/420/05	මහන මැෂින්	07
	ඒ/420/05	මෝටර්	19
06.	ඒ/422/05	කටු කම්බි රෝල්	01
	ඒ/422/05	විදුලි පංකා	01
	ඒ/422/05	රූපවාහිනී යන්ත්‍ර	01
07.	ඒ/426/05	පා පැදි	15
08.	ඒ/459/05	රූපවාහිනී යන්ත්‍ර	01
	ඒ/459/05	අත් ඔරලෝසු	
	ඒ/459/05	මෝටර් සයිකල්	02
09.	9020	දොරවල්	01
10.	ඒ/128/03	මෝටර් සයිකල්	01
11.	988	ගුවන්විදුලියන්ත්‍ර	01
12.	බී/284/99	අත් ඔරලෝසු	01
13.	බී/17/03(7210)	රූපවාහිනී යන්ත්‍ර ක්‍රියා විරහිත	01
14.	බී/18/03/(7209)	රූපවාහිනී යන්ත්‍ර ක්‍රියා විරහිත	01
15.	11734	රේඩියෝ(බපල්)	04
16.	1298	ගුවන්විදුලියන්ත්‍ර	01
17.	බී/109/01	පාපැදි	01
18.	1714	පාපැදි	01
19.	1043	පාපැදි	02
20.	4385	පාපැදි	01
21.	8174	පාපැදි	03
22.	බී/278/99	නලලිං පොම්ප හිස් බෝතල් යකඩ බැරල් ප්ලාස්ටික් කෑන් මුට්ටි තඹ බට	01
05-333			

නොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

නාත්තන්ඩිය ප්‍රාදේශීය මහලේකම් කොට්ඨාසය

2006 ජූලි මස 01 වැනි දින සිට 2007 ජූනි මස 30 වැනි දින දක්වා කාලය සඳහා රා තැබෑරුම් රේන්ද විකිණීම 2006 ජූලි මස 01 වැනි දින සිට 2007 ජූනි මස 30 වැනි දින දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම් සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රයේ* පල වී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසි හා සෑම සුරාබදු බලපත්‍රයක්ම අදාළව එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක්ම ඕනෑම ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර, පහත සඳහන් උපලේඛනයෙහි දක්වා ඇති ටෙන්ඩර් තැන්පත් මුදල් තැන්පත් කළ බවට ලබාගත් කුවිතාන්සියක් හා අදාළ ටෙන්ඩර්යේ සඳහන් මිල ප්‍රමාණයෙන් යටත් පිරිසෙයින් 15% ට ලබාගත් වටිනාකම් සහතියක් ද ඇමිණිය යුතුය.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ සෑම ටෙන්ඩරයක්ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙළවරෙහි " අංක ..... දරන..... රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් පත්‍රය " යනුවෙන් පහත සඳහන් උපලේඛනයෙහි සඳහන් පරිදි තැබෑරුමේ නම සහ අංකය සඳහන් කොට 2006.06.06 වැනි දින පෙ. ව. 10.00 ට පෙර නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම්ට ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. නැතහොත් එම වේලාවට පෙර නාත්තන්ඩිය ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය.

04. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම 1982.08.20 වැනි දින පළ වී ඇති අංක 207 ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රයේ* දැක්වෙන රා රේන්ද කොන්දේසි වලට අනුකූල විය යුතුය.

05. 2006.06.06 වැනි දින පෙ. ව. 10.00 ට ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ සියලුම ටෙන්ඩර් කරුවන් නාත්තන්ඩිය ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතුය.

06. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් නැවත විකිණීම 2006.06.20 වැනි දින පෙ. ව. 10.00 ට සිදු කරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම ගැසට් නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතුය.

07. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර නාත්තන්ඩිය ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයෙන් ලබාගත හැකිය.

එස්. එම්. එල්. විනදසිරි,
ප්‍රාදේශීය ලේකම්,

නාත්තන්ඩිය.
මගේ අංකය : නා/ආ/05,
2006 මැයි මස 04 වැනි දින,
ප්‍රාදේශීය මහලේකම් කාර්යාලය,
නාත්තන්ඩිය.

උපලේඛනය

අනුක්‍රමික අංකය	කොට්ඨාසය	ගම	ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනය හා වේලාව	ටෙන්ඩර් තැන්පත් මුදල රු. ශ.
01.	නාත්තන්ඩිය	මුදුකටුව	2006.06.06 වැනි දින පෙ. ව 10.00	1000. 0
02.	එම	කටුනේරිය	එම	1000. 0

05-370

ආණ්ඩුවේ නොවන දැන්වීම්

ඇටෝර්නි බල පත්‍රය අවලංගු කිරීම

බණ්ඩාරගම බොල්ගොඩ "මෙත්සිත" හි පදිංචි මාපටුනගේ මංගල පද්මසිරි පෙරේරා වන මා විසින් 1991.11.22 දින අත්සන් කරන ලද 123 කාණ්ඩයේ 90 පත්ඉරුවේ 311 දිනපොත් අංකය යටතේ 1992.01.13 දින රෙජිස්ට්‍රාර් ජෙනරාල් කාර්යාලයේ ලියාපදිංචි කරන ලද ඇටෝර්නි බලපත්‍රය මගින් බණ්ඩාරගම බොල්ගොඩ "මෙත්සිත" හි පදිංචි මාපටුනගේ සුනිල් අභයසිරි පෙරේරා යන අයට පවරා දුන් මාගේ ඇටෝර්නි බලය අද දින සිට අවලංගු කොට ප්‍රත්‍යාදිෂ්ට කරන බව මෙයින් දැනුම් දෙමි.

එම්. එම්. පද්මසිරි පෙරේරා.

2006 ක් වූ අප්‍රේල් මස 26 වැනි දින.
04-362

වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

සීමාසහිත සම්පත් බැංකුව

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ විකුණුම් නිවේදනය

ඉන්දිවරි ඇක්වා (ප්‍රයිවෙට් ලිමිටඩ්) ගිණුම් අංකය : 0098 1000 0607.

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2005 පෙබරවාරි 22 වැනි දින යෝජනා කොට සම්මත කරගනු ලැබ 2005.12.09 දින රජයේ *ගැසට් පත්‍රයේ* ද 2005.11.12 වැනි දින දිවයින අයිලන්ඩ් සහ තිනකුරල් යන දිනපතා පුවත්පත් වලද පළ කරන ලද යෝජනා සම්මුතියට අනුව ඇමරිකානු ඩොලර් හාර ලක්ෂ හතලිස් අට දහස් හත්සිය හතලිස් අටයි ශත විසිපහක (ඇ. ඩො. 448,748.25) මුදල සමග තවත් ඇමෙරිකානු ඩොලර් දෙලක්ෂ අසූතුන් දහසක (ඇ. ඩො. 283,000) මුදල් සඳහා ලන්ඩන් ඉන්ටර් බැංකුව මගින් පිරිනමන අනුපාතයට වැඩි, වසරකට සියයට දෙකයි දශම හත (2.7%)බැගින් 2004 දෙසැම්බර් මස 10 වැනිදා සිට වෙන්දේසි දින තෙක් තවදුරටත් පොලී මුදල ද සමග ප්‍රචාරක වියදම් හා වෙනත් අයකිරීම් වෙනොත් ඒවා ද සමග, එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනවින් විස්තර කොට ඇති දේපල හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු ඩන්ස්ටන් කෙලාට් විසින් 2006.06.20 දින පෙ. ව. 11.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ උතුරු පිටිගල් කෝරළේ, ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ උතුරු මුන්නේස්වරම් පත්තුවේ සිත්තමඩම පිහිටි ශාන්ත මාටින් වත්ත නැමති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එම්. බී. කලාතේගම විසින් සාදන ලද 1994 නොවැම්බර් 14 දාතම හා අංක 724 දරන පිඹුරේ නිරූපිත, ලොට් 1 වශයෙන් ලකුණු කොට දක්වා ඇති හලාවත ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්ඉරුව සී 143/39 හි ලියාපදිංචි කොට ඇති එකී අංක 724 පිඹුරුට අනුව, උතුරට: එකී පිඹුරේ ජාතික පශු සම්පත් සංවර්ධන මන්ඩලයට අයත් වත්තද, නැගෙනහිරට: එම ඉඩමේ ම කොටසක් ද, දකුණට: එකී පිඹුරේ නිරූපිත පාර ද සහ බටහිරට: එම ඉඩමේ ම කොටසක් ද මායිම් වන, ප්‍රමාණයෙන් අක්කර දෙකයි රූඩ් තුනයි පර්චස් දෙකක් (අක් 2 රූඩ් 3 පර් 2) වන බෙදා වෙන් කොට සීමා නිර්ණය කළ ඉඩම එහි පිහිටි පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ අනෙකුත් සියලුම දේ සමගය. .

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
සමාගමේ ලේකම්.

05-391

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 18/68740/වයි 18/651.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ* 2004.11.25 දින *ගැසට් පත්‍රයේ* සහ 2005.07.16 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොලිය, වියහියදම් හා යටෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස, මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපල හා භූමිය, කුරුණෑගල මල්කඩුවාව වටරවුම් පාර, ගම්මඩුගොල්ල මාවතේ, අංක 15 හි බලයලත් වෙන්දේසිකාර බී. එම්. ඒ. විජේතිලක මහතා විසින් එම දේපල පිහිටි ස්ථානයේ දී 2006.06.24 වැනි දින පස්වරු 1.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුලියාපිටිය ප්‍රාදේශීය සභා සීමාවන් තුළ දියකලමුල්ල පිහිටි කහටගහමුලවත්ත නොහොන් මහගෙදර වත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ආර්. ඒ. චන්ද්‍රරත්න විසින් සැකසුණු 1992.06.03 දින හා අංක 1534/92 දරන පිඹුරේ කැබලි අංක 21 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 0 පර්. 20 ක්වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමග වේ. මෙම ඉඩම් කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක කේ 148/51 යටතේ ලියාපදිංචි කොට ඇත.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
වැඩ බලන සාමාන්‍යාධිකාරී.

2006 මැයි මස 11 වැනි දින,
ගාලු පාරේ, අංක 269,
කොළඹ 03.
05-396/3

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 18/69137/වයි 18/712.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ* 2004.09.24 දින *ගැසට් පත්‍රයේ* සහ 2005.05.26 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොලිය, වියහියදම් හා යටෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස, මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපල හා භූමිය, කුරුණෑගල මල්කඩුවාව වටරවුම් පාර, ගම්මඩුගොල්ල මාවතේ, අංක 15 හි බලයලත් වෙන්දේසිකාර බී. එම්. ඒ. විජේතිලක මහතා විසින් එම දේපල පිහිටි ස්ථානයේ දී 2006.06.24 වැනි දින මධ්‍යාහ්න 12.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාශයේ තලම්මැහැර පිහිටි දෙල්ගහමුල වත්ත *හෙවන්* ඉන්න වත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ආර්. ඒ. චන්ද්‍රරත්න විසින් සැකසුණු 1999.01.09 දින හා අංක 1850 දරන පිඹුරේ කැබලි අංක 1 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0 රූ, 0 පර්. 33 ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමග වේ. මෙම ඉඩම් කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක එල් 171/114 යටතේ ලියාපදිංචි කොට ඇත.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
වැඩ බලන සාමාන්‍යාධිකාරී.

2006 මැයි මස 11 වැනි දින,
ගාලු පාරේ, අංක 269,
කොළඹ 03.
05-396/2

කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් - අව්ස්සාවේල්ල ශාඛාව

(හිරුණි කන්ස්ට්‍රක්ෂන්ස්) 2006.06.01 දින පස්වරු 12.30 ඉහත සඳහන් වෙන්දේසියේ 2006.05.11 වැනි දින *ගැසට් පත්‍රයේ* පළ වූ දැන්වීම පහත සඳහන් අයුරින් සංශෝධනය විය යුතුයි.

ඒ අනුව විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2006.05.11 වැනි දින *රජයේ ගැසට් පත්‍රය*, ලංකාදීප සහ අයිලන්ඩ් පත්‍ර ද බලන්න.

වැඩි විස්තර සඳහා විමසන්න :

එල්. බී. සේනානායක- සාම විනිසුරු,
බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු, තක්සේරුකරු සහ
උසාවි කොමසාරිස්, කොළඹ වාණිජ මහාධිකරණ සහ
දිසා අධිකරණය, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
රාජ්‍ය බැංකු සහ වාණිජ බැංකු,
අංක 99, උසාවිය පාර, කොළඹ 12.
දුරකථන/ෆැක්ස් අංකය : 2445393.

2006 මැයි මස 09 වැනි දින,
කළමණාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්,
අංක 76, කොළඹ පාර, අව්ස්සාවේල්ල.
දුරකථන අංක : 036-2231303 - 4 036-2231301
ෆැක්ස් අංකය : 036-2231302.
05-340

මහජන බැංකුව – තිඹිරිගස්යාය ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකිණීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිට කෝරළේ පල්ලේ පත්තු මහරගම ප්‍රාදේශීය සභා සීමාව තුළ ගංගොඩවිල පිහිටි "අඹගහකුඹුර" සහ "ලන්සියාදෙනිය ඕවිට" යනුවෙන් හඳුන්වනු ලබන බලයලත් මිනින්දෝරු සී. ඒ. විතාරණ විසින් සාදන ලද 1992.05.30 දින සහ 9224 අංක දරන පිඹුරේ ලොට් 2 සහ ලොට් 4 (වටරවුම සඳහා වෙන් කර ඇත) සහ බලයලත් මිනින්දෝරු ඩී. ජේ. නානායක්කාර විසින් සාදන ලද 1970.11.25 දින සහ 1523 දරන පිඹුරේ ලොට් 1 ඊ (අඩි 10 පාර සඳහා වෙන් කර ඇත) වශයෙන් නිරූපිත බෙදා වෙන්කළ ඉඩම් කොටස වරිපනම් අංක 19/4, 1 වැනි පටුමග ගංගොඩවිල.

ඉඩම ප්‍රමාණයෙන් ලොට් 2- අ. 0 රූ. 0 පර්චස් 6. 50 ලොට් 4- අ. 0 රූ, 0 පර්චස් 2.10 (වටරවුම සඳහා වෙන්කර ඇත) ලොට් 1 ඊ- අ. 0, රූ. 0 පර්චස් 4.9 (අඩි 10 ක පාර සඳහා වෙන්කරවා ඇත)

එහි පිහිටි ගොඩනැගිලි සහ සියලු දේද මාර්ග අයිතිය ද සමග මහජන බැංකුව විසින් අප වෙත පවරන ලද බලතල අනුව 2006 ජූනි මස 14 වැනි බදාදා පෙ. ව. 10.30 ට ආරම්භව පිහිටි ස්ථානයේ යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා කරුණාකර 2005.01.07 දින දරන *රජයේ ගැසට් පත්‍රය* ද 2004.11.24 දින දරන ඩේලි නිවිස්, දිනමිණ පුවත් පත් ද බලන්න.

ගෙවීමේ ක්‍රමය.– මිල කීන්දුවනවාත් සමගම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් වටිනාකම් මුදලින් ගෙවීමට සිදුවේ.

1. ගැණුම් මිලෙන් 10%;
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු බද්ද පළාත් අධිකාරි බද්ද ගැණුම් මිලෙන් 1%ක්;
3. 2 1/2%ක් වන (සියයට දෙකහමාරක් වන) වෙන්දේසිකරුගේ කොමිස් මුදල;
4. ලිපිකරුගේ හා ඝෝෂකගේ ගාස්තුව රු. 500යි;
5. විකිණීමේ පිරිවැය හා වෙනත් අයකිරීම් වෙනොත් ඒවා;
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තුව.

ගැණුම් මිලෙන් ඉතිරි 90% මුදල වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත කොළඹ 01, ආදිපාද වීදිය, අංක 11 මහජන බැංකුව (බස්නාහිර කලාප) සහකාර සමාන්‍යාධිකාරි වෙත ගෙවිය යුතු ය. දුරකථන අංක :2387068, 2393678.

නිමිකම් ඔප්පු හා වෙනත් අදාල ලිපිලේඛන පූර්වෝක්ත ලිපිනයෙන් ලබාගත හැකිය. ඉහත සඳහන් පරිදි එකී මුදල දින 30ක් ඇතුළත ගෙවනු නොලැබුවේ නම් ගැණුම් මිලෙන් දැනටමත් ගෙවා ඇති 10% (සියයට දහය) අහිමි කොට දේපල නැවත විකිණීමේ අයිතිය බැංකුව සතුය.

ෂොක්මන් සහ සමරවික්‍රම,
ශ්‍රී ලංකාවේ පිළිගත් පුරෝගාමී
වරලත් වෙන්දේසිකරුවෝ සහ තක්සේරුකරුවෝ.

ප්‍රධාන කාර්යාලය :
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය :081-2227593
දුරකථන/ෆැක්ස් :081-2224371

නගර කාර්යාලය :
අංක 55ඒ, ධර්මපාල මාවත,
කොළඹ 3.
දුරකථන අංකය :2441761
දුරකථන/ෆැක්ස් :2448526
ඊමේල් : samera@sri.lanka.net

05-359

මහජන බැංකුව- නාත්තන්ඩිය ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

පුත්තලම හෙට්ටිවීදියේ අංක 116 දරන ස්ථානයේ පිහිටි නිවසක් සහිත වටිනා දේපළ, විශාලත්වය අක්කර 00, රූඩ් 00, පර්චස් 11.8 මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ ම විසින් 2006.06.14 දින පෙ. ව. 11.00ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

රජයේ ගැසට් පත්‍රයේ 2005.12.23 දින ද, දිනමිණ පුවත්පතේ 2006.02.10 දිනදී ද ඩේලිනිවුස් පුවත්පතේ 2006.02.13 දින ද පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

දේපලට පිවිසීම .– පුත්තලම ප්‍රධාන තැපැල් කාර්යාලය ඉදිරිපිටින් දකුණට ඇති කුරුණෑගල පාරේ මීටර් 150ක් පොස්ට් දකුණට හැරී මීටර් 600ක් ඉදිරියට ගිය විට පාරේ දකුණු පස දේපළ පිහිටා ඇත.

ගෙවීමේ ක්‍රමය.– වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදල් ප්‍රමාණයන් මුදලින් ගෙවිය යුතුය.

01. ගැනුම් මිලෙන් 10%;
02. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%;
03. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 21/2%;
04. ලිපිකරු හා නිවේදන ගාස්තු වශයෙන් රු. 500ක් ;
05. විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල;
06. විකුණුම් සහතික සඳහා මුද්දර ගාස්තු.

ගැනුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත නාත්තන්ඩිය පිහිටි මහජන බැංකුව, - හලාවත ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ ප්‍රාදේශීය කළමණාකරු වෙත ගෙවිය යුතුය.

දුරකථන අංක 032 – 2253300/ 032-2253301 ෆැක්ස් 032-2255247

හිමිකම් ඔප්පු හා වෙනත් අදාළ විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැනුම් මිලෙන් 10%ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඩබ්ලිව්. ජී. සී. පෙරේරා,
වෙන්දේසිකරු සහ තක්සේරුකරු,
උසාවි කොමසාරිස්.

අංක 22, ප්‍රනාන්දු පාර,
මීගමුව.
දුරකථන අංක: 031 – 2223219
031 –2277518

05-369

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 1/28367/සීබී9/650.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ* 2005.08.05 දින *ගැසට් පත්‍රයේ* සහ 2005.09.26 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යටෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස, මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපල හා භූමිය, කැස්බෑව, වලව්වත්ත, අංක 228 ඒ, ධම්මිකා හි බලයලත් වෙන්දේසිකාර ඒ. එස්. ලියනගේ මහතා විසින් එම දේපල පිහිටි ස්ථානයේ දී 2006.06.29 වැනි දින පෙරවරු 10.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව ප්‍රාදේශීය සභා සීමාවන් තුළ දෙමළදූව පිහිටි වල්ගොන්නගහවත්ත නමැති ඉඩමේ බලයලත් මහින්දෝරු එච්. ලාල් ගුණසේකර විසින් සැකසුණු 1991.12.08 දින හා අංක 4016 දරන පිඹුරේ කැබලි අංක 2 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0 රූ. 0 පර්. 20 ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමග වේ. මෙම ඉඩම් කොටස කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක එම් 1395 /278 යටතේ ලියාදිංචි කොට ඇත.

තවද, බටහිර මායිම මහින් වැටී ඇති මාර්ග අයිතිය ද සමග වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
වැඩ බලන සාමාන්‍යාධිකාරී.

2006 මැයි මස 11 වැනි දින,
ගාලු පාරේ, අංක 269,
කොළඹ 03.
05-396/1

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : පීපී/03/01132/ඩී 3/971.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ* 2003.12.05 දින *ගැසට් පත්‍රයේ* සහ 2005.07.12 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යටෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස, මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපල හා භූමිය, කුරුණෑගල, මල්කඩුවාව වටරවුම් පාරේ, ගම්මඩුගොල්ල මාවතේ අංක 15 හි බලයලත් වෙන්දේසිකාර බී. එම්. ජී. විජේතිලක මහතා විසින් එම දේපල පිහිටි ස්ථානයේ දී 2006.06.24 වැනි දින පෙරවරු 9.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

කැගල්ල දිස්ත්‍රික්කයේ, අවිස්සාවේල්ල ලියාපදිංචි කිරීමේ කොට්ඨාශයේ, රුවන්වැල්ල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ වහරක පිහිටි ඇල ඉස්මත්තේ හේන නමැති ඉඩමේ බලයලත් මහින්දෝරු ජී. එල්. විජේවර්ධන විසින් සැකසුණු 1999.08.31 දින හා අංක 95/99 දරන පිඹුරේ කැබලි අංක 1 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0 රූ. 3 පර්. 18ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමග වේ. මෙම ඉඩම අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක එස් 149/68 යටතේ ලියාපදිංචි කොට ඇත.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
වැඩ බලන සාමාන්‍යාධිකාරී.

2006 මැයි මස 11 වැනි දින,
ගාලු පාරේ, අංක 269,
කොළඹ 03.
05-396/4

සීමාසහිත සෙලාන් බැංකුව – තිස්සමහාරාම ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ගිණුම් අංකය - 0370 - 03003903 - 001.

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ මාගම් පත්තුවේ දකුණු රංකෙළිය පිහිටි බලයලත් මහින්දෝරු සී. එස්. ජයවර්ධන විසින් සාදන ලද 1997.08.31 දිනැති අංක 581 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන පතිරත්නගම හෙවත් රංකෙළිය කැබලි අංක 122262-12273 නමැති ඉඩමේ කැබලි අංක කේ 1 ලකුණු කළ බෙදා වෙන්කරන ලද ඉඩම් කොටස ප්‍රමාණයෙන් අක්කර දෙකයි පර්චස් තුනයි දශම පහයි හතරක් (අ. 2, රූ. 0, පර්. 3.54) විශාල ඉඩම.

මෙම දේපල තිස්සමහාරාමයේ පදිංචි විරිත්ත මුල්ල ගමගේ සුමනසේන යන අය බන්ධනදායි වශයෙන් සීමාසහිත සෙලාන් බැංකුව වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

ඉහත සඳහන් දේපල 2006 ජුනි මස 20 වැනි දින පස්වරු 2.00 ට එම දේපල පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ඉඩමට ජිවිසීම්.– තිස්සමහාරාම බස් නැවතුම් පොලේ සිට කිරිත්ද පාරේ. කි. මී. 05ක් ගොස් හමුවන රන්කෙළිය හන්දියෙන් දකුණට ඇති රන්කෙළිය පාරේ මීටර් 600ක් ඉදිරියට ගියවිට අදාල ඉඩම පිහිටා ඇත. විශාල ඉඩමක් වූ පතිරතනගම නම් වූ ඉඩමේ කොටසක් ලෙස මෙය සඳහන් වේ.

යෝජනා සම්මුති දැන්වීම රජයේ *ගැසට් පත්‍රයේ* 2006.03.10 වන දින ද ලංකාදීප සහ ඩේලිමිරර් පත්‍රයේ 2006.02.17 වන දින ද සහ විරකේසරී පත්‍රයේ 2006.02.23 වැනි දින ද පළ වී ඇත.

ගෙවීමේ ක්‍රමය.– සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසි අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

(1) ගැණුම් මිලෙන් 10%ක් (සියයට දහයක්), (2) පලාත් අධිකාරියයට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1%ක් වන පළාත් අධිකාරි බද්ද (සියයට එකක්), (3) වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), (4) නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, (5) ලිපිකරු සහ ඝෝෂක වේතන රු. 500, (6) සියලුම ප්‍රචාරක වියදම් ද ගැණුම් මිලෙන් ඉතිරි 90% ද විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත සීමාසහිත සෙලාන් බැංකුවට ගෙවා නිම කළ යුතු ය.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. සහකාර සාමාන්‍යාධිකාරී (නීති), සීමාසහිත සෙලාන් බැංකුව, අංක 90, ගාලු පාර, කොළඹ 03

දුරකථනය 011-2456258, 2456263, 2456284.

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස් තක්සේරුකරු.

ටී. එන්. එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත, කොළොන්නාව.
දුරකථන අංක 011-2696155, 011-2572940.
05-392

ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධන කරන ලද ලංකා බැංකු ආඥා පනතේ (397) අධිකාරය හා එහි සංශෝධනවල 22 වැනි වගන්තිය යටතේ විකිණීම පිළිබඳව දැන්වීම

සිංගප්පූර් සෙන්ටර් හි තනි අයිතිකරු – ජී. එච්. ඩී. එස්. ගුණතුංග මහතා විසින් ලංකා බැංකුව වෙත උකස්කරන ලද දේපල

ලංකා බැංකු ආඥා පනතේ 19 වැනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලදුව 2004.10.29 දිනැති අංක 1365 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* හා 2004.10.18 දිනැති දිනමිණ, ඩේලි නිව්ස් සහ තිනකරන් යන පුවත්පත් වල පළකරන ලද යෝජනා සම්මුතිය ප්‍රකාර විකිණීමේ දිනය තෙක් ලැබිය යුතු ශේෂ මුදල, පොළිය, වියදම් සහ එකී ආඥා පනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපල හා පරිශ්‍ර පිහිටි ස්ථානයේදී එම දේපල ඉදිරියෙන් දක්වා ඇති විලොවන්හි දී, කොළඹ 03, ධර්මපාල මාවත, අංක 55 ඒ දරන ස්ථානයේදී පදිංචි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම වෙන්දේසිකරුවන් විසින් 2006.06.17 වැනි දින ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

උපලේඛනය

දේපල I - පෙ. ව. 11.00

(අ) මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ. යටිනුවර ගහපළාතේ, පෑලව පිහිටි හිරිවානගොඩහේන, දැන් වත්ත නමින් වූ ඉඩමෙන් බලයලත් මහින්දෝරු ජී. එම්. කේ. බී. මාවලගෙදර මහතා විසින් සාදන ලද 1999.08.22 වැනි දිනැති 1510 අංක දරන පිඹුර අනුව රූඩ් එකයි පර්චස් දහඅටයි දශම නවයයි හතර (අ. 0, රූ. 1, පර්. 18.94) වපසරියෙන් යුතුව එකී ඉඩමෙන් බෙදා වෙන් කරන ලද යටෝක්ත පිඹුරේ ලොට් 1 ලෙස සලකුණු කර ඇති හා විස්තර කර ඇත්තාවූ ද, උතුරට: නිවසට යන පාර නැගෙනහිරට: ෂූ. පී. ජයරත්න විසින් හිමිකම් කියන හිරිවානගොඩ හේන දැනට වත්ත හා යටොක්ත ඉඩමේ ඉතිරි කොටසකි. දකුණට එකී ඉඩමේ ඉතිරි කොටසකි. උතුරට: ජී. එස්. සෝමරත්න හිමිකම් කියන 718 පිඹුරේ ලොට් 2 යන මෙකී මායිම් තුළ පිහිටි ඉඩම හා ඉඩම තුළ වූ සෑම සියලු දේ ම වේ. මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී. 397/232 පත්ඉරුවේ ලියාපදිංචි කර ඇත.

දේපල II - ප. ව. 1.30

(ආ) මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ යටිනුවර, ගහපළාත යටිනුවර ප්‍රාදේශීය සභා සීමාව තුළ කොබ්බෑකඩුව ග්‍රාමය පිහිටි ගෙටතලේවත්ත (ඔප්පුව අනුව ගේතලේ වත්ත) නම් වූ ඉඩම සඳහා බලයලත් මහින්දෝරු සී. ඩබ්. විජේවර්ධන මහතා විසින් සාදන ලද 1994 අගෝස්තු මස 12 වැනි දිනැති 4954 අංක දරන පිඹුර ප්‍රකාර එකී ඉඩමෙන් පර්චස් විසිපහක් (අක්කර 0, රූඩ් 0, පර්චස් 25) වපසරියෙන් යුක්ත වූ යටෝක්ත ඉඩමෙන් බෙදා වෙන් කළ ලොට් 1 ලෙස සලකුණු කර ඇති උතුරට: 2968 අංක දරන පිඹුරේ ලොට් අංක 1, නැගෙනහිරට: ගමේ සිට ප්‍රධාන පාරට ගමන් කරන අඩි 10ක් පළල පාර, දකුණට: ලෝට් 2, බස්නාහිරට: 1144 දරන පිඹුරේ ලොට් 2 බී යන මෙකී මායිම් තුළ වූ ඉඩම වේ. මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 409/168 පත්ඉරුවේ ලියාපදිංචි කර ඇත.

(ඇ) ඉහත කියන ලද අංක 4954 දරන පිඹුරේ විස්තර අනුව ඉහත සඳහන් කොබ්බෑකඩුව ග්‍රාමයේ පිහිටි ගෙටතලේවත්ත (ඔප්පුව අනුව ගේතලේ වත්ත) නම් වූ ඉඩමෙන් බෙදා වෙන් කළ ලොට් 1 ලෙස සලකුණු කළ විස්තර කර ඇති පර්චස් විසිතුනක (අක්කර 0, රූඩ් 0, පර්චස් 23) පවසරියෙන් යුත් උතුරට ලොට් 1,නැගෙනහිරට ගමේ සිට ප්‍රධාන පාරට යන අඩි 10ක් පළල පාර, දකුණට ලොට් 3, බස්නාහිරට 1954 දරන පිඹුර අනුව ලොට් 3 යන මෙකී මායිම් තුළ වූ ඉඩම වේ. මෙය මහනුවර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරු බී 409/169 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
ඊ. එම්. උපතිස්ස බණ්ඩාර,
ප්‍රධාන කළමනාකාරු.

ලංකා බැංකුව,
අධිශ්‍රේණි ශාඛාව,
මහනුවර.
05-393

ලංකා බැංකුව – මහියංගන ශාඛාව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥා පනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 22 වැනි වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2003.11.17 දිනැති අංක 1314 දරන *ගැසට් පත්‍රයේ* හා 2003.10.29 දිනැති දිනමිණ, නිනකරන්, ඩේලිනිව්ස් යන පුවත්පත්වල පළ කරන ලද යෝජනාවකට අනුකූලව එකී ආඥාපනතේ අංක 26 දරන වගන්තිය යටතේ අයකර ගතහැකි මුල් මුදලේ ශේෂයද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොළියද, ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපල හා පරිශ්‍රය පිහිටි ස්ථානයේදී ම 2006.06.23 වැනි දින පෙ. ව. 10.00 ට බදුල්ල, කලුගල්පිටිය අංක 48/1, හි පදිංචි වෙන්දේසිකාර ඩබ්. ජයතිලක මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

උපලේඛනය

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ මහියංගනය උප දිසාපති කොට්ඨාශයේ බින්තැන්න කෝරළයේ, අලුත් නුවර ග්‍රාමසේවා නිලධාරී කොට්ඨාශයේ අලුත්නුවර හි පිහිටි “දඹරාව ජනපදය” නමැති ඉඩමේ බලයලත් මහින්දෝරු ටී. බී. අත්තනායක විසින් සාදන ලද 1997 පෙබරවාරි මස 02 දිනැති අංක 6842 ඒ දරන පිඹුරේ ලොට් 2 වශයෙන් සඳහන් බෙදන ලද්දාවූ නිශ්චිත ඉඩම් කැබැල්ල උතුරට: අංක 554 දරන පිඹුරේ ලොට් 1 සහ මාවිත් සිල්වාගේ ඉඩමද, නැගෙනහිරට: රොහාන සිට දඹරාව දක්වා මහා මාර්ගය සහ අංක 615 දරන පිඹුරේ ලොට් 1 ද, දකුණට: ඇලට වෙන්කළ කොටස සහ පූජා නගරයට යන පාර සහ දඹරාව ද, බස්නාහිර:ට ඇලට වෙන්කළ ඩී 1 සහ ඇලට වෙන්කළ එප්සී 19 ද, මායිමව එකී අංක 6842 ඒ දරන පිඹුර අනුව රූඩ් කුනයි පර්චස් දහයක (රූ. 0, රූ. 3, පර්. 10) බිම් ප්‍රමාණය සමග එහි පිහිටි සියලු දේ වේ. මෙය බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එල්ඩීඕ 8/247 හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
ඩබ්. එම්. පී. විජේසූරිය,
කළමණාකරු.

ලංකා බැංකුව,
මහියංගනය ශාඛාව.
05-394

සීමාසහිත හැටන් නැෂනල් බැංකුව – වත්තල ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ණයඅය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ අංක 04 වන වගන්තිය යටතේ විකිණීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ හෝමාගම ප්‍රාදේශීය සභා සීමාව තුළ හෝමාගම පිහිටි කටුවාන පාරේ, පිහිටි “මිල්ලගහවත්ත” නමැති ඉඩමට මිනුම්පති විසින් සහතික කරන ලද අංක සී. ඕ. 6996 සහ 1990 මැයි 28 වැනි දිනත් දරන මූලික පිඹුර ප්‍රකාර (අංක සී. ඕ. 6706 දරන මූලික පිඹුරේ ලොට් අංක 3 සහ 13 හි කොටස් වන) ලොට් අංක 94 දරන කොටස (ප්‍රමාණය - හෙක්ටයාර් 0.1826).

ඉහත කී පිඹුරේ ලොට් 149, 53, 62 සහ 73 ලෙස ලකුණු කළ සහ අංක 818, සහ 819 සහ 1998 පෙබරවාරි මස 09 වැනි දින දරන බැඳුම්කරවල වැඩිදුරටත් විස්තර කර ඇති මාර්ග අයිතිය ද සමග වේ. මෙහි ඉහත විස්තර කොට ඇති ඉඩම් කොටසට බන්ධනදායිගේ ඇති කවරාකාරයේ හෝ බදු අයිතියක් බූදල් අයිතියක් අයිතිවාසිකමක් හිමිකමක් සම්බන්ධතාවයක් ප්‍රතිලාභයක් හිමිකම් පෑමක් සහ ඉල්ලීමක් සමග වේ.

පහත දැක්වෙන යන්ත්‍රෝපකරණ, නිශ්චල යන්ත්‍රාගාර සවිකිරීම් උපාංග සහ භෝමාගම, කටුවන යූ. ඩී. ඒ. කාර්මික ජනපදය තුළ පිහිටි අංක 94 දරන කර්මාන්තශාලා පරිශ්‍රය තුළ සහ ඒ මත තබා ඇති බන්ධනදායින්ගේ වෙළඳ භාණ්ඩ නොග සහ උපකරණ ද ඊට ඇතුළත්ය.

භාණ්ඩ විස්තරය	අනුක්‍රමික අංකය	මාදිලිය
1. පටු ප්ලූට් රෝල් සෙට් එකක් කවුන්ටර්ස් හිටර්ස්, ඉලෙක්ට්‍රිකල් සහ මිකැනිකල් ඩ්‍රයිව්ස් සහ මෝටරයෙන් ක්‍රියාකරන සෙල්ෆ් ලෝඩින් ටීල් ස්ටෑන්ඩ් සහිත අධිබලැති කුටිල ආකාරයෙන් අඩි වේගී, සින්ගල් පේස්, කඩදාසි රැලිකරන යන්ත්‍රය ප්‍රමාණය 56		එස්පී 203
2. මයික්‍රෝ සීටි අලවන යන්ත්‍රය	1213	එස්පී 105
3. මයික්‍රෝ බාර් හතරේ රොටරි කටින් ඇන්ඩ් ක්‍රීසින් මැෂිම	1215	ආර්එප් 1215
4. මයික්‍රෝ එසෙන්ට්‍රික් ස්ලෝවර්	1216	ඊඑක්ස් 306
5. මයික්‍රෝ ඇන්ගියුලර් බොක්ස් සිව්චින් මැෂිම	1219	එස් ඒ. 111
6. මයික්‍රෝ අධිබලැති අතින් ක්‍රියාකරන බෝඩ් කටරය	55	

තවද, මෙය බලාත්මකව පවතින අතරතුර, මින්මතු කලින් කලට, ගොඩනැගිල්ලට ස්ථිරව සවිකරනු ලැබ, ඉහත පළමුවන උපලේඛනයේ විස්තර කර ඇති නිශ්චල දේපලෙහි කොටසක් ලෙස සලකනු ලබන වෙනත් සියලු යන්ත්‍රෝපකරණ සහ දැනට ඇති මින්මතු සවිකරනු ලබන යම් යන්ත්‍රෝපකරණ වෙනුවට ස්ථිරව සවිකරනු ලබන සියලුම යන්ත්‍රෝපකරණ ද ඇතුළත් වේ.

සීමාසහිත හැටන් නැෂනල් බැංකුව මෙම දේපළ, උකස් කර ඇති “වර්ණ ඇසෝසියේට්ස් ” යන නාමය සහ විලාශය යටතේ හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යන නලින් සනත් කුමාර් වර්ණකුලසූරිය සහ උඩු විදානෙලාගේ දෝන සුධර්මා ප්‍රියන්ති පෙරේරා ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින්, සීමාසහිත හැටන් නැෂනල් බැංකුව විසින් මා වෙත පවරා ඇති බලය පරිදි ඉහත කී දේපල මා විසින් 2006 ජුනි මස 09 වැනි සිකුරාදා දින පෙරවරු 10.00 ට පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය පිලිබඳ නිවේදනය සම්බන්ධයෙන් 2004.12.10 වැනි දින *රජයේ ගැසට්* පත්‍රයද, 2004.12.10 වැනි දින අයිලන්ඩ්, දිවයින හා තිනකරන් යන පුවත්පත් ද බලන්න.

ගෙවීමේ ක්‍රමය.– එක් එක් වෙන්දේසියේදී මිල තීන්දු වනවාත් සමගම, සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් අගයයන් මුදලින් ගෙවිය යුතුය.

1. ගැණුම් මිලෙන් 10%ක් ;
2. ගැණුම් මිලෙන් ඉතිරි 90% වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතුය;
3. පලාත් අධිකාරියට ගෙවිය යුතු 1%ක් වන පළාත් අධිකාරි බද්ද;
4. විකුණුම් මිලෙන් 2.5ක් (සියයට දෙක හමාරක් පමණක්) වන වෙන්දේසිකරුගේ කොමිස් මුදල;
5. රූ. 30,000 නොඉක්මවන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැයෙන් 50%ක්;
6. ලිපිකරුගේ හා ඝෝෂකගේ ගාස්තුව රූ. 500;
7. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රූ. 2,000,

හිමිකම් ඔප්පු ප්ලැන් ආදිය පිළිබඳ වෙනත් විස්තර කොළඹ 10, ටී. බී. ජයා මාවත, අංක 479 හි සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ කළමනාකරු (අයකිරීම්) වෙතින් ලබාගෙන පරීක්ෂා කළ බලිය හැකිය.

දුරකථන අංක : 2661815, 2661816.

අර්වින් පෙරේරා,
සාම විනිසුරු, වෙන්දේසිකරු, උසාවි කොමසාරිස්,
තක්සේරුකරු, භාෂා පරිවර්තක.

අංක 3, පාගොඩ පාර,
නුගේගොඩ.
දුරකථන අංක :2810145, 077-212602.
05-386

සීමාසහිත සෙලාන් බැංකුව – ගෘන්ඩ්පාස් ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ණයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ අංක 08 වන වගන්තිය යටතේ විකිණීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාවන් තුළ බලයලත් මහින්දෝරු එම්. බලාක්‍රිෂ්ණන් විසින් පිළියෙල කළ 1990 පෙබරවාරි 16 දාතම අංක 431 දරන බහු පාර්ශ්වීය (කොඩෝමිනියම්) පිඹුරේ විස්තර කර ඇති පංචිකාවත්ත පාරේ වරිපනම් අංක 228 දරන බිම් මහලේ ඒකක 2 යනුවෙන් ලකුණු කර ඇති බෙදා වෙන්කර ඇති මායිම්, නියම වූ ඉතා අගනා ව්‍යාපාරික පරිශ්‍රය බිම් ප්‍රමාණයෙන් වර්ග අඩි 1,623.87කින් සමන්විතයි.

ආසන්නතම පොදු ප්‍රවේශ ප්‍රදේශය වශයෙන් ඒයූ 2 ප්‍රවේශය සහිත, එකී 2 වන ඒකකය උතුරට මෙම ඒකකය (පංචිකාවත්ත පාරේ) වරිපනම් අංක 234 හා 234 ඒ දරන පරිශ්‍රයන් ගෙන් වෙන් කෙරෙන බිත්තියේ මධ්‍යයද, සහ ඒයූ 2 (පඩිපෙල) ද, නැගෙනහිරට මෙම ඒකකය සී‍ඊ් 2 (ගෙවතු ඉඩකඩ) වෙන් කෙරෙන බිත්තියේ මධ්‍යයද, දකුණට මෙම ඒකකය සී‍ඊ් 1 ගෙවතු ඉඩකඩින් වෙන් කෙරෙන බිත්තියේ මධ්‍යය ද හා මෙම ඒකකය 1 වන ඒකකයෙන් වෙන් කෙරෙන බිත්තියේ මධ්‍යයද, බටහිරට පංචිකාවත්ත පාරේ පදික වේදිකාවෙන් මෙම ඒකකය වෙන් කෙරෙන බිත්තියේ මධ්‍යයද ඉහල මුදුනට මෙම ඒකකයට ඉහළින් පිහිටි 3 වන ඒකකයේ ගෙබිමේ මධ්‍යයද, සහ පහළ යටතට මෙම ඒකකයේ බිම් මහලද මායිම් වන, කොළඹ ඉඩම් කාර්යාලයේ ඒ 32/37 යටතේ ලියාපදිංචි කොට ඇති එකී සහාධිපත්‍ය පිඹුරේ සඳහන් ආකාරයට පොදු මූලඅගයන්ගෙන් 18.38% අනුපාතික ප්‍රමාණයක කොටස් හිමි ඒකකය.

පොදු මූල ද්‍රව්‍ය-

(අ) ගොඩනැගිල්ල පිහිටා ඇති ඉඩම,

(ආ) පිටු අංක 3 බිම් මහලේ දක්වා ඇති පරිදි සීරි 1 (කහ මායිම), සීරි 2 (නිල් මායිම) සහ සීරි 3 (කොළ මායිම) යනුවෙන් ලකුණුකර ඇති ඉතිරි කොටස (සීරි යනු උද්‍යාන කොටසයි),

(ඇ) ගොඩනැගිල්ලේ අත්තිවාරම් කුළුණු මහ බාල්ක, බාල්ක, මුක්කු, ප්‍රධාන බිත්ති හා වහලය,

(ඈ) පොළොවෙහි මළ පහවන සේවාවන්,

(ඉ) ඉඩම තුළ මතුපිට කාණු,

(ඊ) ගොඩනැගිල්ලේ නඩත්තුව හා ආරක්ෂාව සඳහා සපයා ඇති වෙනත් පහසුකම්

(උ) 1. ඒයූ 1-පිළිවෙලින් පළවෙනි සහ දෙවැනි මහල් හි ඒකක 3 හා ඒකක 4 හි සෝපාන ශාලාව
2. ඒයූ 2, බිම් මහලේ ඒකක 2 ට ඇති සෝපාන ශාලාව (ඒයූ) 1 සහ ඒයූ 2, බිම් මහල් සැලැස්මේ පළමු මහල් සැලැස්මේ හා දෙවන මහලේ සැලැස්මේ පිටු අංක 3, 4 සහ 5 හි දක්වා ඇති අතිරේක ඒකක සඳහා වෙන් කර ඇත).

(ඌ) 1. සීරි 1 සිට බිම් මහලේ ඒකක 1 දක්වා,
2. සීරි 2 සිට බිම් මහලේ ඒකක 2 ට පළමු මහලේ ඒකක 3 ට හා දෙවන මහලේ ඒකක 4 ට (සීරි) සී රි 2 සහ සීරි 3 (බිම් මහලේ සැලැස්මේ පිටු අංක 3 බිම් මහලේ සීරි 3 ප්‍රවේශ ඒකකය සිට ඒකක 1 සහ 2 දක්වා

3හි පොදු කොටස් සඳහා වෙන් කර ඇත).

සභාධිපත්‍ය (කොන්ඩෝමිනියම්) දේපළ හා කොන්ඩෝමිනියම් (සභාධිපත්‍ය) දේපළ ගොඩනැගිල්ලට සාදන ලද අංක 431) දරන සභාධිපත්‍ය (කොන්ඩෝමිනියම්) සැලැස්මේ පිටු අංක 3, 4 සහ 5 හි බිම් මහල් සැලැස්මේ, පළමු මහල් සැලැස්මේ, 2 වන මහල් සැලැස්මේ දක්වා ඇති අතිරේක ඒකක ඒ යූ 2 බිම් ප්‍රමාණයෙන් වර්ග අඩි 200 වන එම් ඒ යූ 2 ඒකකය (බිම් මහල, පළමු මහල සහ දෙවන මහල (සෝපාන ශාලාව) ට මායිම්, උතුරට පංචිකාවත්ත පාරේ) වරිපනම් අංක 234 සහ 234 ඒ පරිශ්‍රයන්ගෙන් මෙම ඒකකය වෙන් කරනු ලබන බිත්තියේ මධ්‍යය නැගෙනහිරට මෙම ඒකකය 2, 3 සහ 4 වන ඒකකවලින් වෙන් කරන බිත්තියේ මධ්‍යය සීරි 2 ඉහළියන් අවකාශය (උද්‍යාන අවකාශය) දකුණට මෙම ඒකකය 2, 3 සහ 4 වැනි ඒකකවලින් වෙන් කරන බිත්තියේ මධ්‍යය, බටහිරට මෙම ඒකකය 2, 3, සහ 4 වැනි ඒකක වලින් වෙන් කරන බිත්තියේ මධ්‍යය සිතිජය (උඩ අහස් මුදුන) මෙම ඒකකයේ වහළ අධිස්වසිතාකාශ (යට අහස් මුදුන) මෙම ඒකකය් බිම් මහල, මෙකී මායිම් අංක 431 දරන සැලැස්ම අනුව වේ.

තවද, ඉතා වටිනා වාණිජ ඉඩම් කොටසක්.–

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාව තුළ අළුත්කඩේ නැගෙනහිර (කලින් ස්කිනර්ස් පාර දකුණ යනුවෙන් හඳුන්වන ලද ශ්‍රී සංඝරාජ මාවතේ පිහිටි ශ්‍රී සංඝරාජ මාවතේ වරිපනම් අංක 215/1 දරන බලයලත් මිනින්දෝරු එස්. රාජේන්ද්‍ර විසින් සාදන ලද අංක 2967 හා 2964 1964 අගෝස්තු මස 22 වැනි දාතම දරන සැලැස්මේ ලොට් අංක 8 වශයෙන් දක්වා ඇති (ඉඩම් ප්‍රමාණයෙන් පර්චස් 3.25ක් වූ ඉතා අගනා වාණිජ ඉඩම් කොටස (කොළඹ 10, පංචිකාවත්ත පාරේ අංක 228 හි බන්දුල ට්‍රේඩින් එන්ටර්ප්‍රයිසස් යන ව්‍යවහාර ව්‍යාපාරික නාමය යටත් නාමය, විලාශය, හා අභිධානය යටතේ තනි අයිතිකරු වශයෙන්) ව්‍යාපාර පවත්වාගෙන යන ගල්හේනගේ අජිත් බන්දුලසේන යන අයට අයත් දේපළ අංක 1342 හා 1993.09.09 දාතම දරන අංක 1492 හා 1993.11.05 දාතම දරන අංක 3346 හා 1995.06.21 දාතම දරන අංක 1203 හා 1993.07.21 දාතම දරන අංක 3255 හා 1995.05.03 සහ 698 හා 17/11/95 දාතම දරන බැඳුම්කර යටතේ බන්ධනදායී/ උකස්කරු වශයෙන් ගෙවිය යුතු ගෙවීම් පැහැර හැර ඇත.)

සීමාසහිත සෙලාන් බැංකුව විසින් මා වෙත පවරන ලද බලතල ප්‍රකාර ඉහත සඳහන් දේපල 2006 ජුනි 17 වැනි සෙනසුරාදා පෙ. ව. 10.30 ට ආරම්භව පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2000.07.21 වැනි දින රජයේ ගැසට් පත්‍රය ද, 2000.07.12 දින ඩේලිනිවිස්, දිනමින පුවත්පත් ද 2000.07.26 දින තිනකරන් පුවත්පත් ද විකුණුම් නිවේදනය සඳහා 2006.05.26 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද බලන්න.

ගෙවන පිළිවෙල :

1. මිල තීන්දු වනවාත් සමගම ගැණුම් මිලෙන් 10%ක්,
2. ගැණුම් මිලෙන් ඉතිරි 90% වෙන්දේසි දින සිට රාජකාරි දින 30ක් ඇතුළත ගෙවිය යුතුය,
3. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% (සියයට එකක්) දේශීය විකුණුම් බද්ද,
4. විකුණුම් මිලෙන් 2 1/2%ක් (සියයට දෙකහමාරක්) වෙන්දේසිකරුගේ කොමිස් මුදල,
5. රු. 43,145 නොඉක්මන සම්පූර්ණ ප්‍රචාරක වියදමෙන් 50%ක්,
6. ලිපිකරුගේ හා ඡෝෂකගේ ගාස්තුව රු. 500,
7. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තුව රු. 4,000.

හිමිකම් ඔප්පු හා වෙනත් අදාළ ලිපලේඛන කොළඹ 03, ගාලු පාරේ, අංක 90 හි සෙලින්කෝ සෙලාන් ටවර්හි (Ceylinco Seylan Tawer) හි 12 මහලේ සීමාසහිත සෙලාන් බැංකුවේ සහකාර සමාන්‍යාධිකාරී (නීති දෙපාර්තමේන්තුව) වෙතින් පරීක්ෂා කර බැලීමටත් පුළුවන.

දුරකථන අංක : 074-701256/7, 074-701291, 2456258.

ඩන්ස්ටන් කෙලාට්,
උසාවි කොමසාරිස් සහ බ්‍රෝකර්,
විශේෂඥ වෙන්දේසිකරු, තක්සේරුකරු,
සහ දේපළ නියෝජිත.

අංක 381/1, ගාළුපාර,
කොළඹ 04.
දුරකථන අංක : 2591167,
දුරකථන/ෆැක්ස් අංක : 2584874, 2500838,
ක්ෂණික ඇමතුම් : 0772250422.
05-395

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2006 අංක 97

D/22/NY/357.

ශ්‍රී ලංකා නාවික හමුදාව

නිත්‍ය නාවික උප සේවයට මාරු කිරීම

පහත නම සඳහන් නිලධාරියා 2006 අප්‍රේල් මස 03 වැනි දින සිට ශ්‍රී ලංකා නාවික හමුදාවේ ස්ථිර බලකායේ සිට නිත්‍ය නාවික උප සේවයට මාරු කිරීම අභිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත :

කොමාන්ඩර් (මාලිමා) මල්නයිදෙලාගේ රංජිත් ප්‍රනාන්දු, ආර්එස්පී, ශ්‍රීලංනාහ එන්ආර්එක්ස් 0464.

අභිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 මාර්තු මස 15 වැනි දින,
කොළඹ දී ය.
05-406

2006 අංක 98

D/RF/824/NY/01/03.

ශ්‍රී ලංකා නාවික හමුදාව-ස්ථිර නාවික බලකාය

අභිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද නිලයේ ස්ථිර කිරීමක්

2005 දෙසැම්බර් මස 26 වැනි දින සිට ලුතිනන් කොමාන්ඩර් (ඉ) වශයෙන් :

ලුතිනන් (ඉ) (තාවකාලික ලුතිනන් කොමාන්ඩර් (ඉ)) මහේෂ් ධනංජය ගොහුණුවත්තගේ, ශ්‍රීලංනාහ, එන්ආර්ඊ 0855.

අභිගරු ජනාධිපතිතුමන්ගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 පෙබරවාරි මස 10 වැනි දින,
කොළඹ දී ය.
05-402

2006 අංක 99

D/RF/824/NY/01/05.

ශ්‍රී ලංකා නාවික හමුදාව-ස්ථිර නාවික බලකාය

අභිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද නිලයේ ස්ථිර කිරීමක්

2000 ජුනි මස 14 වැනි දින සිට ලුතිනන් කොමාන්ඩර් (මාලිමා) වශයෙන් :

ලුතිනන් (තාවකාලික ලුතිනන් කොමාන්ඩර් (මාලිමා)) රොහාන් නලීන් දේවේන්ද්‍ර, ශ්‍රීලංනාහ එන්ආර්එක්ස් 0422.

අභිගරු ජනාධිපතිතුමන්ගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 පෙබරවාරි මස 14 වැනි දින,
කොළඹ දී ය.
05-403

2006 අංක 100

D/RF/824/NY/01/05.

ශ්‍රී ලංකා නාවික හමුදාව-ස්ථිර නාවික බලකාය

අභිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද උසස් කිරීම්

2006 ජනවාරි මස 27 වැනි දින සිට නාවිකාලික ලුතිනන් කොමාන්ඩර් වශයෙන් :

ලුතිනන් දිසානායක මුදියන්සේලාගේ නලින්ද ප්‍රසාද් දිසානායක, ශ්‍රීලංනාහ, එන්ආර්එක්ස් 0879.

2006 ජනවාරි මස 30 වැනි දින සිට නාවිකාලික ලුතිනන් කොමාන්ඩර් (වී) වශයෙන්

ලුතිනන් (වී) මෂු සමීර ජයසේකර, ශ්‍රීලංනාහ, එන්ආර්එල් 0868.

2. ඉහත සඳහන් උසස් කිරීම් පරීක්ෂණාත්මක පදනමක් මත වන අතර, උසස් කරන ලද නිලය ඉසිලීමට නුසුදුසු බව පෙනී ගියහොත් නිලධාරීන්ගේ උසස් කිරීම් අවලංගු කොට නැවත පෙර දැරූ නිලයට පත් කරනු ලැබේ.

අභිගරු ජනාධිපතිතුමන්ගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 මාර්තු මස 08 වැනි දින,
කොළඹ දී ය.
05-404

2006 අංක 101

D/22/NY/371.

ශ්‍රී ලංකා නාවික හමුදාව-ස්ථිර නාවික බලකාය

අභිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක් හා නිත්‍ය නාවික උපසේවයට මාරු කිරීමක්

පහත නම සඳහන් නිලධාරියා 2006 මාර්තු මස 30 වැනි දින සිට ශ්‍රී ලංකා නාවික හමුදාවේ ස්ථිර බලකායෙන් විශ්‍රාම ගැනීම සහ එදින සිට නිත්‍ය නාවික උපසේවය වෙත මාරු කිරීම අභිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

ලුතිනන් (වාපා) දේවතාගේ ලලිත් අශෝක කුමාර ජයසේකර, ශ්‍රීලංනාහ එන්ආර්ඩබ්ලිව් 0978.

අභිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 පෙබරවාරි මස 14 වැනි දින,
කොළඹ දී ය.
05-405

ආණ්ඩුවේ නිවේදන

1974 අංක 19 දරන සමාගම් (විශේෂ විධිවිධාන) නීතිය

3(2) වගන්තිය යටතේ නිදහස් කිරීමේ විධානය

1974 අංක 19 දරන සමාගම් (විශේෂ විධිවිධාන) නීතියේ 3(2) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර වෙළඳ, වාණිජ, පාරිභෝගික කටයුතු හා අලෙවි සංවර්ධන අමාත්‍ය ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ වන මම මුදල් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව නිදහස් කිරීම සඳහා ඉල්ලා ඇති මෙහි උපලේඛනයේ සඳහන් සමාගමට එම නීතියේ 2 වැනි වගන්තියේ විධිවිධාන අදාල වීමෙන් නිදහස් කරමින් විධානයක් නිකුත් කරමි.

ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ,
වෙළඳ, වාණිජ, පාරිභෝගික කටයුතු, අලෙවි සංවර්ධන අමාත්‍ය
සහ පාර්ලිමේන්තු ආණ්ඩු පක්ෂ ප්‍රධාන සංවිධායක.

2006ක් වූ අප්‍රේල් මස 28 වැනි දින,
කොළඹ දීය.

උපලේඛනය

අයිසීඅයිසීඅයි බැංක් ලිමිටඩ්
05-335

වට්ටාපලයි කන්නකි අම්පාල් පොංකල් උත්සවය - 2006

ඉහත සඳහන් පොංකල් උත්සවය 2006 මැයි මස 29 වැනි දින පෙරවරු 6.00 පටන් 2006 ජුනි මස 12 වැනි දින පස්වරු 6.00ට අවසන් වන බව පොදු මහජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. මේ පිළිබඳව 1949 මැයි 27 වැනි දින අංක 9978 හා 1950 මැයි 26 වැනි දිනැති අංක 10105 දරන රෙගුලාසිවලට පොදු ජනතාවගේ අවධානය යොමු කරවනු ලැබේ.

03. ප්‍රසිද්ධියට පත්කරන ලද මෙම නිත්‍ය රෙගුලාසි මෙම උත්සවය පැවැත්වෙන කාල සීමාව තුල වලංගු වනවා ඇත.

ඉමෙල්ඩා සුකුමාර්,
මුලතිවි දිස්ත්‍රික්කයේ දිසාපති.

2006 මැයි මස 03 වැනි දින දී ය.
05-398

විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

මහජන බැංකුව - මහනුවර ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2005.10.26 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැවි මෙයින් නිවේදනය කරනු ලැබේ :

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් අජන්තා කුමාරිහාමි විජේරත්න මහත්මිය විසින් සහතික කරන ලද 2000.03.08 දිනැති අංක 2481 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම-

i. ප්‍රජිත කිත්සිරි ගමගේ
ii. පාලිත පද්මසිරි ගමගේ
iii. පියල් ප්‍රේමසිරි ගමගේ
iv. ලලිත් පියසිරි ගමගේ
v. ප්‍රේමාවතී කොඩිකාර

යන අය විසින් පැහැර හැර ඇති බැවින්ද, එකී උකස්කරය යටතේ දැනට (i) රුපියල් විසිපන්ලක්ෂ හැත්තෑදහස් නවසිය හතලිස් හයයි ශත හැට හයක (රු. 25,70,946.66) මුදලක්ද, (ii) රුපියල් දොලොස් ලක්ෂ අනූදාහක (රු. 12,90,000) ක මුදලක්ද, (iii) රුපියල් අනූ දෙදහස් තුන්සිය පනස් හතයි ශත අසූ දෙකක (රු. 92,357.82) මුදලක් ද මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් සහ (i) 2003.07.14 දින සිට වර්ෂයකට 22% බැගින් රුපියල් විසිපන්ලක්ෂ හැත්තෑදහස් නවසිය හතලිස් හයයි ශත හැට හයක (රු. 25,70,946.66) ක මුදලක් සඳහා ද (ii) 2003.07.14 දින සිට වර්ෂයකට 22%බැගින් රුපියල් දොලොස් ලක්ෂ අනූදාහ (රු. 12,90,000) ක මුදලක් සඳහා ද (iii) 2005.09.10 දින සිට වර්ෂයකට 26-5% බැගින් රුපියල් අනූ දෙදහස් තුන්සිය පනස් හතයි ශත අසූ දෙකක (රු. 92,357.82) මුදලක් සඳහා ද වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාල මහජන බැංකු පනතේ 29එල් (29L) වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී (i). රුපියල් විසිපන් ලක්ෂ හැත්තෑ දහස් නවසිය හතලිස් හයයි ශත හැටහයක (රු. 25,70,946.66) මුදල ද, (ii) රුපියල් දොලොස් ලක්ෂ අනූදහසක (රු. 12,90,000) මුදල ද, (iii) රුපියල් අනූ දෙදහස් තුන්සිය පනස් හතයි ශත අසුදෙකක (රු. 92,357.82) ක මුදල ද අයකර ගැනීම සඳහා මහනුවර බලයලත් වෙන්දේසිකාර ඡොක්මන් සහ සමරවික්‍රම විසින් එකී අංක 2481 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපල හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

උකස්කර ඇති දේපල පිළිබඳ විස්තරය

1. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, යටිනුවර ගහවට කෝරලයේ, මහනුවර නාගරික සීමාව තුල දොඩම්වල ගමේ පිහිටි නියඳගල හෙවන් පොල්වත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ආර්. වී. සමරසිංහ මහතා විසින් මැන සැකසූ පිඹුරේ ලොට් අංක 1 දරන පර්චස් දශම හයක් (අක්. 0, රූඩ් 0, පර්.06) විශාලත්වයට එකී පිඹුරේ ප්‍රකාර මායිම්, උතුරට : අංක 4434 දරන පිඹුරේ ලොට් අංක 03 දරන එකී ඉඩමේ ඉතිරි කොටස ද, නැගෙනහිරට : මාර්ග රක්ෂිතය ද, දකුණට : ඉහත කී අංක 691 දරන පිඹුරේ ලොට් 2 දරන කොටස ද, බස්නාහිරට : ඉහත කී අංක 691 දරන පිඹුරේ ලොට් 3 දරන කොටස ද යන මෙකී මායිම් තුල පිහිටි වැවිලි, ගොඩනැගිලි, ගසකොළ, පලතුරු ආදී සෑම සියලුදේන් වේ.

මෙම ඉඩම මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 121/298 හි ලියාපදිංචි කර ඇත.

2. ඉහත කී දොඩන්වල පිහිටි නියඳගල හෙවන්පොල්වත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ආර්. වී. සමරසිංහ මහතා විසින් මැන සැකසූ අංක 691 දරන පිඹුරේ ලොට් 2 දරන පර්චස් දාහතරයි දශම හතරක් (අක්කර.0, රූඩ්.0, පර්.14.4) විශාලත්වයට පිඹුරේ ප්‍රකාර මායිම්, උතුරට : ඉහත කී අංක 691 දරන පිඹුරේ ලොට් 1 දරන මාර්ග රක්ෂිතය ද, දකුණට : අංක 4434 දරන පිඹුරේ ලොට් 2ක ද, බස්නාහිරට : ලොට් 3 දරන කොටස ද, නැගෙනහිරට : බහිරවකන්ද පාර රක්ෂිතයද යන මෙකී මායිම් තුල පිහිටි වැවිලි, ගොඩනැගිලි, ගසකොළ, පලතුරු ආදී සෑම සියලුදේන් වේ.

මෙම ඉඩම මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 308/204 හි ලියාපදිංචි කර ඇත.

ඉහත කී ඉඩම පහත සඳහන් ඉඩමට බෙදා වෙන් කළ කොටසේ වේ.

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, යටිනුවර ගහවට කෝරළේ, මහනුවර නාගරික සීමාව තුල දොඩම්වල නොහොන් උඩමඩපොත පිහිටි නියඳගල හෙවන් පොල්වත්ත වරිපනම් අංක 25ඒ දරන කොටසේ බහිරවකන්දට යන පාරෙන් පළල අක්කර කුනකුත් පර්චස් තිස් දෙකක් (අක්. 3, රූඩ්.0, පර්.32) වපසරියැති ඉඩමට මායිම් උතුරට සහ නැගෙනහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස වෙන්වන ගම්සභා පාරවල් ද, දකුණට : සමනේරිස්ගේ ඉඩමද, ඩී. ජේ. පෙරේරාට සහ තවත් අයට අයිති කුඹුරු ද, බස්නාහිරට : ලුවිස් පෙරේරාට අයිති වැලිකන්දේ ඉඩම ද යන මෙකී මායිම් තුල ඉඩමෙන් උතුරු පැත්තේ දොඩම්වලට යන පාර සහ රත්නායකට වෙන් කළ කොටසක් අතරේ නොබෙදූ අක්කරයක (අක්. 1, රූ. 0, පර්. 0) විශාල බිම් වාසියේ පිහිටි කඩගෙය සහ වෙනත් ගොඩනැගිලි අත්හැර ඉතිරි බිමෙන් සහ ඊට අයිති සියලු දෙයිනුත් නොබෙදූ දෙකෙන් පංගුවෙන් නොබෙදූ පර්චස් පහලොවක් (අක්කර 0, රූඩ් 0 පර්චස් 15) වපසරියවේ.

මෙම ඉඩමේ මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 114/300හි ලියාපදිංචි කර ඇත.

3. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර නගර සභා සීමාව තුල බ්‍රවුන්රිග් වීදියේ (දැනට යටිනුවර වීදියේ) වරිපනම් අංක 68 දරන දෙමහල් ගෙය සහිත බිමට මහනුවර දිස්ත්‍රික් උසාවියේ නඩු අංක 47911 දරන නඩුවේ අවසාන තීන්දුවට අනුව එච්. ෂොක්මන් මිනින්දෝරු තැන විසින් 1937 .04.27 දින දරන අංක x දරන පිඹුරේ ප්‍රකාර පර්චස් දෙකකුත් දශම පහයි තුනක (අක්කර 0, රූඩ් 0, පර්. 2.53) වපසරියට මායිම් උතුරට : සූරියආරච්චිගේ දොන් සයිමන් සිල්වා අප්පුහාමිගේ ඉඩම ද, නැගෙනහිරට : යටිනුවර වීදිය ද, දකුණට සහ බස්නාහිරට : අබ්දුල් පුල්ලේ සින්නතම්බිගේ ඉඩමද යන මෙකී මායිම් තුල පිහිටි ඉඩම සහ එහි තුල පිහිටි වැව්ලි, ගොඩනැගිලි, ගසකොල, පලතුරු ආදී සෑම සියලුදේත් වේ.

මෙම ඉඩම මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 300/122 හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරි,
(මධ්‍යම කලාපය)

මහජන බැංකුව,
මධ්‍යම කලාප කාර්යාලය,
අංක 17, දළදා වීදිය,
මහනුවර.
05-389

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුණු යෝජනාව

ණය අංකය : 3/38823/එච්6/102.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2003.06.17 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. ඩී. මලගොඩ විසින් සහතික කරන ලද 2000.09.25 දිනැති අංක 1840 දරන උකස් බැදුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, පානදුර පදිංචි හේවා ෆොන්සේකාගේ සුදත් ෆොන්සේකා යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2003.04.09 වැනි දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් තිස් හයදහස් තිස් නවයයි ශත හැත්තෑ හය (රු. 36,039.76) මුදලක් ද, පූර්වෝක්ත බැදුම්කර අංක 1840 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් දාහතරයි ශත හැත්තෑ නවය (රු. 14.79) බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස් කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, පානදුර, ඩයස් ගොඩනැගිල්ලෙහි බලයලත් වෙන්දේසිකාර එච්. ගිල්ටන් පෙරේරා මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

උපලේඛනය

කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර උතුර තොටමුණේ, පයාගල බැද්දේ, බේරුවල ප්‍රාදේශීය සභා සීමාව තුළ (පයාගල හා මග්ගොන බැද්ද උප කාර්යාල සීමාවේ) දූවේගොඩ පිහිටි සුදුගහලන්ද නැමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එච්. ඒ. ඩී. ප්‍රේමරත්න විසින් මැන සකසන ලද 1999.02.25, 26, 27 සහ මාර්තු 05 දින සහ අංක 2526 දරන පිඹුරේ කැබලි අංක 4 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0. රූ. 0, පර්. 10.5ක් වූ බෙදා වෙන් කළ බිම් කොටස සහ ඊට අයිති සියදු දේත් සමඟ වේ.

තවද, එකී අංක 2526 දරන පිඹුරේ කැබලි අංක ආර් 1, ආර් 2, ආර් 3, ආර් 4, ආර් 5, ආර් 6, ආර් 7, ආර්. 8 සහ ආර් 9 මතින් ඇති මාර්ග අයිතිය ද සමඟ වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
වැඩබලන සාමාන්‍යාධිකාරී.

2005 මැයි මස 11 වැනි දින,
ගාලු පාරේ, අංක 269,
කොළඹ 03.
05-396/6

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුණු යෝජනාව

ණය අංකය : 11/72782/ඩී11/026.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2006.01.31 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. බිබිල ප්‍රසිද්ධ නොතාරිස් නන්ද මුහන්දිරම් විසින් සහතික කරන ලද 2001.09.28 දිනැති අංක 1872 දරන උකස් බැදුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, බිබිල පදිංචි අධිකාරී මුදියන්සේලාගේ ගුණසේකර යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2005.12.31 වැනි දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් පන්ලක්ෂ අසූහතරදහස් එකසීයයි ශත නවය (රු. 5,84,100.09) මුදලක් ද, පූර්වෝක්ත බැදුම්කර අංක 1872 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් එකසිය අනූතුනයි ශත අනූහය (රු. 193.96) බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස් කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, ගම්පහ, උසාවිය පාර, ස. ණ. ස. චතුරශ්‍රය, අංක 15හි බලයලත් වෙන්දේසිකාර ටී. එම්. එස්. පීරිස් මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

උපලේඛනය

මොණරාගල දිස්ත්‍රික්කයේ, බිබිල ප්‍රාදේශීය සභා සීමාවේ, වෙල්ලස්ස පිහිටි කැබැල්ලකැටිය පාර (වම) මොනා පාරේ, වරිපනම් අංක 07හි කැබෙල්ලකැටිය නැමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එම්. කේ. සී. ප්‍රේමචන්ද්‍ර විසින් 1980.05.11 වැනි දින මැන සාදන ලද අංක 187 දරන මිණුම් පිඹුර ප්‍රකාර කැබලි අංක 1 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 1, පර්. 3ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියදු දේත් සමඟ වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
වැඩබලන සාමාන්‍යාධිකාරී.

2005 මැයි මස 11 වැනි දින,
ගාලු පාරේ, අංක 269,
කොළඹ 03.
05-396/5

මහජන බැංකුව - කැලණිය ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටත් මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2006.01.19 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ :

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් එස්. පී. එල්. විජේසිරිවර්ධන විසින් සහතික කරන ලද 1998.12.14 දිනැති අංක 3661 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, වල්පොල කංකානමලාගේ අමිත් පෙරේරා, සේනාධීර ගංගානි යසරංසි තිලකවර්ධන සහ සේනාධීර සරස චන්දිම මිගාර තිලවර්ධන යන අය විසින් පැහැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් දසලක්ෂ විසිහත්දහසක (රු. 1,027,000) මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද, 2002.03.30 වැනි දින සිට වර්ෂයකට 18% බැගින් රුපියල් දසලක්ෂ විසිහත්දහසක (රු. 1,027,000) මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාල මහජන බැංකු පනතේ 29එල් වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු පොළී සහ ගාස්තු ද සමඟ අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් දසලක්ෂ විසිහත්දහස් (රු. 1,27,000)ක මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. එස්. රාමනායක විසින් එකී අංක 3661 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් අතරින් ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් එස්. පී. එල්. විජේසිරිවර්ධන විසින් සහතික කරන ලද 2002.09.24 දිනැති අංක 7367 හා 2003.03.03 දිනැති අංක 7833 දරන නිදහස් කිරීමේ ඔප්පුවෙන් නිදහස් කරන ලද කොටස් අත් හැරී පසු ඉතිරි කොටස් වන මෙහි පහත විස්තර කරන දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

දේපළ පිළිබඳ විස්තරය

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, නවගමුව පිහිටි කෝන්ගහවත්ත *නොහොත්* මුහන්දිරම්ගෙවත්ත, නැකතිගේවත්ත *නොහොත්* බුළුගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ටී. ඩී. ජේ. පෙරේරා විසින් 2002.11.16 වැනි දින මැන සාදන ලද අංක 5404 දරන පිඹුරේ ලොට් අංක Q දරන කොටසට මායිම්, උතුරට : පාර ද, නැගෙනහිරට : ලොට් P සහ R ද, දකුණට : පිඹුරු අංක 1203හි සඳහන් ලොට් 13 ද, බස්නාහිරට : පිඹුරු අංක 1203හි සඳහන් ලොට් 4 සහ පාර ද යන මායිම් තුළ පිහිටි පර්චස් පහළොව (අ. 0, රූ. 0, පර්. 15) ක් විශාල ඉඩම සහ එහි පිහිටි වැවිලි, ගොඩනැගිලි ආදී සියළු දේත් වේ.

2. ඉහත කී නවගමුව පිහිටි කෝන්ගහවත්ත නොහොත් මුහන්දිරම්වත්ත, නැකතිගෙවත්ත නොහොත් බුළුගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ටී. ඩී. ජේ. පෙරේරා විසින් 2002.11.16 වැනි දින මැන සාදන ලද අංක 5404 දරන පිඹුරේ ලොට් අංක "P" දරන කොටසට මායිම් ලොට් අංක 03 දරන කොටසට මායිම්, උතුරට : පාර ද, නැගෙනහිරට : පාර ද, දකුණට : ලොට් ආර් ද, බස්නාහිරට : ලොට් ක්‍යු යන මායිම් තුළ පිහිටි පර්චස් දහය (අ. 0, රූ. 0, පර්. 10) ක් විශාල ඉඩම සහ එහි පිහිටි වැවිලි, ගොඩනැගිලි ආදී සියළු දේත් වේ.

ඉහත විස්තර කරන ඉඩම් පහත විස්තර කරන ඉඩම්වලින් බෙදා වෙන් කරන ලද කොටස් වේ.

(අ) කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ ඉහත කී නවගමුව පිහිටි කෝන්ගහවත්ත නොහොත් මුහන්දිරම්වත්ත, නැකතිගෙවත්ත නොහොත් බුළුගහවත්ත (පිඹුරේ ප්‍රකාර ඇටඹගහවත්ත, කෝන්ගහවත්ත සහ නැතකිගෙවත්ත) නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. ඒ. විජේසිංහ විසින් 1997.10.13 වැනි දින මැන සාදන ලද අංක 1126 දරන පිඹුරේ ලොට් අංක 01 දරන කොටසට මායිම්, උතුරට : පිඹුරු අංක 1203හි සඳහන් ලොට් 5 ද, නැගෙනහිරට : පිඹුරු අංක 1203හි සඳහන් ලොට් 7 ද, දකුණට : ලොට් අංක 2 ද, බස්නාහිරට : පිඹුරු අංක 1203හි සඳහන් ලොට් 05 ද යන මායිම් තුළ පිහිටි පර්චස් විස්සයි දශම දෙකයි බින්දුව (අ. 0, රූ. 0, පර්. 20.20)ක් විශාල ඉඩම සහ එහි පිහිටි වැවිලි, ගොඩනැගිලි ආදී සියළු දේත් වේ.

මෙම ඉඩම කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ජී 1067/248හි ලියාපදිංචි කර ඇත.

(ආ) කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ ඉහත කී නවගමුව පිහිටි කෝන්ගහවත්ත නොහොත් මුහන්දිරම්වත්ත, නැකතිගෙවත්ත නොහොත් බුළුගහවත්ත (පිඹුරේ ප්‍රකාර ඇටඹගහවත්ත, කෝන්ගහවත්ත සහ නැකතිගෙවත්ත) නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. ඒ. විජේසිංහ විසින් 1997.10.13 වැනි දින මැන සාදන ලද අංක 1126 දරන පිඹුරේ ලොට් අංක 02 දරන කොටසට මායිම්, උතුරට : ලොට් අංක 1 ද, නැගෙනහිරට : පිඹුරු අංක 1203හි සඳහන් ලොට් 7 ද, දකුණට : පිඹුරු අංක 1203හි සඳහන් ලොට් 13 ද, බස්නාහිරට : පිඹුරු අංක 1203හි සඳහන් ලොට් 4 සහ 5 ද, යන මායිම් තුළ පිහිටි පර්චස් දහහත (අ. 0, රූ. 0, පර්. 17) විශාල ඉඩම සහ එහි පිහිටි වැවිලි, ගොඩනැගිලි ආදී සියළු දේත් වේ.

මෙම ඉඩම කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ජී 1067/249හි ලියාපදිංචි කර ඇත.

3. ඉහත කී නවගමුව පිහිටි කෝන්ගහවත්ත *නොහොත්* මුහන්දිරම්ගේවත්ත, නැකතිගෙවත්ත *නොහොත්* බුළුගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ටී. ඩී. ජේ. පෙරේරා විසින් 2005.01.05 වැනි දින මැන සාදන ලද අංක 5666 දරන පිඹුරේ ප්‍රකාර මායිම්, උතුරට : පාර ද, නැගෙනහිරට : පිඹුරු අංක 1203හි සඳහන් ලොට් 9 සහ ලොට් අංක 3හි කොටසක් ද, දකුණට : පිඹුරු අංක 1203හි සඳහන් ලොට් 9 සහ ලොට් 11 ද, බස්නාහිරට : පාරද යන මායිම් තුළ පිහිටි රූඩ් එකයි පර්චස් තුන (අ. 0, රූ.1, පර්. 3) ක් විශාල ඉඩම සහ එහි පිහිටි වැවිලි, ගොඩනැගිලි ආදී සියළු දේත් වේ.

ඉහත විස්තර කරන ඉඩම පහත විස්තර කරන ඉඩමෙන් බෙදා වෙන් කළ කොටසකි.

(ඇ) ඉහත කී කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ නවගමුව පිහිටි කෝන්ගහවත්ත නොහොත් මුහන්දිරම්වත්ත, නැකතිගෙවත්ත නොහොත් බුළුගහවත්ත (පිඹුරේ ප්‍රකාර ඇටඹගහවත්ත, කෝන්ගහවත්ත සහ නැකතිගෙවත්ත) නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. ඒ. විජේසිංහ විසින් 1997.10.13 වැනි දින මැන සාදන ලද අංක 1126 දරන පිඹුරේ ලොට් අංක 3 දරන කොටසට මායිම්, උතුරට : පිඹුරු අංක 1203හි සඳහන් ලොට් අංක 7 ද, නැගෙනහිරට : කැකිරිවල පාර ද, දකුණට : ලොට් 10, 9, 11 ද, බස්නාහිරට : පිඹුරු අංක 1203හි සඳහන් ලොට් 7 ද යන මායිම් තුළ පිහිටි රූඩ් එකයි පර්චස් විසිතුනයි දශම අටයි බින්දුව (අ. 0, රූ. 1, පර්. 23.80) ක් විශාල ඉඩම සහ එහි පිහිටි වැවිලි, ගොඩනැගිලි ආදී සියළු දේත් වේ.

මෙම ඉඩම කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ජී. 1067/250හි ලියාපදිංචි කර ඇත.

ඉහත කී ඉඩම්වලට බලයලත් මිනින්දෝරු එම්. ඒ. ජයරත්න විසින් 1994.10.12 සහ 1996.03.11 දින සාදන ලද අංක 1203 දරන පිඹුරේ සඳහන් ලොට් අංක 7හි මාර්ග අයිතියද සමඟ වේ.

මෙම ඉඩම කොළඹ ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ජී 1067/160හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු,
ගම්පහ.

මහජන බැංකුව,
බටහිර 111 කලාප කාර්යාලය,
අංක 131, නුවර පාර,
බැලුම්මහර,
මුදුන්ගොඩ.
05-387

මහජන බැංකුව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 "ඩී" වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29"ඩී"වගන්තිය යටත් මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2001.01.25 දින පැවැති රැස්වීමේදී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

මහජන බැංකුව සඳහා මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් හා නීති උපදේශක ඒ. කේ. විජේරත්න විසින් සහතිකර කරන ලද අංක 2000 හා 1999.08.24 දින දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, අලවතුගොඩ මාතලේ පාරේ, අංක 1136හි මොහොමඩ් අවුස් අබ්දුල් කරීම් විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී අංක 1136 දරන උකස්කරය යටතේ දැනට රුපියල් විසිතුන් ලක්ෂ දහසයදහසක (රු. 2,316,000) මුදලක් මහජන බැංකුවට ලැබිය යුතු හා අයවියයුතු බැවින් ද, 2000.11.15 දින සිට වෙන්දේසි දිනය තෙක් වර්ෂයකට 24% බැගින් රුපියල් විසිතුන් ලක්ෂ දාසය දහසක (රු. 2,316,000) මුදලක් සඳහා හා තවදුරටත් පොළිය හා වෙන්දේසි ගාස්තු ද සමඟ අනතුරුව කිසියම් ගෙවීම් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් විසිතුන් ලක්ෂ දාසය දහසක (රු. 2,316,000) මුදල ආපසු අයකර ගැනීම සඳහා මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන ෂොක්මන් හා සමරවික්‍රම සමාගම විසින් ඉහත කී අංක 2000 දරන උකස්කරයන් පූර්වෝක්ත බැංකුවට උකස් කොට ඇති දේපල හා භූමිය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29"ඩී" වගන්තිය යටතේ මහජන බැංකුව විසින් පවරා ඇති බලතල ප්‍රකාර මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

දේපල පිළිබඳ විස්තරය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුවේ, උඩගම්පහ කෝරළේ, අලවතුගොඩ පිහිටි "සයිස්ටන් එස්ටේට්" යයි කියනු ලබන හා හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. පානබොක්කේ විසින් සාදන ලද අංක 2274 හා 1975.08.03 වැනි දින දරන පිඹුරේ අංක 2 දරන බිම් කැබැල්ල වශයෙන් සලකුණු කොට ඇති බෙදා වෙන් කළ බිම් කොටසට මායිම්, උතුරට : ඇල ද, නැගෙනහිරට : අංක 3 දරන බිම් කැබැල්ල ද, දකුණට : ප්‍ර. වැ. දෙ. පාර ද, බටහිරට : අංක 01 දරන බිම් කැබැල්ල ද, යන මෙකී මායිම් තුළ රූඩ් තුනයි පර්චස් දෙකයි දශම අටක (අ. 0, රූ. 3, පර්. 2.8) විශාලත්වයෙන් යුතුව එහි පිහිටි ගොඩනැගිල්ල, වැව්ලි හා සෑම සියලු දේත් සහිත වේ. මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එච් 656/03හි ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු,
(මහනුවර).

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 17, දළදා වීදිය,
මහනුවර.
05-390

මහජන බැංකුව-මහනුවර ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29'ඩී' වගන්තිය යටත් මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2005.10.26 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ :

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් අජන්තා කුමාරිහාමි විජේරත්න මහත්මිය විසින් සහතික කරන ලද 2004.02.19 දිනැති අංක 4105 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, අතුල කුමාර බණ්ඩාර දොඩන්වල සහ නයනලතා මල්කාන්ති අබේසිරිවර්ධන සෙනරත් යාපා යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට

1. රුපියල් හත්ලක්ෂය (රු. 7,00,000) ක මුදලක් සහ 2. රුපියල් හයලක්ෂ දහඅට දහස් දෙසීය විසි හයයි ශත තිහ (රු. 6,18,226.30) ක මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 1. 2004.03.01 දින සිට වර්ෂයකට 19.25% බැගින් රුපියල් හත්ලක්ෂය (රු. 7,00,000)ක මුදලක් සහ 2. 2005.06.09 දින සිට වර්ෂයකට 18.25% බැගින් රුපියල් හයලක්ෂ දහඅට දහස් දෙසීය විසි හයයි ශත තිහ (රු. 6,18,226.30) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාල මහජන බැංකු පනතේ "29එල්" (29L) වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමඟ අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී 1. රුපියල් හත්ලක්ෂය (රු. 7,00,000)ක මුදල සහ 2. රුපියල් හයලක්ෂ දහඅට දහස් දෙසීය විසි හයයි ශත තිහ (රු. 6,18,226.30)ක මුදලක් අයකර ගැනීම සඳහා මහනුවර බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම විසින් එකී අංක 4105 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

දේපළ පිළිබඳ විස්තරය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, යටිනුවර ගහවට කෝරළේ *හෙවත් දැනට* මහනුවර මහ නගර සභා සීමාව තුළ කටුකැලේ දැනට බහිරවකන්ද පාරේ පිහිටි ටවුන්විව් දැනට ශාන්ත ජෝසප්හිල් කියන ඉඩමට වර්ෂ 1962ක් වූ නොවැම්බර් මස 10 වැනි දින කේ. ජී. හේරත් මිනින්දෝරු මහතා විසින් මැන සාදන ලද අංක 1270 දරන ප්ලෑනේ ප්‍රකාර බෙදූ අංක 3ඒ දරන කට්ටිය වන පර්චස් විසි හතරයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 24.5) ක් විශාලකම ඇති, උතුරට : අංක 02 දරන කට්ටිය ද, නැගෙනහිරට : නගර සභා ඉඩම ද, දකුණට : අංක 3බී දරන කට්ටිය ද, බස්නාහිරට : බහිරවකන්ද පාර ද යන මායිම් තුළ පිහිටි ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි, ගසකොළ, පළතුරු ආදී සෑම සියලු දේද වේ.

මෙම ඉඩම මහනුවර ඉඩම් ලියාපදිංචි කිරිමේ කාර්යාලයේ අංක ඒ 128/259හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරී,
(මධ්‍යම කලාපය).

මහජන බැංකුව,
මධ්‍යම කලාප කාර්යාලය,
අංක 17, දළදා වීදිය,
මහනුවර.
05-388

ජාතික ඉතිරිකිරීමේ බැංකුව

ණය අංකය : 17555/15

අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2005.09.05 දින පවත්වන ලද රැස්වීමේදී, මෙහි පහත දැක්වෙන යෝජනාව, විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලද බව, 1995 අංක 24 දරන පනතින් සංශෝධිත, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

'ජාතික ඉතිරිකිරීමේ බැංකුව නමට, ප්‍රසිද්ධ නොතාරිස් යැස්මින් එෆ් ඩීන් විසින් ලියා සහතික කරන ලද අංක 2067 හා 1998.01.16 දින දරන උකස් බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම, උකස්කරුවන් වන, (කලින් පානදුර, වෑකඩ, කවි රාජ මාවත, 1 වන පටුමග, අංක 2/ 19 දරන ස්ථානයේ පදිංචිව සිටි) දැනට වැලිගම, කොක්මාදුව, පොල්වත්තගේ - වත්ත, ඩී. ජී. හේමපාල බාරේ, යන ලිපිනයෙහි පදිංචි, ගහබොඩ හෙට්ටිආරච්චිගේ ක්‍රිසාන්ත සුජීව යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, දැනට එකී උකස් බැඳුම්කරය මත 2005.09.18 වැනි දිනට රුපියල් දෙලක්ෂ අසූනව දහස් දෙසිය විසිහතක (රු. 289,227) මුදලක් ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් දෙලක්ෂ අසූනවදහස් දෙසිය විසිහතක් (රු. 289,227) වූ මුදල සහ 2005.09.18 වැනි සිට දේපළ විකිණීමේ දිනය දක්වා වර්ෂයකට සියයට පහළොව (15%) බැගින් වූ පොලියද, සංශෝධිත පරිදි වූ 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තියට අනුකූලව අයකරගත හැකි මුදල් ප්‍රමාණයන් ද ප්‍රචාරක වියදම් හා දරන ලද වෙනත් ගාස්තු ද (ඉන්පසුව යම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒ මුදල අඩුකොට) අයකර ගැනීම සඳහා, ඉහත කී අංක 2067 දරන බැඳුම්කරය මගින් ජාතික ඉතිරිකිරීමේ බැංකුව වෙත උකස් කර ඇති, මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කරල දේපළ හා පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1995 අංක 24 දරන පනත මගින් සංශෝධිත පරිදි වූ 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල යටතේ, ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.'

ඉහත සඳහන් උපලේඛනය

බස්නාහිර පළාතේ, කලුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණේ, පානදුර තල්පිටි දෙබැද්දේ, පානදුර ප්‍රාදේශීය සභා තන්තිරිමුල්ල උප කාර්යාල බල ප්‍රදේශය ඇතුළත, ගල්තුඩේ සහ හිරණ යන ගම්වල පිහිටි රත්නගිරිය එස්ටේට් නමැති ඉඩමේ, බලයලත් මිනින්දෝරු බී. එල්. ඩී. ප්‍රනාන්දු විසින් මැන සාදන ලද අංක 3518හා 1991 අගෝස්තු 08 වෙනි දින දරන පිඹුරේ දැක්වෙන ලොට් එච් ලෙස ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටියට මායිම්, උතුරට : ලොට් ජී දරන කට්ටියද නැගෙනහිරට : අංක 3448 දරන පිඹුරේ දැක්වෙන ලොට් අංක 4 ද දකුණට : අංක 448 දරන පිඹුරේ දැක්වෙන (පාරක් සඳහා වෙන් කළ) ලොට් බී දරන කට්ටියද බස්නාහිරට : ලොට් අංක 1 යන මායිම් ඇතුළත, ඉහත කී අංක 3518 දරන පිඹුර ප්‍රකාර පර්චස් දහහතරක් (0අ. 0 රූ. 14ප.) විශාලත්වය ඇති බිම් කට්ටිය සහ එහි පිහිටි ගොඩනැගිලි, ගසකොළ, වැව්ලි සහ වෙනත් සියෙලු දේ. මෙම ඉඩම පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එෆ් 125/287 යටතේ ලියාපදිංචි වී ඇත.

මෙයට, ඉහත කී අංක 3518 පිඹුරේ ලොට් අංක 1 සහ බලයලත් මිනින්දෝරු සී. ඩබ්ලිව්. ද නීස් විසින් මැන සාදන ලද අංක 448 හා 1961 දෙසැම්බර් 27 සිට 29 දක්වා දින දරන පිඹුරේ ලොට් 'ඒ' 'බී' යන, පාරවල් සඳහා වෙන් කළ බිම් කට්ටි මතින් සහ ඔස්සේ මාර්ග අයිතියද ඇතුළත් වේ.

කළමනාකරු - (ණය)

255, ගාලු පාර,
කොළඹ 3.
05-368

මුද්‍රණය හා බෙදාහැරීම සීමාසහිත ශ්‍රී ලංකා එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසිනි.
www.documents.gov.lk